# 2015.03.03 වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පැවති මාසික සභා රැස්වීම් වාර්තාව

සහභාගීත්වය (-

| | |
|---|---|
| ☞ ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා | ගරු සභාපති |
| ☞ කමල් වැල්ලගේ මහතා | ගරු උප සභාපති |
| ☞ ඒ.පී.ලක්ෂ්මි හේමන්තා සිල්වා මෙනවිය | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ එච්.එල්. අනුර කිත්සිරි මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ ජී.සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ ග්‍රේෂන් කෙරමිණියගේ මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ ඒ. ඩබ්. ජගත් කුමාර මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ ජේ.ඩබ්.හාෂිණි මෙනුකා විජේසූරිය මහත්මිය | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ ජේ.ඩබ්.ජයන්ත මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ ආර්.පී.දේව් රොහාන් ද සිල්වා මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ බී.ජනිත් වික්‍රමතිලක මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ කේ.පුෂ්පික ඉන්ද්‍රජිත් මහතා | ගරු නගර සභා මන්ත්‍රී |

☸ පන්සිල් සමාදන් වීමෙන් අනතුරුව පෙ.ව. 09.40 ට රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී ☸

## (01) 2015.02.10 දින පවත්වන ලද සාමාන්‍ය මාසික සභා රැස්වීම් වාර්තාව ස්ථිර කිරීම

**01:01** 2015 .02.10 වන දින පවත්වන ලද සාමාන්‍ය මාසික සභා රැස්වීම් වාර්තාව කියවූවා සේ සලකා පිළිගත යුතු බවට ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී එච්.එල්.අනුර කිත්සිරි මහතා විසින් ස්ථිර කරන ලදී.

✠ **ඒ අනුව 2015 – 02-10 දින පවත්වන ලද සාමාන්‍ය මාසික සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව ගරු සභාවේ ස්ථිර විය.**

**(02)** **සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන** නැත

**(03)** **ලැබී ඇති පැමිණිලි පෙත්සම් හා ලිපි සභාවට ඉදිරිපත් කිරීම**

**3:1** **'** නගර සභා සීමාවට ඇතුළත් කර ගැනීම සඳහා**'** මැයෙන් අම්බලන්ගොඩ ,ගොඩහේන,පල්ලේතොට,රතුකුරුස නිවාස,එකමුතු ප්‍රජා මූල්‍ය සමිතිය විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

ඉහත නම සඳහන් නිවාස සංකීර්ණය සුනාමි ව්‍යසනයට පෙර තල්ගස්ගොඩ ග්‍රාම සේවා යටතේ අම්බලන්ගොඩ නගර සභාව යටතේ පාලනය වූ බවත් ,සුනාමි ව්‍යසනයට පසුව මෙම නිවාස සංකීර්ණය ගොඩහේන ග්‍රාම සේවා වසමට අයත්ව අම්බලන්ගොඩ ප්‍රාදේශීය සබාව මඟින් පාලනය වන බවත් ,නැවතත් මෙම නිවාස සංකීර්ණය අම්බලන්ගොඩ නගර සභා සීමාවට ඇතුලත් කර ගැනීමට කටයුතු කරන මෙන් ඉල්ලා තිබුණි.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

මීට පෙරත් මේ කරුණ සාකච්ඡා වුණා.නමුත් ක්‍රියාත්මක වුණේ නෑ.අද නැවත ඒ නිවාස 56 ක පිරිස අත්සන් කරලා ලිපියක් යොමු කරලා තියෙනවා.මං හිතන්නේ සාධාරණ ඉල්ලීමක්.

- **ගරු නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්.හාෂිණි මෙනුකා විජේසූරිය මහත්මිය පෙ.ව.9.46 ට පමණ ගරු සභාවට පැමිණෙන ලදී.**

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

පල්ලේතොට ඇළ මධ්‍ය කියන්නේ මොකක්ද?

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

මම මීට කලින්නුත් මේ සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගිහින් ඒ හරහා ගාලු ගිහිල්ලා මේ සිතියම ගෙනත් දුන්නා මේ සභාවට.ඒකට හේතුව මම පදිංචි නිවස ඉදිරිපිට තියෙන ඉඩමක් අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව හරහා සංවර්ධනය කරලා විකුණන්න යන අවස්ථාවේ අපි බොහෝම අමාරුවෙන් කටයුතු කරලා විදුලිය , ජලය ලබා ගැනීම නතර කරලා මේ සම්බන්ධයෙන් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් හරහා පරීක්ෂණයක් කරලා පිළිගන්න සිද්ධ වුණා මේ ඉඩම අම්බලන්ගොඩ නගර සභාවට අයිති කියලා.ඒකේ අපේ සීමාව ලකුණු කරලා තියෙන්නේ සභාපතිතුමණි,හල් වතුර ඇළෙන් ගිහිල්ලා නැවත වරක් ඇළ සීමාවකින් තමයි නගර සීමාවට වෙන් කරලා තියෙන්නේ.නමුත් දැන් ඒ ඇළ සීමාවට මෙහායින් තමයි මේ රතු කුරුස නිවාස තියෙන්නේ.මම ඒ දිනවල විෂය කළ සම්පත් මහත්තයට කීවා මේ සිතියම ගෙන්න ගන්න කියලා.අද මට ගේන්න අමතක වුණා.ඔය සිතියමේ තියෙනවද නගර සභා සීමාව ලකුණ කරලා සභාපතිතුමා.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේකේ ප්‍රාදේශීය සභා පරිපාලන මායිම් තියෙනවා.ඒකේ උතුරු මායිම තියෙන්නේ හල්වතුර ඇළට වැටෙන පල්ලෙතොට ඇළ ලක්ෂයේ සිට ගහ දිගේ ගොස් ගොඩහේන තල්ගස්ගොඩ ප්‍රධාන මාර්ග හරහා ඇති බෝක්කුව ඔස්සේ ගොස් කියලා.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

අපේ තාක්ෂණ සේවා නිළධාරී මලිත් මහත්තයත් ,ගයත්‍රී මිසුත් ගියා මේ පරීක්ෂණයට.ප්‍රාදේශීය සභාවේ නිළධාරීන් ආවා.ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිළධාරීන් ආවා.මං පෙන්නුවා මායිම්.එයාලා ඒක පිලිගත්තා.අම්බලන්ගොඩ නගර සභාවෙන් තමයි මේක පාලනය වුනේ.ග්‍රාමසේවක වරු 2 ක් තමයි මේක කරලා තියෙන්නේ සභාපතිතුමා.මේ සම්පූර්ණම වැරදි දෙයක්.නගර සභා සීමාවට තියෙන භූමි ප්‍රදේශයක් මේ නිළධාරීන් දෙන්නා ප්‍රාදේශීය සභා සීමාවට දැම්මා.අම්බලන්ගොඩ නගරයේ හිටපු මිනිස්සු සුනාමී ව්‍යසනයෙන් පස්සෙ මෙතනට ගෙනහින් දැම්මේ.දැන් ඒ මිනිස්සුන්ට අම්බලන්ගොඩ නගර සභාවත් නෑ ප්‍රාදේශීය සභාවත් නැති තත්වයක් උදා වෙලා තියෙන්නේ.ප්‍රාදේශීය සභාවෙන් කොහෙත්ම සංවර්ධන කටයුත්තක් කෙරෙන්නෑ.අපට අයිති නැති නිසා අපට කරන්නත් බෑ.පළාත් පාලන නීතිය අනුව වෙනත් ආයතනයකට අයිති දේපලක් අපට සංවර්ධණය කරන්න බෑ.ඉතාමත් කණගාටුදායකයි සභාපතිතුමණි,තල්ගස්ගොඩ පල්ලේතොට රතු කුරුස නිවාස සංකීර්යේ පාරවල් වල යන්න බැරි තත්වයක් උදාවෙලා තියෙන්නේ දැන්.ඒ මිනිසුන්ට යම් කිසි සහනයක් උදාකරලා දෙන්න ඕන.නමුත් අපට කරන්න බෑ ඒක,මේ ප්‍රදේශය අපට අයිති නැති නිසා.එනිසා මම කියන්නේ ඔබතුමා මැදිහත් වෙලා ඒ මිනිසුන්ට සාධාරණයක් ඉටු කරන්න ඉක්මණින් යම් ක්‍රියාමාර්ගයක් ගන්න කියලා ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී බී.ජනිත් වික්‍රමතිලක මහතා කතා කරමින්</u>

අම්බලන්ගොඩ නගර සභා සීමාව යටතේ දැන් පාලනය වුණත් මේ නිවාස වල ඉන්නේ සුනාමී ව්‍යසනයට හසු වෙලා මේ අම්බලන්ගොඩ ප්‍රදේශයෙන් ගිය ජනතාව.උප සභාපතිතුමා කියන ආකාරයට එතුමා පදිංචි ස්ථානයට යාබඳ ඉදිරිපස තමයි මේ මාර්ගය තියෙන්නේ.ඒ වෙල් යායේ ඇළ මාර්ගයට මෙහායින් එනකොට අයිති වෙනවා අම්බලන්ගොඩ නගර සභා සීමාවට.ඡන්ද කොට්ඨාශ නිර්නය කිරීමේදී .සෑම මැතිවරණයකම අපි ඔය ගෙවල් වලට ගියත් ඔය මුල්ලේ තියෙන ගේ තමයි අවසාන ගේ විදියට නම් කරලා තියෙන්නේ.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ඉස්සරහ ඉඩම සභාපතිතුමා, බලා ගත්ත කෙනාට අයිති වුණේ.ඒ නිසා තමයි ඒ පර්චස් 40 දුන්නේ.ඒ පුද්ගලයා ඒ පර්චස් 40 වික්කා.ඒ ගෙවල් 02 ක් මෙතුමා කියනවා වගේ අම්බලන්ගොඩ නගර සභාවට අයිති.එකම ඉඩමේ ගෙවල් 02 ක් අම්බලන්ගොඩ නගර සභාවට අයිතී.අනෙක් කොටස ප්‍රාදේශීය සභාවට අයිති.

<u>ගරු නගර සභා මන්ත්‍රී බී.ජනිත් වික්‍රමතිලක මහතා කතා කරමින්</u>

මමත් දන්න නිසා කියන්නේ.ඒ ගෙවල් 02 ක අම්බලන්ගොඩ නගර සභාවට අයිති නම් අනෙක් ගෙවල් ටිකත් අම්බලන්ගොඩ නගර සභාවට අයිති වෙන්න ඕන.ග්‍රාමසේවක මහත්වරු තමයි ඕක එහාට මෙහාට කරලා තියෙන්නේ මං හිතන විදියට.මේක ඒ නිවැසියන්ට කරපු ලොකු අසාධාරණයක්.මොකද ප්‍රාදේශීය සභාවෙන් පොඩ්ඩකටවත් සොයලා බලන්නෑ.නගර සභාවට හොයන්න බලන්න අයිතියක් නෑ.මං හිතන්නේ මේ සීමාව නගර සභාවට ඇදාගැනීම වැදගත් වෙනවා.මේ කාරණා සම්බන්ධයෙන් ගත්තහම සීමා නිර්ණය කොමිසමේ අවසන් නෑ සියලු කටයුතු. මේ ප්‍රශ්නය යොමු කරානම් හොදයි කියන එකයි මගේ අදහස.මේ වගේම ප්‍රශ්නයක් කෙරමිණිය ප්‍රදේශයෙත් තියෙනවා.වතුගෙදර සීමාවේ කොටසක් අපි ඉල්ලුවා ,මේ සභාවට ලිඛිතව මම ඉල්ලීමක් කළා පිං ළිඳ ඉස්සරහා තියෙන ගෙවල් සෙට් එකත් මේ හා සමානවම විය යුතු දෙයක්.ඔබතුමා හොදට දන්න දෙයක් මේක.එනිසා මම කියන්නේ මේ කාරණා 02 කම සැලකිල්ලට අරගෙන නගර සභාව විදියට මේ ප්‍රදේශ 02 ම නගර සභා සීමාවට ඇතුලත් කර ගැනීමට කටයුතු කරමු කියලා ඉල්ලනවා.ඒ සඳහා අපි උපරිම සහයෝගය ලබා දෙනවා.ඔබතුමත් මේ සම්බන්ධයෙන් උනන්දුවෙලා කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>
මං හිතන්නේ අපි මේක යෝජනාවක් විදියට ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට යවමු.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්.ජයන්ත මහතා කතා කරමින්</u>

සභාපතිතුමණි,ඔය ඉඩම තිබුණේ මහ අම්බලන්ගොඩ අපේ ගුණරත්න මහත්තයට.අපේ වරිපනම් ලේඛණයෙන් බැලුවනම් සොයාගන්න පුලුවන් මේක.ගුණරත්න මහත්තයා මේක රෙට් හවුස් එකට විකුණන්න ගියේ.අපියි මේක ගන්න ගියේ.ටී.එච්.ඩබ්.එකට ගන්න ගිය ඉඩම ජී.එම්.එස් .මහත්තයා.ඒක හරි නොගිය නිසා රෙඩ්කොස් එකට ඉඩම වික්කා.ඒ මහත්මයාගේ නමින් ඒ ඉඩම මෙහේ වරිපනම් ලේඛනයේ තියෙනවනම් මේ ඉඩම ඇත්ත වශයෙන්ම අපට අයිතී.මේවට සාධක තියෙන්නේ එතන.

- **ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා පෙ.ව.9.57 ට පමණ ගරු සභාවට පැමිණෙන ලදී.**

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ග්‍රාමසේවක මහත්වරු ජන්ද නාම ලේඛනය ගොඩහේනට ලියාපදිංචි කරපු එකනේ ගැටලුව.එනිසා අපි මේක යෝජනාවක් විදියට ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට දාමු.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්.එල්.අනුර කිත්සිරි මහතා කතා කරමින්</u>**

මේ ඉල්ලීම ඉතාම සාධාරණයි සභාපතිතුමණි,මේ ආකාරයෙන්ම නේද කන්ද ප්‍රදේශයේ සමහර ගෙවල් වලත් වෙලා තියෙන්නේ.මේ යටගිය කාරණයක් එක්ක අපට බැරිද නගර සීමා නිර්ණය කිරීමක් නැවත ඉල්ලන්න.

- **ගරු නගර සභා මන්ත්‍රී කේ.පුෂ්පික ඉන්ද්‍රජිත් මහතා පෙ.ව.10.02 ට පමණ ගරු සභාවට පැමිණෙන ලදී.**

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නගර සීමා නිශ්චිතව නිර්ණය කරලා තියෙන්නේ.මේකෙත් නිර්ණය කරලා තියෙන්නේ.පැහැදිලිව මේක ගැසට් එකේ තියෙනවා.ගැසට් එක ගහලා තියෙන්නේ 1987.05.12 වෙනිදා.ආර්.ප්‍රේමදාස පළාත් පාලන හා ඉදිකිරීම් අමාත්‍යවරයා වශයෙන් ඉද්දී.මේකේ ප්‍රාදේශීය සභා සීමාව විදියට දාලා තියෙන්නේ හල් වතුර ගඟෙන් වැටෙන පල්ලෙතොට ඇළ මධ්‍යයෙන් සිට එම ගඟ දිගේ ගොස් ගොඩහේන තල්ගස්ගොඩ ඇළන්ඩේල් සහ බිෂොප් වතු වලට....... කියලා තියෙන්නේ.ඒ විදියට තමයි මායිම් යන්නේ.ඒ කියන්නේ මේක පැහැදිලියි.අපට පරීක්ෂණයක් කරලා ගන්න පුලුවන්.එනිසා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට යොමුකරමු.

**<u>තීරණය</u>**

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් පල්ලේතොට රතුකුරුස නිවාස සංකීර්ණයේ ජනතාව විසින් තම නිවාස සංකීර්ණය අම්බලන්ගොඩ නගර සභා සීමාවට ඇතුලත් කර ගැනීමට කරන ලද ඉල්ලීම යෝජනාවක් ලෙස අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැවැත්වෙන ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට යොමු කර තීරණයක් ගැනීමට ගරු සභාව තීරණය කරන ලදී.**

**3:2** **‘** අලුත් අවුරුදු උත්සව සමයේ පාරිභෝගික පහසුව සඳහා තාවකාලිකව ඉදිකෙරෙන අව් වැසි ආවරණය - සෑම වසරකම ඉඩ කඩ ලබා ගැනීම සඳහා**’** මැයෙන් අම්බලන්ගොඩ ,ගාලූ පාර,11 ජී, ලිපිනයේ පදිංචි ලලිත් හැලඹගේ මහතා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

සෑම වසරකම අවුරුදු සමයේ අම්බලන්ගොඩ නගරයට විශාල පාරිභෝගික පිරිසක් පැමිණෙන බවත්, අම්බලන්ගොඩ නගර සභාවේ අනුමැතිය ලබා ගෙන සෑම වසරකම ජනතාව සඳහා අව් වැසි ආවරණයක් සකස් කරන බවත්, කිසිවකුට අවහිර නොවන ලෙස සහ ඕනෑම අවස්ථාවක ගලවා ඉවත් කිරීමට වගකීමෙන් බැඳීමෙන් සිටින බවත් මෙම තාවකාලික ටෙන්ට් එක සෑම වසරකම ඉදිකිරීමට අවසර ලබා දෙන ඉල්ලා තිබුණි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්.එල්.අනුර කිත්සිරි මහතා කතා කරමින්</u>**

ගිය සභාවේදී අපි මේකට අනුමැතිය දුන්නනේද?

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි ඒකට අවසර දුන්නා.මේ ඉල්ලන්නේ වාර්ෂිකව මේක ඉදිකරන්න අවසර ලබා දෙන්න කියලා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්.එල්.අනුර කිත්සිරි මහතා කතා කරමින්</u>**

සභාවේ අනුමැතිය පරිදිද

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එහෙම දෙනවනම් ඩිසයින් එක අපි දෙන්න ඕන.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්.ජයන්ත මහතා කතා කරමින්</u>**

මේ සම්බන්ධයෙන් කතා කරනවනම් ,අපි විරුද්ධව නොවේ.නමුත් ගිය මාසේ අපි මේ සම්බන්ධයෙන් සභා තීරණයක් ගත්තා.මාස 06 ක් යන තුරු ඒක ඒ විදියයි. මේ එක හා සමාන යෝජනාවක්නේ.සභා තීරණයක් වෙනස් කරන්න බෑ මාස 06 ක් යනකම්.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

පසු ගිය මාසේ යෝජනාව තියෙන්නේ මේ වසරට වලංගු වන යෝජනාවක්.මේ ඉල්ලන්නේ සෑම වසරකම උත්සව සමයේ මේක ඉදිකරන්න අවසර දෙන්න කියලා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්.ජයන්ත මහතා කතා කරමින්</u>**

ඉතින් එක හා සමාන යෝජනාවක්නේ.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

සමාන නෑ.එකක් මේ වසරට විතරයි වලංගු වෙන්නේ.අනෙක් එක සෑම වසරකටම ඉල්ලන්නේ.අපිට ඕන නම් දෙන්න පුලුවන්.නැතිනම් නොදී ඉන්න පුලුවන්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්.එල්.අනුර කිත්සිරි මහතා කතා කරමින්</u>**

මං බැලුවේ ගිය වර ආපු යෝජනාව මේ පාරත් ආවේ මොකද කියලා.සමහර විට එතුමා ව්‍යාපාරිකයෙක් නිසා ඒ අවශ්‍ය කරන මෙවලම් සඳහා වැඩි වියදමක් දරන්න වෙන නිසා වෙන්න ඇති සමහර විට.එහෙම ඉදිකිරීමක් කරනවනම් අපේ නගරයට සුදුසු පරිදී අපේ තාක්ෂණ සේවා නිළධාරීන්ගේ අධීක්ෂණය යටතේ ඒ ඉදිකිරීම් කටයුත්ත කරන්න අවසර දෙනවනම් වඩාත් හොදයි කියලා මම හිතනවා සභාපතිතුමනි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී බී.ජනිත් වික්‍රමතිලක මහතා කතා කරමින්</u>**

ගිය සභාවේදී කිසිම විරෝධතාවයක් නැතිව අපි මේ සභාවේ ඒ සඳහා එතුමාට අවසරය ලබා දුන්නා.දැන් මේ සභාවේ ඉල්ලීමක් කරනවා සෑම වසරකටම සරිලන පරිදි මේ යෝජනාව ගේන්න කියලා.මං හිතන්නේ ලබන මාසේ සභාවට අපි තේරෙන්නත් පුලුවන් නොයින්නත් පුලුවන්.ඔබතුමා සභාපතිතුමා වෙන්නත් පුලුවන් නොවෙන්නත් පුලුවන්.එනිසා මම හිතන්නේ ප්‍රායෝගික නැහැ.ලබන සභාවට පත්වෙන මන්ත්‍රීවරුන් හිරකිරීමක් අපි කරන්නේ.අපි අද මේක දෙන්න තීරණයක් ගත්තා කියමු.එහෙම වුනොත් ලබන පාර එන සභාපතිවරයාට හෝ මන්ත්‍රීවරුන්ට ඒ තීරණයට විරුද්දව තීරණයක් ගන්න වෙනවා එහෙමනම්.කැමැත්ත දෙන්න හරි නොදෙන්න හරි.ඒක යෝග්‍ය නෑ.මේ යෝජනාව මම නම් පෞද්ගලිකව මම අකමැති.මොකද වසරින් වසර එතුමාලට ඒ අවශ්‍යතාවය පරිදි මේ සභාව මෙච්චර කල් ඒ අවසරය ලබා දුන්නා.එතුමාට සභාවට ලිපියක් යොමු කරන එක මහ දෙයක් නෙවෙයිනේ.අද මේ තීරණය ගත්තොත් ඉදිරියේදී මිනිස්සු අපටත් සාප කරාවී මේකට.මම නම් මේකට එකඟ නෑ.

<u>තීරණය</u>

☞ **අම්බලන්ගොඩ ,ගාලු පාර,11 ජී, ලිපිනයේ පදිංචි ලලිත් හැලඹගේ මහතා විසින් කරන ලද ඉල්ලීමට ගරු සභාවේ අනුමැතිය ලබා නොදුන් අතර සෑම වසරකම අවුරුදු සමයේදී පාරිභෝගික පහසුව උදෙසා ඉදිකරන අව් වැසි ආවරණය සඳහා වාර්ෂිකව නගර සභාවට ලිපියක් යොමු කොට අවසර ලබා ගන්නා ලෙස ලලිත් හැලඹගේ මහතාට දැණුම් දීමට ගරු සභාව තීරණය කරන ලදී.**

**(04)** **යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**

**(05)** **යථා පරිදි කල් දී ඇති යෝජනා**

**5:1** **ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන යෝජනා (නිළධාරීන් විසින් සකස්කරන ලද පරිපාලන යෝජනා) :-**

**5:1:1** **"ගලි බවුසර් සේවාව සැපයීමේදී සේවාලාභීන් විසින් ජල සම්පාදන මණ්ඩලය වෙත ගෙවිය යුතු මුදල නගර සභාවෙන් ගෙවා සේවාලාභීන්ගෙන් අය කර ගැනීම" සභා වන යෝජනාව**

**"ගලි බවුසර් සේවාව වඩාත් ඵලදායී ලෙස ලබා දීම සඳහා ගලි ලෝඩ් බැහැර කිරීම වෙනුවෙන් ජල සම්පාදන මණ්ඩලය වෙත ගෙවිය යුතු මුදල් නගර සභා අරමුදලින් එකවර ලෝඩ් 25 ක් සඳහා වන රු.24975.00 ක මුදල ගෙවීමටත් එම මුදල සේවාලාභීන්ගෙන් අයකර ගැනීම සුදුසු බවත් ,මෙය අඛණ්ඩව පවත්වාගෙනයාම සුදුසු බවත් මෙම සභාවට යෝජනා කරමි."**

**මෙම යෝජනාව පිළිගත යුතු බව ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.**

**<u>තීරණය</u>**

**ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් මෙම යෝජනාව සඳහා ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලද අතර මේ සඳහා සේවා ගාස්තුවක්ද අය කරන ලෙස වැඩි දුරටත් සඳහන් කරන ලදී.**

**5:2** **ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනා :-**

**5:2:1** **ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව.**

**"පොල්වත්ත තල්ගස්ගොඩ හරහා බටපොල පාරේ බටපොල සිට ධාවනය වන බස් රථ කුලරත්න මංසංදියේ නතර කරන්නැයි" ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්.ජයන්ත මහතා විසින් ස්ථිර කරන ලදී.**

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමණි ,පොල්වත්ත තල්ගස්ගොඩ බටපොල පාරේ ,බටපොල සිට ධාවනය වන බස් රථ කුලරත්න මංසංන්ධයේ නතර කරන ලෙස යෝජනා කරනවා.දැනට දින 10 ක පමණ කාලයක සිට බටපොල සිට පොල්වත්ත හරහා ධාවනය වන බස් රථ කුලරත්න මංසංදියේ රොසෙත් රෝහල ළඟ නතර කරන්න පොලීසිය ඉඩ දෙන්නෑ.1978 විතර මං දන්න විදියට අනගාරික රයිටර් සිල්වා මහත්තයා බස් රථ සේවාව ආරම්භ කළේ.මම එතකොට 05 වසරේ.මට මතකයි අපි මෙතනින් තමයි බස් එකෙන් බැහැලා යන්නේ.දැන් අවුරුදු 35 කට වැඩි කාලයක් මේ බස් හෝල්ට් එක තියෙනවා.දැන් දින 10 ඉස්සෙල්ලා මේ හෝල්ට් එක අයින් කරලා.තල්ගස්ගොඩ,පොල්වත්ත,පෝරඹ,තිලකපුර,කොබෙිතුඩුව,බටපොල ඉදලා එන අයට මේක විශාල අසාධාරණයක්.මේ මිනිස්සු එක්කෝ බහින්න ඕන හල්වතුර හන්දියේ ,නැතිනම් බස් ස්ටෑන්ඩ් එකේ බැහැල ඕන එන්න.පාසල් යන ළමයින්ට මේක ඉතාම අසීරු කාරණයක්.ඒ ළමයි ස්ටෑන්ඩ් එකේ බැහැලා ධර්මාශෝක

විද්‍යාලයට,දේවානන්ද විද්‍යාලයට එන්න ඕන.නැතිනම් හල් වතුර හන්දියේ බැහැලා පයින් එන්න ඕන පාසල් වලට.අවුරුදු ගාණක් තිබ්බ බස් හෝල්ට් එක අයින් කරන්න පොලීසියට අයිතියක් නෑ සභාපතිතුමණී.නමුත් බස් නැවතුමේ නැති වුණාට පුද්ගලික වාහන නතර කරලා තියෙනවා ඕන තරම්.එහෙනම් ඒවත් ලියන්න පුලුවන්නේ.අපි උදේ හාවා මම ,දේව් මන්ත්‍රීතුමා,ජයන්ත මන්ත්‍රීතුමා,දේව් මන්ත්‍රීතුමා නිතරම මෙතනින් එහාට මෙහාට යන අය.ඕන තරම් පාලම ගාව ඉදල පහළට වාහන නවත්තලා තියෙනවා.එහෙනම් ඒවත් ලියන්න පුලුවන්නේ.මඟී ජනතාව විශාල ප්‍රමාණයක් ඇවිල්ලා බහින තැන බස් එක නතර කරන්න දෙන්නෑ.වාහන නතර කරන්න පුලුවන්.මේක ඉතාම අසාධාරණ ක්‍රියාවලියක්.මීට පෙර ගරු සභාපතිතුමා මැදිහත් වුණා ගාල්ල සිට කොළඹ යන බස් එක සෙලාන් එක ළඟට ගෙනිච්චා.ඔබතුමා මැදිහත් වෙලා නැවත ඒක පෙර ස්ථානයටම ගෙන ආවා.අපි ජනතාවගේ පහසුව සඳහා මේවා කරන්නේ.නමුත් අද කීප දෙනෙක්ම මට කීවා බලන්න උප සභාපතිතුමණී මේ බස් නතර කරන්නෑ මෙතන ස්ටෑන්ඩ් එකටම ගිහිල්ලා එන්න ඕන කියලා.මේක ඉක්මණින්ම මාර්ගස්ථ මඟී ප්‍රවාහන එකට දන්වලා මේ බස් රථ නැවතත් කුලරත්න මං සංදියේ නවත්වන්න කියන්න තමයි මම මේ යෝජනාව ගෙනාවේ සභාපතිතුමණී.අනෙක් මන්ත්‍රීවරුත් මේකට විරුද්ධ වෙන එකක් නෑ.මොකද මේක සාධාරණ කාරණයක්.අපි නගර සභාවේ බෝඩ් ගහලා තියෙනවා ''නෝ පාර්කින්'' කියලා.නමුත් වාහන නතර කරනවා.එනිසා මම ඉල්ලනවා මඟී ජනතාව සහ විශේෂයෙන්ම පාසල් ළමුන් ගැන හිතලා මේක සාධාරණ යෝජනාවක් විදියට සලකලා මේ පිළිබඳ කටයුතු කරන්න කියලා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී බී.ජනිත් වික්‍රමතිලක මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමණී, උප සභාපති කමල් වැල්ලගේ කියපු යෝජනාව සාකච්ඡා වන අවස්ථාවේ මමත් මේකට අත්සන් කලා.ඒ අත්සන් කරන අවස්ථාවේ මම හිතන් හිටියේ අම්බලන්ගොඩ ඉදල එනකොට තියෙන හෝල්ට් එක කියලා.දැන් තමයි මට කාරණය තේරුනේ.එතන හෝල්ට් 02 ක් තියෙනවා.අම්බලන්ගොඩ ඉදන් යන කොට එතන නවත්තන්න දෙනවා.එනකොට නවත්වන්න දෙන්නෑ.ඇත්තටම මේ කාරණයේ කිසියම් කාරණයක් නිසා තමයි පොලීසියන් තීරනය කරන්න ඇත්තේ.හන්දියක් මධ්‍යයේ නතර කිරීමේ නීති රෙගුලාසී අනුවත් ඒකේ වරදක් තියෙනවා.ගාල්ල පැත්තෙන් එන බස් ඒ.එස්.බී.එක ළඟ නතර කරන්නත් අපෙනුත් නාහ පොලීසිය තීරණයක් ගත්තේ මේ වගේ දෙයක් නිසා.ඔය තීරණය අරගෙන තියෙන්නෙත් පොලීසියෙන්.මං හිතන්නේ මේ නගරයේ සිදු කරන දේවල් ගැන පොලීසිය සභාපතිවරයාවත් දැණුවත් කරලා එතුමාත් සමඟ සාකච්ඡා කරලා මේ තීරණ ගන්නවනම් මේ වගේ ගැටුම් කාරී තත්වයන්ට යන්නෑ.පොලීසියත් ,නගර සභාවත් කියන්නේ මහජනතාවත් එක්ක සම්බන්ධ වෙලා වැඩ කරන ආයතන දෙකක්.එනිසා අපි මෙහිදී කරන්න ඕන පොලීසියට ඇඟිල්ල දික් කිරීම නෙවෙයි,මේක සාකච්ඡා කරලා කොතනද සුදුසු කියන එකයි මං හිතන්නේ.මෙතන නතර කිරීමෙත් ප්‍රශ්නයක් තියෙනවා.මොකද ඒ පැත්තෙන් එන හෝල්ට් එකත් එක්කම මේ පැත්තේ හෝල්ට් එකත් තියෙනවා.බස් දෙකක් නතර කරපු වෙලාවට අනෙක් වාහන වලට යන්න විදියක් නෑ.අපි ඒක දැකලා තියෙනවා හොදට.අපි පස්සෙන් ඉදලා තියෙනවා පැය ගණන්.ස්කෝලේ ඇරිච්ච වෙලාවට සහ පටන් ගන්න වෙලාවට ඒක වැඩියි.හල් වතුරේ නතර කිරීමනම් කොහෙත්ම සාධාරණ නෑ.එනිසා මම හිතන්නේ රවුන්ද බවුට් එක ළඟ හීන් ඇළ හරස් පාර හැරෙන තැනවත් සාකච්ඡා කරලා තීරණයක් ගන්නවනම් හොදයි කියලා තමයි මම හිතන්නේ.පාලම උඩ නම් කොහෙත්ම සුදුසු නෑ.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

හෝල්ට් සම්බන්ධයෙන් පොලීසිය තීරණයක් ගන්න ඕන අපි සහ මාර්ගස්ථ මඟී ප්‍රවාහන අධිකාරිය සමඟ සාකච්ඡා කරලා අපේ එකඟත්වය ඇතිව.ඒ ගොල්ලන්ට මේ සම්බන්ධ වෙනම චක්‍ර ලේඛයක් නිකුත් කරලා තියෙනවා.ඉතින් මේ චක්‍ර ලේඛයට බැහැරව තනි මතයට ගත්ත තීරණ අපි සාකච්ඡා කරලා නැවත ඒ තත්වයට ගමු.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්.එල්.අනුර කිත්සිරි මහතා කතා කරමින්</u>**

ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා ගෙන ආ යෝජනාව දරුවන් සම්බන්ධයෙන් සාධාරණ තත්වයක් අපට දකින්න ලැබෙනවා සභාපතිතුමණී.ඒ වගේම අවුරුදු 35 ක් තිබ්බ තත්වය වෙනස් විය යුතුයි කියලා මතයකුත් තියෙනවා.නමුත් ජනිත් මන්ත්‍රීතුමා කීව ආකාරයට හල්වතුර ප්‍රදේශයේ ඉදලා පයින් ඒම සාධාරණ නෑ.ඒකත් පටහැනී වෙනවා යම් කාලයකදී.මොකද හන්දියක වාහන නැවැත්වීම සුදුසු නැති නිසා.නමුත් මීට සාපේක්ෂව සහ පාරේ පටු බවත් එක්ක බලද්දී ඔබතුමා කීව දේ සාධාරණයි.අපේ උප සභාපතිතුමාගේ යෝජනාවත් සාධාරණයි.එනිසා සභාපතිතුමණි, ගාලු පාර පුලුල් කිරීම සම්බන්ධ කටයුතු කොයි තත්වයේද තියෙන්නේ ?ඒ සම්බන්ධයෙනුත් අවධාණය යොමු කරන්න කියලා ඉල්ලනවා.දරුවන්ගේ පැත්තේන් සාධාරණ සහ සභාවේ අනන්‍යාතාවය ආරක්ෂා වන ආකාරයට කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්.ජයන්ත මහතා කතා කරමින්</u>**

සභාපතිතුමණී,මේකේ පැති කීපයක්ම තියෙනවා සලකලා බලන්න.ඔතන වගේ තමයි ඉස්සර ගාලු පාරේ එන බස් නැවැත්තුමේ හැරියස් සිල්වා මහත්තයගේ ගේ ළඟ.දිගමට නවත්තලා පස්සේ ඒ හෝල්ට් එක අයින්

කළා.එතන බලපිටියෙන් එන බස් නතර කළා.දැන් ඒ හෝල්ට් එක නෑ.අපි එදා ඒ ගැන කථා කළේ නෑ.ඒ වගේ තත්වයක් තමයි මෙතනටත් වුනේ.එනිසා මම හිතනවා වඩාත්ම සුදුසු දේ තමයි ජනිත් මහත්තයා කීවා වගේ හීන් ඇළ හරස් පාර වැටෙන තැන පල්ලේහා තමයි මේක කරන්න ඕන.උඩ මුකුත් කරන්න බෑ.එතන බෑවුම.බැස්ස ගමන් වැටෙනවා.එනිසා අර වගේ සමතලා තැනක් බලලා නතර කරන්න පුලුවන් නම් මං හිතන්නේ හොඳයි.ඒ වගේම මම ඉල්ලීමක් කරනවා හල්වතුරේ පාර පළල් කළා.එතන තිබුණා බස් හෝල්ට් එකක්.මං දැක්කා ඒක කඩලා විසි කරලා දාලා තියෙනවා.

<u>**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

බස් හෝල්ට් එක ස්ථානගත කරනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්.ජයන්ත මහතා කතා කරමින්**</u>

බස් හෝල්ට් එක ස්ථානගත කරන්න ඕන හරියට බලලා.මොකද රවුන්ද බවුට් එකේ බස් නවත්වන කොට පරණ පොල්වත්ත පාර ළඟ තමයි මේ බස් එක නවත්වන්නේ.මේ දෙකට හානි නොවන ආකාරයට ඒන ස්ථානගත කරන්න.

<u>**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

බස් හෝල්ට් එක ගෙනියනවා ඇළ ගාවට.මොකද එතන වට රවුමක් හැදෙනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්.ජයන්ත මහතා කතා කරමින්**</u>

ඒක හොඳයි එහාට ගත්ත එක.

<u>**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මෙතන ගැටලුව තියෙන්නේ පාරවල් 06 ක් එක තැනට වැටෙනවා.එන වාහනයක් පේන්නෑ.එනිසා තමයි පාර මේ පැත්තට කරන්න තීරණය කළේ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී බී.ජනිත් වික්‍රමතිලක මහතා කතා කරමින්**</u>

ඒක හොඳයි එතන පාර පළල් කරලා එතන හදපු එක ගැන අපි ප්‍රසංසා කරනවා.ඒ වගේම මම ඉල්ලීමක් කරනවා.මොකද දැන් මේ ස්ථානය වෙළඳුන්ගේ ග්‍රහණයට ලක් වුණ තැනක් වෙන මට්ටමක් තියෙනකවා.කෙනෙක් එනවා ඒ පාර තව කෙනෙක් ඇවිත් පස්සේ පුංචි පොළ වගේ වෙනවා මෙතනත්.අපි නම් ඒකට කැමති නෑ.මොකද මෙතන අවශ්‍යතාවය තියෙන්නේ එය කීව දේනම් එක් වෙළන්දෙකුට දුන්නම අනෙක් අයටත් දෙන්න වෙනවා.පොඩි වෙළෙන්දෝ තමයි.නමුත් මෙහෙම දුන්නොත් ඒක සභාවට ප්‍රශ්නයක්.මං හිතන්නේ ඒ නිසා එතන කිසිවකුට දෙන්න එපා කියලා මම ඉල්ලීමක් කරනවා.

<u>**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මෙම ස්ථානය ඇත්තටම කාටවත් අපි දීලා නෑ.ඒ වගේම රවුන්ද බවුට් එක අලුතින් ඩිසයින් කරලා හදන්න ඕන ආර්.ඩී.එක විසින්.

<u>**තීරණය**</u>

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් මෙම ඉල්ලීම අම්බලන්ගොඩ පොලිස් ස්ථානයට, ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයට සහ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියට දන්වා යැවීමට ගරු සභාව තීරණය කරන ලදී.**

## (6) කාරක සභා වාර්තා සලකා බැලීම

**6: 1** 2015.02.24 වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද සංවර්ධන උපදේශක කාරක සභා රැස්වීම් වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.

අම්බලන්ගොඩ නගර සභාව

සංවර්ධන උපදේශක කාරක සභා රැස්වීම් වාර්තාව

දිනය - 2015.02.24 වේලාව - ප.ව.2.30

ස්ථානය - නගර සභා රැස්වීම් ශාලාව

පැමිණීම

1. ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා - සභාපති , නගර සභාව ,අම්බලන්ගොඩ.
2. ජීයූ.සමරසිංහ මහතා - සංවර්ධන උපදේශක කමිටු සාමාජික ප්‍රජා නියෝජිත
3. එම්.ජී.ආර්.පුෂ්පකුමාර මහතා - සංවර්ධන සහකාර, නගර සභාව , අම්බලන්ගොඩ.
4. ඩී.කේ.වරුසවිතාන මහතා - සංවර්ධන උපදේශක කමිටු සාමාජික ප්‍රජා නියෝජිත
5. ඩී.වාසනා තරංගී මිය - ප්‍රජා සංවර්ධන නිලධාරී , නගර සභාව, අම්බලන්ගොඩ.
6. එස්.ජී.සජීවනී මිය - තාක්ෂන නිලධාරී , නගර සභාව , අම්බලන්ගොඩ.
7. එච්.මහින්දසේන මහතා - ඕකන්ද, උපදේශක කමිටු සාමාජික ප්‍රජා නියෝජිත
8. එම්.ඩබ්.ෂර්ලි චන්ද්‍රසිරි මහතා - පනියන්දූව උපදේශක කමිටු සාමාජික ප්‍රජා නියෝජිත
9. පී.එස්.එස්. ද සිල්වාමහතා - මහජන සෞඛ්‍ය පරීක්ෂක , නගර සභාව ,අම්බලන්ගොඩ
10. ඩී.ඩබ්.පත්මසිරි මහතා - ගණකාධිකාරී , නගර සභාව, අම්බලන්ගොඩ.
11. එම්.ඩබ්.අර්.දිල්රුක්ෂි මිය - සංවර්ධන නිලධාරී , නගර සභාව, අම්බලන්ගොඩ.

ගරු සභාපති නිතිඥ ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා විසින් පැමිණ සිටි සියළු දෙනා පිළිගනිමින් රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදි.

කර්මාන්ත ඇස්තමේන්තු ප්‍රජා නියෝජිතයන් වෙත ලබා දෙමින් සබාපත් තුමා සඳහන් කළේ මෙම ඇස්තමේන්තු ප්‍රදර්ශනය සඳහා මධ්‍යස්තථානයක් ඇති කිරීම සුදුසු බවයි.කමිටු සාමිජිකයන් පෙන්වාදෙනු ලැබූයේ ශාඛා පුස්තකාල වල ප්‍රදර්ශන පුවරු සකස් කිරීම ත් මෙයට විකල්පයක් බවයි. ඒ සඳහා කමිටුවේ නිර්දේශය ලැබුනි.මේ සඳහා ඇස්තමේන්තුවක් සකස් කරන ලෙස තාසේනි වෙත ගරු සභාපති තුමා විසින් උපදෙස් ලබා දෙන ලදි.

කර්මාන්ත අංශය මගින් ඉටුකරන ලද කර්මාන්ත පිළිබඳව තාක්ෂන නිලධාරී සජීවනී මිය විසින් ප්‍රගතිය ඉදිරිපත් කරන ලදි. ඒ අනුව බස්නැවතුම්පල තාර යෙදීම සිදුකළ බවත්, ආදාහනාගාරය දෙපැත්තේම ගල් අල්ලන ලද බවත්, හෙප්පුමුල්ල සේවා පියස සකස් කරමින් සිටින බවත් ප්‍රකාශ කරන ලදි. එසේම පනියන්දූව පාලම වැඩකටයුතු සොයාබැලූබවත් එහි මේවන විට කිසිවකු පැමිණ නොසිටි බවත් තාසේනි පවසන ලදි.

කළුවඩුමුල්ල ස්ලැබ් සකස් කරන ලෙස ගරු සභාපති තුමා විසින් තාසේනි වෙත උපදෙස් ලබා දෙන ලදි.

පනියන්දූව කමිටු නියෝජිත ෂර්ලිමහතා අදහස් දක්වමින් කියා සිටියේ රුහුණු විශ්ව විද්‍යාලයේ අධ්‍යයනය සඳහා අම්බලන්ගොඩ නගර සභාවේ සහභාගීත්ව සැළසුම් හා මෙම කමිටු පැවැත්වීම් පිළිබඳව කමිටු නියෝජිතයන්ගෙන් කරුණු විමසූ බවත් එම ව්‍යාපෘති වාර්තා පිටපතක් හැකි නම් ගෙන්වා ගනීම ඉදිරිකටයුතු සඳහා වැදගත් වන බවයි.

කමිටු නියෝජිත යු. සමරසිංහ මහතා කියාසිටියේ මාස 3 ට වරක් සෑම අංශයකම ප්‍රගති වාර්තාවක් ඉදිරිපත් කිරීම සුදුසු බවයි. ඒ සඳහා කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදි.එසේම ඒ මහතා අදහසක් ඉදිරිපත් කරමින් විලේගොඩ ළමා උද්‍යානයක් සකස් කිරීමට ඇති හැකියාව පිළිබඳව අදහස් විමසන ලදි. තවදුරටත් අදහස් දක්වමින් ඒ මහතා ජංගම වෙළඳුන් , රසකැවිලි වෙළඳාම කරන වැනි අය පිළිබඳව මහජන සෞඛ්‍ය පරීක්ෂක වරුන් සොය බැලීම් කරන්නේදැයි ප්‍රශ්න කරන ලදි. එසේ සොයා බැලීම කරන බව මසෞප විසින් දන්වන ලදි. මේ පිළිබඳව යු .සමරසිංහ මහතා කියා සිටයේ ජංගම වෙළඳාමේ යෙදෙන අය ජීවත්වීම සඳහා ස්වයං රැකියාවක් වශයෙන් එය කරගෙන යන බවත් කෙසේ වෙතත් ජංගම වෙළඳාම විධිමත් කිරීම සඳහා නගර සභාව මැදිහත් වියයුත් බවත් ප්‍රකාශ කරන ලදි. එසේ ම කෙසෙල් කැන් විකුණන අය එම ස්ථාන අපිරිසිදු කරන්නේ නම් ඒ පිළිබඳව ක්‍රියාකිරීමට පියවර ගැනීමත් එසේ වෙළඳාමේ යෙදෙන අය තුල ස්වයං පාලනයක් ඇති කරවන ආකාරයට කටයුතු කරන ලෙසත් ඉල්ලා සිටින ලදි.

කුලරත්න පාලම අසළ සිට හල්වතුර දක්වා පදිකයන්ට ගමන් කිරීමට හැකිවන පරිදි මංතීරුවක් (දෙදළු විළය ) සකස් කිරීමට ද එය සම්බන්ධිකරන කමිටුවට යොමු කිරීමට ද නිර්දේශය ලබා දෙන ලදි.

කමිටු නියෝජිත ෂර්ලි මහතා ප්‍රකාශ කලේ ගංවතුර තත්ත්වයන් ඇති වීමට පෙර සියළු ඇල මාර්ග පිරිසිදු කිරීමට වැඩපිළිවෙලක් සකස් කිරිම සුදුසු බවයි. ඒ සඳහා කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදි. ගරු සභාපති තුමා සඳහන් කළේ වතුර බවුසරයක් අළුතින් ලැබී ඇති බවත් එය භාවිතා කර කාණු පවිත්‍ර කිරීම සඳහා කටයුතු කරන ලෙසත් එසේ කිරීමට මසෞප වෙත උපදෙස් ද ලබා දෙන ලදි.

සංවර්ධන සහකාරඑම්.ජී.ආර්.පුෂ්පකුමාර මහතා විසින් ස්තුති කථාව කරමින් සියළු දෙනා ලබා දෙන ලද අදහස් ඉතා වැදගත් බවත්, පැමිණි සියළු දෙනාට ස්තුතිය ප්‍රකාශ කරන බවත් ප්‍රකාශ කිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු අවසන් කරන ලදි.

සකස් කළේ : එම්.ජී.ආර්. පුෂ්පකුමාර
සංවර්ධන සහකාර

| | |
|---|---|
| ලේකම් | නීතිඥ ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් |
| අම්බලන්ගොඩ නගර සභාව | සභාපති |
| | නගර සභාව අම්බලන්ගොඩ |

**ඒ අනුව 2015.02.24 දින පවත්වන ලද සංවර්ධන උපදේශණ කාරක සභා රැස්වීම් වාර්තාව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**6: 2** 2015.02.20 වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද පුස්තකාල කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී .ලක්ෂ්මී හේමන්තා සිල්වා මෙනවිය විසින් ස්ථිර කරන ලදි.

**wïn,kaf.dv k.r iNdfõ .re k.r iNd uka;%S foaõ frdaydka uy;d uq,dikh ±rE 2015$02$20 Èk mqia;ld, lñgq jd¾;dj'**

- wd¾'mS' foaõ frdaydka uy;d ^.re k.r iNd uka;%S&
- ã'ù' jdikd ;rx.s ñh ^m%cd ixj¾Ok ks,Odßks&
- fla'ví' rxckS udfk,a fukúh ^mqia;ld,hdêm;sks&

- isßmd, udÿjf.a uy;d ^lñgq idudcsl&

- y¾nÜ ùrlafldä uy;d ^lñgq idudcsl&

- à'ví'yßiapkaø uy;d ^lñgq idudcsl&
- iq.;a fyÜáwdrÉÑ uy;d ^lñgq idudcsl&
- cS'ví' .=Kisß uy;d ^lñgq idudcsl&
- cS'tÉ't,a' mshka;s fukúh ^mqia;ld, idydhsld&
- taa'ví' bkaÞodi uy;d ^mqia;ld, idydhl&
- ta'cS' risld ñh ^mqia;ld, idydhsld&
- f.!ß j¾iú;dk ñh ^mqia;ld, idydhsld&

- tï'ví'fca'iqux.,s ñh ^mqia;ld, idydhsld&

- fla'ta' úiqoaê f¾Kqld ñh ^mqia;ld, idydhsld&
- tia' iqis,d oSmdks ñh ^mqia;ld, idydhsld&
- ud,;s iuka;d wdßhisxy ñh ^mqia;ld, idydhsld&

.re iNdm;s;=ud rdcldß lghq;a;la i|yd neyer f.dia we;s neúka .re k.r iNd uka;%S wd¾'mS' foaõ frdaydka uy;d lñgqjg meñKs uy;au uy;aóka ms<s.ekSfuka miq lñgqfõ jevlghq;= wdrïN lf<ah'

- .re k.r iNd uka;%S wd¾'mS' foaõ frdaydka uy;d úiska lñgq idudcsl tka'tÉ'vkalka o is,ajd uy;d lñgqjg iyNd.s ùug fkdyels nj okajd tjk ,o ,smsh lñgqjg bÈßm;a lrk ,È'
- m%Odk mqia;ld,fha m%.;s jd¾;dj mqia;ld,hdêm;sksh úiska bÈßm;a lrk ,È' fmdarU YdLdfõ fiajh lrk iyhsldj wikSm ù we;snj  ta'ví' bkaÞodi uy;d m%ldY lrk ,È' tu YdLdfõ jd¾;dj Tyq úiska bÈßm;a lrk ,È' wfkl=;a YdLd mqia;ld,j, m%.;s jd¾;d ta ta YdLd Ndr ks,OÍka úiska o" úoHq;a mqia;ld,fha jd¾;dj m%Odk mqia;ld,fha fiajh lrk mshka;s fukúh úiska o" bÈßm;a lrk ,È'
- ckjdß ui mqia;ld, lñgq /iaùfï§ .re iNdm;s;=ud úiska fuu jir ;=< l%shd;aul lsÍug jevigyka ie,eiaula bÈßm;a lrk f,i mqia;ld,hdêm;skshg Wmfoia fok ,È' ta wkqj fujr lñgq /iaùfï§ jevigyka ie,eiau ms<sn| úia;r m;%sldj lñgqjg bÈßm;a lrk ,È' fuu jevigyka ie,eiau .ek lñgq iudcsl uy;=kaf.a m%idoh ysñúh'
- .re k.r iNd uka;%S wd¾'mS' foaõ frdaydka uy;d úiska fmd;a mß;Hd.hla lrk ,o il=ka;,d fyÜáfyajd uy;añhf.a ,smsh lñgqjg bÈßm;a lrk ,È' ta iïnkaOj ia;=;sh mqolrk ,È'

• .re k.r iNd uka;%S wd¾'mS' foaõ frdaydka uy;d lshd isáfha m%foaYfha mdi,a yhla ;sìh§;a úµq;a mqia;ld,fha idudcsl ixLHdj wvqnjla fmkShk nj;a" mdi,a yfha isiq ore ±ßhkag úµq;a mqia;ld,h iïnkaOj ±kqj;a lsÍu i|yd iqÿiq mshjrla .kakd f,i .re k.r iNd uka;%S wd¾'mS' foaõ frdaydka uy;d m%cd ixj¾Ok ks,Odßkshg Wmfoia fok ,os'

• .re k.r iNd uka;%S wd¾'mS' foaõ frdaydka uy;d mqia;ld, j, wvqmdvq ;sfío hkak úuik ,È' fmd;a ;eìu i|yd lnâ wvq neõ iyhsldjka lSmfofkl= mejiqjdh' t;=ud ta ms<sn|j m%cd ixj¾Ok ks,Odßkshf.ka lreKq úuiqfõh' wïn,kaf.dv ,S nvq fj<|ie,aj, mqia;ld, ±j NdKav m%ñ;shg wkqj lnâ fkdue;s nj tu uy;añh mejiqjdh' wjYH m%ñ;shg wkqj lnâ ,nd .kakd f,i .re k.r iNd uka;%S wd¾'mS' foaõ frdaydka uy;d Wmfoia fok ,È'

• lñgq idudcsl isßmd, udÿjf.a uy;d lshd isáfha fmdarU YdLd mqia;ld,fha merKs mqj;am;a f.dv.id we;s neúka th wm%ikak njhs' udi 6lg jrla mqj;am;a fjkafoaiS lrk nj mqia;ld,hdêm;sksh m%ldY l<dh'

• fmdarU YdLd mqia;ld,fha mqgqj, l=Ika .s,d neiSu ksid mdGlhkag jdäùug wmyiq ;;ajhla Wodù we;sneõ lñgq idudcsl iq.;a fyÜáwdrÉÑ uy;d mejiqfõh' tu mqgq ms<silr lr .ekSug uq,H wdOdr .re k.r iNd uka;%S wd¾'mS' foaõ frdaydka uy;d ,nd fok nj;a ta i|yd wjYH lghq;= iïmdokh lrk f,i lñgq idudcsl uy;=kaf.ka b,a,d isáfhah' túg iq.;a fyÜáwdrÉÑ uy;d úiska tu lghq;a; lsÍu i|yd ndr .kakd ,È'

• iq.;a fyÜáwdrÉÑ uy;d lshd isáfha mqia;ld, lñgq /iaùï i|yd mlaI úmlaI .re k.r iNd uka;%S flfkl= wksjd¾hfhkau iyNd.sùu jeo.;anjhs' .re k.r iNd uka;%S wd¾'mS' foaõ frdaydka uy;d iNdfõÈ fï .ek ildÉPd lsÍug lghq;= lrk nj mejiqfõh'

• mqia;ld, lñgq /iaùï j,§ .kakd ;SrK l%shd;aul lsÍug udihla jeks flá ld,hl§ lsÍug wmyiq neúka mqia;ld, lñgq idudcsl iq.;a fyÜáwdrÉÑ uy;d lshd isáfha udi follg jrla lñgq /iaùï mj;ajk f,ihs' .re k.r iNd uka;%S wd¾'mS' foaõ frdaydka uy;d o tu woyi fyd| nj ms<s.kakd ,È'

• lñgqfõ jevlghq;= wjika lsÍug m<uqj ia;=;s l;dj lsÍu ioyd .re k.r iNd uka;%S wd¾'mS' foaõ frdaydka uy;d úiska m%cd ixj¾Ok ks,Oß;=ñhg wdrdOkd l<dh' tysÈ t;=ñh iafõÉPdfjka lñgqjg meñKs ish¨u uy;au uy;aókag ia;=;sh m%ldY lrñka lñgqfõ jev wjika lf<ah'

''''''''''''''''''''''''''''''''''''''''

lñgq f,alï"

k.r iNdj wïn,kaf.dv'

''''''''''''''''''''''''''''''''''''''''''

''''''''''''''''''''''''''''''''''''''''''''''''

f,alï" w;aika lf<a iNdm;s"

k.r iNdj wïn,kaf.dv' k.r iNdj wïn,kaf.dv'

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.පී.දේව් රොහන් ද සිල්වා මහතා කතා කරමින්</u>**

පසු ගිය පුස්තකාල කමිටුවේදී මතු වුණ කරුනු කිහිපයක් තියෙනවා.මේ වාර්තාවේ නිවරදි කිරීමකුත් කරන්න ඕන.සුගත් හෙට්ටි ආරච්චි මහතා කීයා සිටියේ පුස්තකාල කමිටුවට විපක්ෂ ගරු මන්ත්‍රීවරයකු සහභාගී වීම වැදගත් බවයි.මං හිතන්නේ එතන එහෙම නෙවෙයි කියවුණේ.යෝජනා වුණේ විපක්ෂයේ මන්ත්‍රීවරුන් සහ පාලක පක්ෂයේ මන්ත්‍රීවරුන් මේ සඳහා සහභාගී වෙනවනම් හොඳයි කියලා.ඒක නිවරදි කිරීමක් කරන්න.ඒ වගේම පුස්තකාල කමිටුව මාස 02 වරක් පවත්වන්න කියලා යෝජනාවක් ආවා.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මාසිකව කමිටු රැස්වීම් කරන්න ඕන.ඇයි මාස 02 වරක් කරමු කීවේ .එන්නැති නිසාද?

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.පී.දේව් රොහන් ද සිල්වා මහතා කතා කරමින්</u>**

ඔවුන්ටත් එන්න පහසුයි කියලා.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මම කියන්න ඕන මට තියෙනවා මාසෙකට සහභාගී වෙන්න කමිටු 12 විතර.මන්ත්‍රීවරුන්ගේ සහභාගීත්වය ඉතාමත් දුර්වලයි.ස්වෙච්ඡාවෙන් එන අපේ මහජනතාව කියන කතාවක් තමයි ඇයි මේ මන්ත්‍රීවරුන්ට සහභාගී වෙන්න බැරි කියලා.ඒදා දේව් රොහාන් මන්ත්‍රීතුමා පැමිණීම සම්බන්ධයෙන් ඔවුන් සතුටු වේලා තියෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.පී.දේව් රොහන් ද සිල්වා මහතා කතා කරමින්</u>**

මම පුලුවන් හැම අවස්තාවකම පුස්තකාල කමිටුවට සහභාගී වෙලා තියෙනවා.ඒ වගේම මම යෝජනා කරනවා අපේ විද්ුයුත් පුස්තකාලේ මේ වන විට ඉතාමත් අඩු සංඛ්‍යාවක් තමයි ඉන්නේ.පාසල් සිසුන් 6000 ක් පමණ ඉන්නවා මේ ප්‍රදේශයේ.ගිය මසත් වැඩි වීම තිබුණේ පාසල් සිසුන් 03 යි.මම කීවේ පත්‍රිකාවක් මඟින් නැවතත් ඔවුන් දැණුවත් කරමු.එහෙම නැතිනම් අපි මාසෙකට අය කරන රු.100.00 පාසල් සිසුන්ට රු.50.00 කරමු.අපට අවශය වෙලා තියෙන්නේ මේ දැණුම ලබා දෙන්න.මේ පසු ගිය වාර්තාව අරගෙන බැලුවහම තාමත් 150 ක් වගේ පිරිසක් මෙකේ ඉන්නේ සමාජිකයින්.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

පසු ගිය මාසේ 300 ක් ඇවිත් තියෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.පී.දේව් රොහන් ද සිල්වා මහතා කතා කරමින්</u>**

ඒ සහභාගී වුණ අය සියලු දෙනාමත් එක්ක.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

පසු ගිය මාසේ අඩුයි.ඊට කලින් මාසේ 300 ට කිට්ටු වෙන්න ඇවිත් තියෙනවා.මෙහෙමයි මන්ත්‍රීතුමා මේ පුස්තකාලයේ වටිනාකම තියෙන්නේ දුප්පත් ළමයින්ට තමයි.අද වෙනකොට තාක්ෂණය දියුණු වීමත් සමඟ සෑම ගෙදරකම වගේ පරිගණකයක් තියෙනවා.ඉතින් මේකට එන්නේ එවැනි පහසුකමක් නැති දුප්පත් ළමයින් විතරයි.එනිසා අපි මේක මෙතත්වයෙන් හරි තියාගෙන මේ සේවය දෙන එක හොඳයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.පී.දේව් රොහන් ද සිල්වා මහතා කතා කරමින්</u>**

මම කියන්නේ මේක වර්ධනය කරන්න ඕන.එනිසා නැවත මේක දැණුවත් කරන්න ඕන කියලා මම කියන්නේ.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි ඒ සම්බන්ධයෙන් වැඩ සටහනක් සකස් කරන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.පී.දේව් රොහන් ද සිල්වා මහතා කතා කරමින්</u>**

අපි එහෙම කරමු.නැතිනම් මේ මුදල හරි අඩුකරමු.එහෙම නොවුනොත් අපි මේ සඳහා වැය කරපු මුදලත් අපරාදේ වෙනවා.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

විද්‍යුත් පුස්තකාලය සඳහා වැය කරපු මුදල ඉපයීමේ අපේක්ෂාවක් නෑ අපට.අපේ ඉපයීම වෙනුනේ නැණවත් පිරිසක් බිහිමවීම සහ එකෙන් ලැබෙන ප්‍රතිඵලය විතරයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.පී.දේව් රොහන් ද සිල්වා මහතා කතා කරමින්</u>**

මම කියන්නේ මුදල් ඉපයීම නෙවෙයි.මේ සඳහා අපි විශාල මුදලක් වැය කරලා තියෙන්නේ.ඒකේ ප්‍රතිඵල ජනතාවට යන්න ඕන කියලා තමයි මම කියන්නේ.එහෙම නම් අපි නොමිලයේ හරි දෙමු .

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගාස්තු වෙනස් කිරීමක් කරන්න වෙන්නේ නැවත අය වැය කමිටුවකදී කතා කරලා තමයි.

**ඒ අනුව 2015.02.20 දින පවත්වන ලද පුස්තකාල කමිටු වාර්තාව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සහා සම්මත විය.**

**6: 3** 2015.02.19 වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද පරිසර සෞඛ්‍ය හා සනීපාරක්ෂක වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

**<u>පරිසර , සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුව</u>**

**<u>2015.02.19. ප.ව.2.30</u>**

**<u>සහභාගීත්වය</u>**

| | | |
|---|---|---|
| **1.** | භාරත සමරසේකර. | ලේකම්, අම්බලන්ගොඩ නගර සභාව. |
| **2.** | එම්.පී.බී.ඩබ්.යූ කුමාරි මිය. | ආයුර්වේද වෛද්‍ය නිලධාරී. |
| **3.** | එම්.ඩී.මිත්‍රසිරි ද සිල්වා මහතා. | පොලිස් පරීක්ෂක. |
| **4.** | පී.එස්.එස් ද සිල්වා මහතා. | මහජන සෞඛ්‍ය පරීක්ෂක. |
| **5.** | එච්.එච් නිහාල් රණසූරිය මහතා. | පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක. |
| **6.** | ඩී.වී තරංගි මිය. | ප්‍රජා සංවර්ධන නිලධාරී. |
| **7.** | එච්.නයනා චාන්දනී මිය. | සංවර්ධන සම්බන්ධීකරණ. |
| **8.** | පී.සී.සජිවනී මිය. | තාක්ෂණ සේවා නිලධාරී. |
| **9.** | එම්.මලිත් ප්‍රනාන්දු මහතා. | තාක්ෂණ සේවා නිලධාරී. |
| **10.** | බී.ඩී.ඊ.කොඩිතුවක්කු මිය. | පවුල් සෞඛ්‍ය සේවිකා. |
| **11.** | පී.එච්.එල්.පුෂ්පරාණි මිය. | සංවර්ධන සහකාර. |
| **12.** | ආර්.සුසිලා නන්දනී ද සිල්වා මිය. | කළමණාකරණ සහකාර. |
| **13.** | එම්.එච් ආශා මිය. | ග්‍රාම නිලධාරී 82, මහ අම්බලන්ගොඩ. |

14. ඕ.එස් දිශානි මිය. ග්‍රාම නිලධාරී 86 බී කෙරමිණිය.
15. පී.පී.රන්දික මදූෂාන් මහතා. ග්‍රාම නිලධාරී 85 බී පටබැඳිමුල්ල.
16. එච්.කේ.ඩබ්.දේවප්‍රිය ගුණසේකර මහතා. ග්‍රාම නිලධාරී 85 ඒ හෙප්පුමුල්ල.
17. පී.එච්.කුමාර ද සිල්වා මහතා. ග්‍රාම නිලධාරී 86 ඒ කළුවඩුමුල්ල.
18. එච්.එම්.ටී.එච් ද සිල්වා මහතා. ග්‍රාම නිලධාරී, 86 ඊ, ඕනක්ද.
19. වීමා ආර්. ගාල්ලගේ මිය. ග්‍රාම නිලධාරී, 83, කරිත්තකන්ද.
20. කේ.ඒ.එච් කරුණාවර්ධන මහතා. ග්‍රාම නිලධාරී, 86, ඩී, තල්ගස්ගොඩ.
21. සුජීව එගොඩගේ මහතා. ග්‍රාම නිලධාරී, 84 ඒ, පනියන්දූව.
22. ඇම්.ඩබ් හිරාන් සංජීව මහතා. සෞඛ්‍ය පරිපාලක.

**පිළිගැනීම.**

අම්බලන්ගොඩ නගර සභාවේ ලේකම්, භාරත සමරසේකර මහතා. සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුව සඳහා පැමිණි සියළු නිලධාරී මහත්ම මහත්මීන් හා නගර සභා කාර්යමණ්ඩලය ඉතාමත් ගෞරවයෙන් පිළිගනු ලබන බව පවසන ලදි.

**2015.01.12 දින පැවති රැස්වීමේ සාකච්ඡා වූ කරුණු සමාලෝචනය**

| මාතෘකාව | සාකච්ඡා වූ කරුණු | ප්‍රකාශය කවුරුන් විසින් ද යන වග. | තීරණය |
|---|---|---|---|
| කසල අවසන් බැහැරලන ස්ථානයට ප්‍රවේශ මාර්ගය සකස් කිරීම. | පිවිසුම් මාර්ගය බොහෝ දුරට සකස් කර ඇති බව. මුදල් ගෙවීම ප්‍රමාද බව. තව කියුබ් 50ක් පමන දැමිය යුතු බව. | තාක්ෂණ සේවා නිලධාරී.මලිත් ප්‍රනාන්දු මහතා. | |
| පටබැඳිමුල්ල කොට්ඨාශයේ වෙරළ අයිනේ ඇති භාවිතයෙන් ඉවත් කරන ලද බෝට්ටු විනාශ කිරීම. | පරිසර කටයුතු භාර ස්ථානාධිපති විසින් වෙරළ අයිනේ ඇති භාවිතයෙන් ඉවත් කරන ලද බෝට්ටු විනාශ කිරීම සඳහා බෝට්ටු අයිතිකරුවන් දැනුවත් කර ඇති බව. | පොලිස් පරික්ෂක එම්.ඩී.මිත්‍රසිරි ද සිල්වා මහතා.. | |
| පටබැඳිමුල්ල වරාය අසල පොදු වැසිකිළිය ආශ්‍රිතව කසල දැමීම | වරාය අසල පොදු වැසිකිළිය කඩා ඉවත් කිරිම සඳහා බැකෝ යන්ත්‍රයත්, එම ඉඩම් කොටසෙහි ආරක්ෂිත වැටක් ඉදිකිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ඇණවුම් කර ඇති බව. | තාක්ෂන සේවා නිලධාරී ජී.සී සජීවනී මිය. | |
| සෞඛ්‍ය පරිපාලක තනතුරුවල පුරප්පාඩු | සෞඛ්‍ය පරිපාලක හිගකම නිසා දෛනික රාජකාරි ඉටු කිරීම අපහසු බව | මහජන සෞඛ්‍ය පරීක්ෂක පී.එස්.එස්.ද සිල්වා මහතා. | මේ පිළිබඳව සභාපතිතුමා විමසිම |
| ගාලු පාරේ ASB අසල මාර්ග සංවර්ධන අධිකාරිය සතු කාණු පද්ධතියේ | මේ සම්බන්ධව මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ලිපියක් යවා ඇති බව. | සංවර්ධන සහකාර පී එච්. එල්. සි පුෂ්පරාණි. | සිහි කැඳවීම් ලිපියක් යැවීම |

| | | | |
|---|---|---|---|
| ජලය රැදී පැවතීම. | | | |
| ට්‍රැක්ටර් ප්‍රමානවත් නොවන බව | ට්‍රැක්ටර් ප්‍රමානවත් නොවීම නිසා කසල බැහැර කිරීම ගැටළු සහගත බව | මහජන සෞඛ්‍ය පරීක්ෂක පී.එස්.එස්.ද සිල්වා මහතා. | |
| | ට්‍රැක්ටර් අලුත්වැඩියා කිරීමට අදාල ටයර් ඉල්ලුම් කර ඇති බව. | තාක්ෂණ සේවා නිලධාරී මලිත් ප්‍රනාන්දු මහතා | |
| | ට්‍රැක්ටර් දෙකක් මිල දී ගැනීම සඳහා අවශ්‍ය සභා තීරණ ලබා ගෙන ඇති බවත් මිල ගණන් කැඳවීමට අදාළ නිලධාරිනිය වෙත භාර දී ඇති බව. | නගර සභාවේ ලේකම් භාරත සමරසේකර මහතා. | |
| අයාලේ යන ගවයන් පිළිබඳ ගැටළුව | අයාලේ යන ගවයන් පිළිබඳ ගැටළුවට ගත හැකි ක්‍රියා මාර්ග කුමක්ද යන වග | පොලිස් පරීක්ෂක එම්.ඩී.මිත්‍රසිරි ද සිල්වා මහතා. | |
| | ගවයන් අල්ලා තබා ගත්ත ද අවසානයේ තක්සේරුවේ දී මස්කඩ මුදලාලිට යන බැවින් බොහෝ සභාපතිවරු මේ සඳහා අකමැත්ත පල කරන බව | තාක්ෂණ සේවා නිලධාරී මලිත් ප්‍රනාන්දු මහතා | |
| සුනඛ වන්ද්‍යාකරණ සැත්කම | පෙබරවාරි 24 දිනෙන් පසු නිවෙස්වල ඇති කරන සුනකයන් සඳහා වන්ද්‍යාකරණ සැත්කම පැවැත්වෙන බව. | පරිපාලක මහජන සෞඛ්‍ය පරීක්ෂක එච්. එච් නිහාල් රණසූරිය මහතා | |
| මදුරු කීටයන් බෝවන ස්තානවල ගප්පි බෝ කිරීම | ඩෙංගු මදුරුවන් බෝවන ස්ථානවල ගප්පි හා ගුරාමි බෝ කිරීමට අවශ්‍ය මසුන් ප්‍රමාණය තමාට ලබා දිය හැකි බව. | තාක්ෂණ සේවා නිලධාරී මලිත් ප්‍රනාන්දු මහතා | |
| තල්ගස්ගොඩ මාර්ගය දෙපස වල් බිහි වී තිබීම නිසා මාර්ග අනතුරු සිදු වීම. | තල්ගස්ගොඩ දළුක්කන්ද පන්සලට හැරෙන ස්ථානයේ සිට ඩිපෝව දෙසට මාර්ග කොටස කැලේ වැවී ඇති බැවින් මාර්ග අනතුරු සිදුවීම. | තල්ගස්ගොඩ ග්‍රාම නිලධාරී කේ. ඒ. එච් කරුණාවර්ධන මහතා. | මේ පිළිබදව මාර්ග සංවර්ධන අධිකාරිය වෙත දන්වා යැවීම. |
| තල්ගස්ගොඩ පාලම අසල වම්පස බිම් කොටස අනාරක්ෂිත බව. | තල්ගස්ගොඩ පාලම අසල වම්පස බිම් කොටසෙහි අනාරක්සිත බව නැති කිරිම සඳහා වැටක් ඉදිකිරිම. | තල්ගස්ගොඩ ග්‍රාම නිලධාරී කේ. ඒ. එච් කරුණාවර්ධන මහතා. | තාක්ෂණ සේවා නිලධාරී අවශ්‍ය කටයුතු ඉටුකිරීම. |

| | | | |
|---|---|---|---|
| ස්ථාන කිහිපයක ස්ලැබ් කැලි කැඩී ඇති බව | 1.කොඩිකාර පෙදෙසට හැරෙන ස්තානය.<br><br>2.කලුවඩුමුල්ල පන්සල පහළ පඤ්ඤාලෝක මාවත ආරම්බ වන ස්ථානය.<br><br>3.පිරිස් වෙද මාවතේ ග්‍රාමිණී විද්‍යාලය ආරම්බ වන ස්ථානය.<br><br>4.ග්‍රාමිණී විද්‍යාල මාවතේ ග්‍රාමිණී විද්‍යාලය අසල | කළුවඩුමුල්ල ග්‍රාම නිලධාරී පී. එච්. කුමාර ද සිල්වා මහතා. | තාක්ෂණ සේවා නිලධාරී අවශ්‍ය කටයුතු ඉටු කිරීම |
| පෝරොක් ඇලෙහි වැලි පිරී පැවතීම | මාර්ග සති පාරට සමාන්තරව ඇති ඇල මාර්ගයේ වැලි පිරී පැවතීම නිසා ජලය බැස නොයාම. | ග්‍රාම නිලධාරී පී.එච්.කුමාර ද සිල්වා මහතා | වැලි ගොඩ දමා සංවර්ධන කටයුතු සඳහා යොදා ගැනීම. |
| ස්තුති කතාව | අද දින කමිටුව සඳහා සහභාගී වූ සියළුම මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතුන්ටත්, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන්ටත්, ග්‍රාම නිලධාරී මහත්ම මහත්මීන්ටත්, නගර සභා කාර්ය මණ්ඩලයටත් ස්තුතිය පුද කරන බව. | සංවර්ධන සහකාර පී.එච්.එල්.සී පුෂ්පරාණි මිය | |
| නිමාව | ප.ව 4.30 ට | | |

සකස් කළේ -
පී.එච්.එල්.සී.පුෂ්පරාණි
සංවර්ධන සහකාර (පරිසර)

ලේකම්
භාරත සමරසේකර

**ඒ අනුව 2015.02.19 දින පවත්වන ලද පරිසර සෞඛ්‍ය හා සනීපාරක්ෂක වාර්තාව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**6: 4** 2015.02.26 වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද කළමණාකරන කමිටු රැස්වීම් වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නගර සභා මන්ත්‍රී එච්.එල්.අනුර කිත්සිරි මහතා විසින් ස්ථිර කරන ලදී.

අම්බලන්ගොඩ නගර සභාව

කළමණාකරන කමිටු රැස්වීම් වාර්තාව

දිනය - 2015.02.26 වේලාව - ප.ව.2.30

ස්ථානය - නගර සභා රැස්වීම් ශාලාව

පැමිණීම

12. භාරත සමරසේකර මහතා,ලේකම්,නගර සභාව ,අම්බලන්ගොඩ.
13. ඩී.ඩබ්. පත්මසිරි මහතා - ගණකාධිකාරී, නගර සභාව , අම්බලන්ගොඩ.
14. එම්.ජී.ආර්.පුෂ්පකුමාර මහතා - සංවර්ධන සහකාර, නගර සභාව , අම්බලන්ගොඩ.
15. එස්.ජී.සජීවනී මිය - තාක්ෂන නිලධාරී , නගර සභාව , අම්බලන්ගොඩ.
16. පී.එස්.එස්. ද සිල්වාමහතා - මහජන සෞඛ්‍ය පරීක්ෂක , නගර සභාව ,අම්බලන්ගොඩ
17. වයි.ජී.සිතාර මංජුල මහතා ,ආදායම් පරිපාලක, නගර සභාව, අම්බලන්ගොඩ.
18. ජී.එච්.සී.ප්‍රියන්ති මෙනවිය - පුස්තකාල සහායිකා , නගර සභාව, අම්බලන්ගොඩ.
19. ආර්. සුසිලා නන්දනී මිය - කළමණාකරණ සහකාර, නගර සභාව, අම්බලන්ගොඩ.

නගර සභා ලේකම් භාරත සමරසේකර මහතා විසින් පැමිණ සිටි සියළු දෙනා පිළිගනිමින් රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදි.

පසුගිය කමිටු රැස්වීමේ තීරණ පිළිබඳව විමසනු ලදුව පහත පරිදි එහි ප්‍රගතිය වාර්තා කරන ලදි.

1. ආදාහනාගාරයේ අළුත්වැඩියාව සඳහා 2015.03.02 දින පැමිණෙන බව තාක්ෂන සේවා නිලධාරි විසින් දන්වන ලදි.
2. කර්මාන්ත අංශයේ රාජකාරි කටයුතු බෙදාදීම කොට්ඨාශ අනුව සිදුකිරීම හා එක් එක් කමිටු බෙදාදීම සඳහා යෝජනාව සභාපතිතුමා වෙත ප්‍රධාන කළමණාකරන සහකාර විසින් සකස් ඉදිරිපත් කිරීමට නිර්දේශ කරන ලදි.
3. මාර්ග ඉන්වෙන්ට්‍රිය සකස් කර ගැසට් කිරීම සංවර්ධන නිලධාරි එම්.ඩබ්.අර්.දිල්රුක්ෂි මිය වෙත පැවරීමට කමිටුව නිර්දේශ කරන ලදි.
4. සෞඛ්‍ය අංශයට ට්‍රැක්ටර් මිළ දී ගැනීම සඳහා ටෙන්ඩර් දැන්වීම් සකස් කරගෙන යන බව ගණකාධිකාරි විසින් දන්වන ලද අතර මේ සඳහා වන මිළ ගණන් කාලයත් සමග වෙනස්වීම් වලට ලක් විය හැකි බැවින් අවශ්‍ය අරමුදල් සපයා ගන්නා ආකාරය පිළිබඳව සොයා බැලිය යුතු බව ද දන්වන ලදි. එසේ නොවුනහොත් මිළ ගණන් කැඳවීම හා ටෙන්ඩර් කටයුතු නිෂ්ඵල එකක් වනු ඇති බව ද පෙන්වා දෙන ලදි.
5. කසල බැහැරලන ස්ථානයේ පිවිසුම් මාර්ග සකස් කර ඇති බව තාසේනි විසින් දන්වන ලදි.
6. ජාතික කියවීමේ මාසය වෙනුවෙන් සම්මාන ලබා ගැනීමට දායක වූ නිලධාරීන් ට ප්‍රසංසා සහතික ලබා දීමේ කටයුතු සකස් කරමින් පවතින බව ප්‍රධාන කළමණාකරන සහකාර නිලධාරිණිය පවසන ලදි.
7. පොල්වත්ත පෙරපාසලේ මේ වසරට ළමුන් නොමැති වීම නිසා පෙරපාසල් පාලිකාව වෙනත් රාජකාරි කටයුත්තක් සඳහා යෙදවීම කළ යුතු බවට කමිටුව නිර්දේශ කරන ලදි.

ඉන්පසුව එක් එක් අංශය පිළිබඳව සාකච්ඡා කරන ලදි.

<u>ආයතන අංශය</u>

නිවාඩු ලේඛනය සම්පූර්ණ කිරීම පසුගිය කාලය තුල නිවැරදිව ඉටු නොවීම මත ගැටළු මතුවී ඇති බව ප්‍රධාන කළමණාකරන සහකාර නිලධාරී නිර්මලා මිය විසින් දන්වන ලදි. නිවාඩු ඉල්ලුම් පත් ලබා නොදී ඇති අයට වැටුප්රහිත නිවාඩු සේ සලකා කටයුතු කරන බව දන්වා ලිපියක් නිකුත් කරන ලෙස කමිටුව නිර්දේශ කරන ලද.

<u>ආදායම් අංශය</u>

ආදායම් පරිපාලක සිතාර මංජුල මහතා විසින් අදහස් දක්වමින් අනවසර වෙළඳාම් සඳහා රාජකාරි සිදු කිරීමේදී ගැටළු මතු වි ඇති බවත් මීට පෙර මාළු ලෑලි ආදිය පොලිසියත් සමග ගොස් රැගෙන ආ බවත් පවසන ලදි.වෙන්දේසි කටයුතු හා අනෙකුත් රාජකාරී සමග වරිපනම් එකතු කිරීමේ කටයුතු ඉටු කරන බව ද පවසන ලදි. ගණකාධිකාරි අදහස් දක්වමින් වෙන්දේසි හා ආදාහනාගාරයේ යකඩ බඩු පිළිබඳව වාර්තාව සභාවට යොමු කරන ලෙස දන්වන ලදි.

ගෑස් කාමරය ලීයෙන් සකස් කර ඇති බැවින් මේ පිළිබඳව සොයා බලා වර්තාවක් ලබා දෙන ලෙස තාසේනි වෙත දන්වන ලදි.

**ගිණුම් අංශය**

ගණකාධිකාරී ඩී.ඩබ්. පත්මසිරි මහතා අදහස් දක්වමින් මේ වන විට ගෙවීමට තිබූ ණය වලින් රු.1000 ට අඩු ණය ගෙවා අවසන් බවත් ඉන් ඇත්තේ එක් ණය ගෙවීමක් පමණක් බවත් පවසන ලදි. ඊට අමතරව ගෙවීමට ඇති ණය ප්‍රමාණයේ අඩුවීමක් මේ වන විට පෙනෙන බවත් එයට හේතුව වරිපනම් ආදායම මේ දිනවල ලැබුණු නිසා බවත් පවසන ලදි. එසේම තව දුරටත් ගෙවිය යුතු ණය පිළිබඳ විස්තරයක් දැන ගැනීම සඳහා මේ සමග ඉදිරිපත් කරන බව ද පවසන ලදි. ඒ අනුව ගෙවීමට ඇති රු 10000 ට වැඩි වවුචර් වල වටිනාකම රු. 3446776.71 ක් බවත්, ගෙවීමට ඇති බිල්පත් වල වටිනාකම රු.302083.28 ක් බවත් , ගෙවීමට ඇති රු.10000 ට අඩු වව්චර් වල වටිනාකම රු. 1000ක් බවත් පවසන ලදි.

තව දුරටත් ගණකාධිකාරි සඳහන් කළේ ලේඛණාගාරයේ තිබෙන රාජකාරි ලේඛණ ඉතා අබලන්ව තිබෙණ බව නිරීක්ෂනය වූ බවත් ඉතා මෑතකදී ලේඛනාගාරයට යවන ලද ලේඛන ද සතුන් කා තිබෙන බව නිරීක්ෂනය වූ බවත් මේ සඳහා ඉතා ඉක්මනින් තීරණයක් ගන්නා මෙන් ඉල්ලීමක් කරන ලදි. ලේඛණාගාරයට යකඩ කබඩ් දෙකක් මිළ දී ගැනීමටත් ඒවා සුදුසු ස්ථානයක ස්ථානගත කිරීමටත් නිර්දේශ කරන ලදි.

ශරිර සුවතා මධ්‍යස්ථානයේ මුදල් අය කිරීම සඳහා රිසිට් පොත් භාහිර පුද්ගලයෙකුට ලබාදීම අවධානම් බැවින් කාර්යාලයට මුදල් ගෙවීම වඩාත් සුදුසු බව පෙන්වාදෙන ලදි.

එසේම අවසාන ගිණුම් සකස් කිරීම පිළිබඳ පුහුණුව සඳහා නිලධාරීන් තුන් දෙනෙකු වක්වැල්ල පුහුණු ආයතනය වෙත යවා ඇති බවත් , මේ සඳහා 8 දෙනෙකු නම් කර ඇති බවත් මේ නිලධාරීන් මේ දිනවල අවසන් ගිණුම් පිළිබඳ අවබොධයක් ලබා ගතයුතු බවත් පවසන ලදි.

අයවැය ලේඛණ සකස් කිරීම සඳහා විශේෂ පුහුණුවක් ලබා දී ඇති නිලධාරීන් දෙදෙනෙකු සිටින බවත් එනම් පරිගණක කටයුතු කරන නිලාන්ති මහත්මිය හා කළමණාකරන සහකාර චමිලා හර්ෂනී මහත්මිය යන දෙදෙනා ට පරිගණක ගත අයවැය ලේඛන ය සකස් කිරීම සඳහා විශේෂ පුහුණුවක් ලබා දී ඇති බවත් මේ නිලධාරීන් 2016 අයවැය ලේඛණය සකස් කිරීමේ කටයුතුඉටු කළ යුතු බවත් දන්වන ලදි. මුලිකවම විෂය ගොනුව පවත්වාගනිමින් එහි භාරකත්වය තොරතුරු තාක්ෂනසහකාරනිලාන්ති මියට පැවරීම කළයුතු බවත් මේ සම්බන්ධයෙන් වෙනම සාකච්ඡාවක් පැවැත්වෙන බවත් දන්වන ලදි.

**කර්මාන්ත අංශය**

තාසේනි සජීවනි මහත්මිය අදහස් දක්වමින් වැඩපරිපාලක වරුන් විශ්‍රාම යාමට නියමිත් බැවින් ඒ සඳහා කටයුතු කළ යුතු බව පවසන ලදි. සැපයුම් කරුවන් ගල් සඳහා ලියිපදිංචි කිරීම පිළිබඳව සාකච්ඡා කළ අතර මේ සම්බන්ධයෙන් වාර්තාවක් තාසේනි විසින් ඉදිරිපත් කිරීමට කමිටුව නිර්දේශකරන ලදි.

**සෞඛ්‍ය අංශය**

මසෞප සංජීව මහතා අදහස් දක්වමින් කියා සිටියේ කසල සඳහා යෙවීමට ඇති ට්‍රැක්ටර් අළුත්වැඩියාවන් සිදු කළ ද නිතර නිතර කැඩෙන බවත් මේ සමබන්ධයෙන් තීරණයක් ගන්නා ලෙසත් , වැඩ පරීක්ෂක වරුන් 4 ක් සිටි බවත් දැනට දෙදෙනෙකු ගෙන් කටයුතු කරන බවත් පුරප්පාඩු සඳහා ඉක්මනින් විසඳුමක් ලබා දෙන ලෙසත්ය.

විශේෂ ව්‍යාපෘතිය සඳහා සේවකයන් 15 දෙනෙකු යෙදවීම පිළිබඳව සාකච්ඡා කළ අතර මසෞප විසින් වාර්තාවක් ලබා දෙන ලෙස කමිටුව නිර්දේශ කරන ලදි.

**ප්‍රජා සංවර්ධන අංශය**

පුස්තකාලය සඳහා රු. 50000 ක පොත් මිළදී ගැනීමට 27 වෙනිදා කටයුතු කරන බව පුස්තකාල සහායිකා ව පවසන ලදි.

ගණකාධිකාරී ඩී.ඩබ්.පත්මසිරි මහතා විසින් ස්තුති කථාව කරමින් පැමිණි සියළු දෙනාට ස්තුතිය ප්‍රකාශ කිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු අවසන් කරන ලදි.

සකස් කළේ : එම්.ජී.ආර්. පුෂ්පකුමාර
සංවර්ධන සහකාර

ලේකම් / නීතිඥ ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප්
අම්බලන්ගොඩ නගර සභාව / සභාපති
නගර සභාව අම්බලන්ගොඩ

**ඒ අනුව 2015.02.26 දින පවත්වන ලද කළමණාකරන කමිටු රැස්වීම් වාර්තාව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**6: 5** 2015.02.25 වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද ක්‍රීඩා කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්.හාෂිණී මෙනුකා විජේසූරිය මහත්මිය විසින් ස්ථිර කරන ලදී.

<u>ක්‍රීඩා කමිටු වාර්තාව - අම්බලන්ගොඩ නගර සභාව</u>

දිනය - 2015.02.25
වේලාව - ප.ව 2.30
ස්ථානය - නගර සභා රැස්වීම් ශාලාව
සහභාගිත්වය

| | | |
|---|---|---|
| 01. | අරුණ ප්‍රදීප් මනිමෙල් වඩු මහතා - | ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව |
| 02. | දසන් නයිදුවාවඩු මහතා - | සිංහ ක්‍රීඩා සමාජය |
| 03. | සරත් ශාන්ත මහතා - | ක්‍රීඩා කමිටු සාමාජික |
| 04. | ෂර්ලි චන්ද්‍රසිරි මහතා - | ක්‍රීඩා කමිටු සාමාජික |
| 05. | එන්.එච්.විරාජ් චාමින්ද මහතා - | ක්‍රීඩා ආචාර්ය, ගා/ධර්මාශෝක විද්‍යාලය |
| 06. | ජී.අශෝක කුමාර මහතා - | ක්‍රීඩා භූමි උපදේශක |
| 07. | ජී.සී.සජීවනි මිය - | තාක්ෂණ නිලධාරි |
| 08. | එම්.ජී.ආර්.පුෂ්පකුමාර මහතා - | සංවර්ධන නිලධාරි |

**පිළිගැනීම- අරුණ ප්‍රදීප් මනිමෙල් වඩු මහතා, ගරු සභාපති**

ක්‍රීඩා කමිටුව සඳහා පැමිණි සියළුම මහත්ම මහත්මීන් පිළිගනිමින් ක්‍රීඩා කමිටුවේ කටයුතු ආරම්භ කරන ලදි.

පසුගිය කමිටුවේ සාකච්ඡා කරන ලද කරුණු සමාලෝචනය කිරීම
පොල්වත්ත ක්‍රීඩා පිටියේ ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකිරීම.

**ජී.අශෝක කුමාර මහතා,ක්‍රීඩා භූමි උපදේශක**

**ක්‍රීඩා පිටියේ සෑදී ඇති වළවල් වැසීමට අවශ්‍ය පස් ගෙන්වා ඇති අතර එම පස්තුනි කිරීමට හා වළවල් වැසීම තවම සිදුකර ගැනීමට නොහැකි වූ බව.**

**අරුණ ප්‍රදීප් මනිමෙල් වඩු මහතා, ගරු සභාපති**

**ක්‍රීඩා පිටියට යොදවා ඇති සේවකයා ක්‍රීඩා පිටියේ කටයුතු සඳහා දෛනිකව යොදවන ලෙස හා එම සේවකයා මගින් අදාළ කාර්යය ඉටුකරගන්නා ලෙසට උපදෙස් ලබා දීම.**

**සරත් ශාන්ත මහතා**

**ක්‍රීඩා පිටියේ වැසිකිළි පහසුකම් ප්‍රමාණවත් නොවන බව දැන්වීම. හා Big match වලට පෙර ප්‍රධාන ක්‍රීඩාංගණයේ තණ කොල කැපීම ඇතුළු ක්‍රීඩා මණ්ඩපයේ සිදු කළ යුතු අළුත් වැඩියා කටයුතු සිදු කරදෙන ලෙසට ඉල්ලීම.**

**අරුණ ප්‍රදීප් මනිමෙල් වඩු මහතා, ගරු සභාපති**

**ක්‍රීඩා පිටියේ වැසිකිළි පහසුකම් ඇති කිරීම සම්බන්ධයෙන් වාර්තාවක් හා Big match වලට පෙර ක්‍රිඩා පිටියේ සිදු කළ යුතු අළුත් වැඩියා කටයුතු වලට ආදාල ඇස්තමේන්තුව සභාවට ඉදිරිපත් කිරීමට තාක්ෂණ නිලධාරිට උපදෙස් ලබා දීම.**

**"බර වාහන නැවැත්වීම තහනම්" දැන්වීමක් කන්ද ළමා උද්‍යානය අසළ සකස් කිරීම.**

**මාර්තු මාසයේ සිට ක්‍රිඩා පිටිය වෙන්කිරීම සිදුකිරීම.**

**හා කායවර්ධන මධ්‍යස්ථානය සඳහා අවශ්‍ය උපකරණ ලබා දීමට උපදෙස් ලබා දෙන ලදි.**

ස්තූති කථාව- එම්.ජී.ආර්.පුෂ්පකුමාර, සංවර්ධන නිලධාරි

අද දින තම වටිනා කාලය වැය කරමින් ක්‍රීඩාවේ උන්නතිය උදෙසා අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීමට පැමිණීම සම්බන්ධයෙන් ස්තූතිය පළකරමින් කමිටුවේ වැඩ කටයුතු අවසන් කරන ලදි.

සකස් කළේ-
එම්.ජී.ආර්.පුෂ්පකුමාර,
සංවර්ධන නිලධාරි.

ලේකම්,
අම්බලන්ගොඩ නගර සභාව

<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා කතා කරමින්</u>

මේ ක්‍රීඩා පිටියේ තත්වය කුමක්ද සභාපතිතුමා.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ඒක ප්‍රධාන ලේකම්තුමා තමයි ගිවිසුම් අත්සන් කරලා තිබුණේ.20% ක ඇඩ්වාන්ස් එකකුත් ගෙවලා තියෙනවා.මං හිතන්නේ නව ආණ්ඩුවෙන් සල්ලි දෙන එකක් නෑ.මේක ලබා දීලා තියෙන්නේ පලාත් නැඟුම කියන වෝට්

එකකින්.ඒ චෝට් එක මං හිතන්නේ අලුත් ආණ්ඩුවෙන් කපා හැරලා තියෙන්නේ.මේ සම්බන්ධයෙන් අපි විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ සහයෝගය බලාපොරොත්තු වෙනවා.මේ මුදල් ලබා ගෙන නගරයේ ජනතාව වෙනුවෙන් සේවය කරන්න කියලා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්.ජයන්ත මහතා කතා කරමින්</u>

සභාපතිතුමණි,ඔබතුමා ආරාධනයක් කරලා තිබුණා මේ පිට්ටනිය හදන්න බලන්න කට්ටියක් එනවා.එනිසා එන්න කියලා.මමත් ආවා.ඒක හොඳ දෙයක් නිසා.අපි මේ සබාවෙත් ඒක අනුමත කරලා යම් යම් උපදෙස් ලබා දුන්නා.නමුත් තමුන්නාන්සේ මේ ආන්ඩුවට දොස් කියලා වැඩක් නෑ.අපි කීවා අප්‍රේල් මාසේ හරි අගෝස්තු මාසේ හරි පිට්ටනියේ කිසිම දෙයක් කරන්නෑ.එනිසා වැඩ පටන් ගමු කියලා තමයි තිබුනේ.අපි කීවා ඒකට අපි එකඟයි.දෙසැම්බර් මාසේ වෙනකොට මේක ඉවර කරමු කියලත් තිබුණා.නැ.ිනම් අවිච්ඡේද වෙනවා කියලා.ඒ වෙනකොට අපි සබාවේ තීරණයක් අරගෙන තිබුනා පිට්ටනිය කාටවත් දෙන්නෑ ක්‍රීඩා තරඟ වලට අවශ්‍ය අයට වෙන තැනකට යන්න කියනවා කියලා.එතනදී ඒ කටයුත්ත ප්‍රමාද වීම තමයි ප්‍රධානම හේතුව.පලාත් සභාවට දොස් කියලත් වැඩක් නෑ.පළාත් සභාවෙත් ඒ වෙනකොට සල්ලි තිබුනා.එතනදී මේ ක්‍රියාව කාගෙන් හෝ ප්‍රමාද වෙලා මේක අවිච්ඡේද වෙලා තියෙනවනම් ඇයි 20% අරගෙනත් තියෙනවනම් මේක පටන් ගත්තේ නැත්තේ. දැන් මේකේ බෝලේ අපට පාස් කරාට වැඩක් නෑ.අපි ජනවාරි මාසේ 9 වෙනිදා පත් වුනේ අපේ රජයක්.නගරයේ දියුණුව වෙනුවෙන් අපි කොයි වෙලාවෙත් ඉන්නවා.නමුත් ජනවාර් 31 වෙකොට මේක ඉවර කරන්න තිබියේ.මේක පැහැර හැරීම තුළ මේ දේ නැතිවුනයි කියන තැන මම කියන්නේ.විපක්ෂයේ හිටියත් අපි 4 දෙනාම නගරයේ වැඩ වලට එනවා.යන්න ඕන තැනක් තියෙනවනම් තමුන්නාන්සේ අපට කියන්න බලලා.අපි 4 දෙනාම එන්නම් යන්න.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

අම්බලන්ගොඩ ක්‍රීඩාංගනයට අපි මේ මුදල ලබා ගත්තේ විශාල අරගලයක් කරලා.ලක්ෂ 125 නෙවෙයි මම ගන්න හැදුවේ ලක්ෂ 130 ක් ඇස්තමේන්තුව.මේ ඇස්තමේන්තුව ලක්ෂ 100 ට වැඩි නිසා ප්‍රධාන ලේකම් හරහා තමයි මේක ටෙන්ඩර් වුණේ.ටෙන්ඩර් කරුවන් 04 දෙනෙක්ගෙන් බටපොල ප්‍රදේශයේ කෙනෙක්ට තමයි මේක ලැබිලා තියෙන්නේ.මං හිතන විදියට අත්තිකාරමක් ලබාගත්ත කර්මාන්තයක් නතර කරන්න බෑ.20% කියන්නේ ලොකු මුදලක්.මං හිතන්නේ ලක්ෂ 26 ක් විතර වෙනවා.කොන්ත්‍රාත්කරු කීවොත් මේක මට ගෙවන්න බෑ කියලා,ලොකු ගැටලුවක් වෙනවා.එනිසා මම හිතන්නේ ජයන්ත මහත්තයා කීවා වගේ අපි කතා කළොත් මේක ගන්න පුලුවන් වෙයි.ඒ වගේම තල්ගස්ගොඩ ක්‍රීඩාංගනයට ලක්ෂ 25 ක් දුන්නා.දැන් ඒකත් නවත්වලා තියෙන්නේ.එනිසා අපි ඉල්ලා සිටිනවා,දැන් ඔබතුමාලගේ රජයක් තියෙන්නේ.එනිසා මේ අම්බලන්ගොඩ නගරයට ලැබුණ මුදල් කතා කරලා ලබා ගන්න කටයුතු කරන්න කියලා ඉල්ලනවා.තල්ගස්ගොඩ ක්‍රීඩාංගනයේ මුදල නැතත් ,මොකද තල්ගස්ගොඩ එකට ගිවිසුම් අත්සන් කරලා වුණත් අත්තිකාරම් ලබාගෙන නෑ.එනිසා මේ පිට්ටනියට අත්තිකාරනුත් ලබා දීලා තියෙන නිසා මේක ආරම්භ කරන්න පුලුවන් වෙයි.එනිසා ජයන්ත මහතා විශේෂයෙන් මූලික වෙලා මේ මුදල ලබා ගන්න කටයුතු කරන්න කියලා ඉල්ලනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්.ජයන්ත මහතා කතා කරමින්</u>

පනියන්දූවේ පාලමක් හදනවා.දැන් ඒකේ තත්වය මොකක්ද?

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

වැඩ ආරම්භ කරලා තියෙන්නේ.

<u>ගරු නගර සභා මන්ත්‍රී එච්.එල්.අනුර කිත්සිරි මහතා කතා කරමින්</u>

අපේ සංවර්ධන කටයුතු දැවැන්තවම අඩාල වෙලා තියෙනවා මේ අවස්ථාවේදී.මෙහිදී විශේෂ අවධානයක් යොමු කරලා අම්බලන්ගොඩ නගරයේ පවතින සංවර්ධන අවස්ථා ගැන කරුණු අහන්න අපට මේ අවස්තාවේදී සිද්ධ වෙලා තියෙන්නේ මුළු රාජ්‍ය අංශයට අක්‍රීය තත්වයට පත්වෙලා තියෙනවා මේ අවස්තාවේ.අද අම්බලන්ගොඩ නගරයේ ක්‍රීඩා භූමිය ආශ්‍රිත සංවර්ධන කටයුත්ත විතරක් නෙවෙයි,මම මීට පෙර අවස්ථාවේ යොමු කළ ගාලු පාර පුලුල් කිරීමේ සංවර්ධන කාර්යය සහ ඊට අමතරව ප්‍රාදේශිය මට්ටමේ සියලුම සංවර්ධන කටයුතු පිලිබඳව අවධානය යොමු විය යුතු කටයුතු තියෙනවනම් අපට ඒ සම්බන්දයෙන් පක්ෂ විපක්ෂ භේදයක් නැතිව ඉල්ලීමක් කරන්න පුලුවන් නම් ඒ බල අධිකාරීයේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.ඒ වගේම මහ නැඟුම,ගම නැඟුම, ජාතික සවිය වගේ සියලුම සංවර්ධන කටයුතු අපි හරහා නොකෙරුණත් ,මම ඉල්ලීමක් කරනවා විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් එතුමන්ලා හරහා හරි මේ දේවල් කරන්න කියලා.නැතිනම් මේ මාස කීපය ඉනික්බිතිව අපට විශාල අගාධ තත්වයකට වැටෙන්න ඉඩ තියෙනවා.මොකද අපේ ගමේ මිනිසුන්ගේ

බලාපොරොත්තු සුන් වෙනවා මේ දේත් එක්ක.එනිසා නගරයේ ජනතාවගේ ඉල්ලීමක් වශයෙන් මම මෙය විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

දැන් තියෙන තත්වය බැරෑරුම් තත්වයක් ඇත්තටම.පසු ගිය රජයෙන් විශාල වශයෙන් මුදල් සංවර්ධන කටයුතු සඳහා රජයේ ආයතන හරහා ජනතාවට ලබා දුන්නා.හැම ගමකටම ලක්ෂ 10 ක මුදලක් ග්‍රාමසේවා කොට්ඨාශ මට්ටමින් දීලා තියෙනවා.එනිසා මන්ත්‍රීවරයෙක් සිටියත් නැතත් විශාල වැඩ කොටසක් ඒ ගම් වල කෙරුණා.පනියන්දුව පාලමට ගමින් ගමට දොරින් දොරින් දොරට වැඩ සටහනෙන් ලක්ෂ 55 ක් ලබා දුන්නා.පළාත් නැඟුම යටතේ තමයි ක්‍රීඩා පිටිය සංවර්ධනය කරන්න ලක්ෂ 130 ලබා දුන්නා.තල්ගස්ගොඩ ක්‍රීඩාංගනයට ලක්ෂ 25 ක් දුන්නා.දැන් නව රජයත් සමඟ මේ සංවර්ධන කටයුතු සඳහා ලැබෙන මුදල් නොලැබී යන තත්වයක් උදාවෙලා තියෙනවා.මං හිතන්නේ අපේ විපක්ෂයේ මන්ත්‍රීවරුත් මේ ගැන කල්පනා කරලා බලලා අවධානය යොමු කරන්න ඕන තැන් වලට අවධානය යොමු කරනවනම් ,මොකද මේ දේවල් කවුරු හිටියත් කරන්න ඕන දේවල්.එනිසා යහ පාලනයකට යන මේ වේලාවේ මේ ගැන අවධානය යොමු කරන්න කියලා ඉල්ලනවා.

**ඒ අනුව 2015.02.25 වන දින පවත්වන ලද ක්‍රීඩා කමිටු වාර්තාව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

## (07) ටෙන්ඩර් හා මිළ ගණන්

**7 ටෙන්ඩර් හා මිළ ගණන් (-**

7:1 **ටෙන්ඩර් (-** නැත

**7:2 මිළ ගණන් (-**

**7:2:1 වාහන අමතර කොටස් සඳහා මිළ ගණන් කැඳවන ලද අතර තාක්ෂණ සේවා නිළධාරීගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිළ ගණන් අතරින් අවම මිළ ගණන් පිළිගැනීමට ගරු සභාව තීරණය කරන ලදී.**

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | A.C.paul and Co.Ltd | K.R.S.Trade Centerf | Galle Motors |
|---|---|---|---|---|---|
| 01 | Tor 4 Wrench 20-200 nm Ampro | 01 | 19900.00 | 14100.00 | මිළ ගණන් |
| 02 | 08-32 py Prox Soch Gate | 01 | 7945.00 | 5850.00 | ලැබී නැත. |

**7:2:2 ගබඩාවට ගල් මිලදී ගැනීම සඳහා මිළ ගණන් කැඳවන ලද අතර තාක්ෂණ සේවා නිළධාරීගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිළ ගණන් අතරින් අවම මිළ ගණන් පිළිගැනීමට ගරු සභාව තීරණය කරන ලදී.**

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | කේ.කේ.සුමිත් ප්‍රියන්ත මෙන්ඩිස් | බී.ඒ.කාන්ති | ගයාන් ක්‍රිෂාන්ත සිරිමාන්න |
|---|---|---|---|---|---|

| | | | | | |
|---|---|---|---|---|---|
| 01 | 6’’ x 9’’ ගල් | | 2150.00 | මිළ | 2200.00 |
| 02 | 6’’ x 4’’ ගල් | | 2500.00 | ගණන් | 2700.00 |
| 03 | 1 ½ ‘’ x 1 ½ ‘’ ගල් | | 4150.00 | ලැබී | 4200.00 |
| 04 | ¾’’ x ¾’’ ගල් | | 4500.00 | නැත | 4500.00 |
| 05 | ABC මිශ්‍රණය | | 4750.00 | | 4800.00 |
| 06 | ගල් කුඩු | | 4800.00 | | 5000.00 |
| 07 | ¼ ‘’ x ¼ ‘’ චිප්ස් ගල් | | 5500.00 | | 5200.00 |

**7:2:3** තීන්ත සහ පීලි මිලදී ගැනීම සඳහා මිළ ගණන් කැඳවන ලද අතර තාක්ෂණ සේවා නිළධාරීගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිළ ගණන් අතරින් අවම මිළ ගණන් පිළිගැනීමට ගරු සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | **BKS** හාඩ්වෙයාර් | පූර්ණ හාඩ්වෙයාර් | නිව් ජේන්ට් සෙන්ටර් |
|---|---|---|---|---|---|
| 01 | සුදු එමල්ෂන් | 20 L | 16341.00 | 11224.00 | 13890.00 |
| 02 | තද නිල්වෙදර් ෂීල්ඩ් | 08 L | 8040.00 | 6112.00 | 7557.00 |
| 03 | එනමල් රෝස 4 **L** | 04 L | 3624.00 | 2750.00 | 3406.00 |
| 04 | එනමල් නිල් | 04 L | 3624.00 | 2750.00 | 3406.00 |
| 05 | බේබි පින්ක් ඉමල්ෂන් | 12 L | 9669.00 | 6696.00 | 8069.00 |
| 06 | එනමල් ග්‍රේ කලර් | 04 L | 3624.00 | 2750.00 | 3406.00 |
| 07 | අළු- වෙදර්ෂිල්ඩ් | 08 L | 8040.00 | 3056.00 | 7557.00 |
| 08 | වාර්නිෂ් | 08 L | 7968.00 | 2676.00 | 7038.00 |
| 09 | ග්‍රීන් නෙට් 4’’-0 | රෝල් 02 | - | - | - |
| 10 | 8’-0’ x 4’ -0’ වැනිස්ටා බෝඩ් | 9 mm | 2275.00 | - | - |
| 11 | 8’-0’ x 4’ -0’ වැනිස්ටා බෝඩ් | 12 mm | 2975.00 | - | - |
| 12 | 8’-0’ x 4’ -0’ පෝමිකා ෂීට් | 01 | - | - | - |
| 13 | පී.වී.සී.වැහි පීලි දිග් අඩි 100 | | 585.00 | - | - |
| 14 | පීලි බ්‍රැකට් | 01 | 27.50 | 22.00 | - |
| 15 | ¾’ x 8’ ස්කුරුප්පු ඇණ - යකඩ | 300 | 1.30 | 1.50 | - |
| 16 | ¾’ x 8’ ස්කුරුප්පු ඇණ - පිත්තල | | 10.75 | 7.00 | - |
| 17 | එන්ඩ් කැප් | 02 | 50.00 | 50.00 | - |

| | | | | | |
|---|---|---|---|---|---|
| 18 | සෝල්කඩ් ගම් | 125 g | 278.00 | 236.00 | - |
| 19 | ඉබි යතුරු 3'' | 25 | - | 48.00 | - |
| 20 | වෙල්ඩින් කූරු නො.10 | 1 KG | 240.00 | 230.00 | - |
| 21 | වෙල්ඩින් කූරු නො.12 | 1Kg | 240.00 | 230.00 | - |

**7:2:4** යතුරු පුවරු මිලදී ගැනීම සඳහා මිළ ගණන් කැඳවන ලද අතර ගණකාධිකාරීගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිළ ගණන් අතරින් අවම මිළ ගණන් පිළිගැනීමට ගරු සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | ඔමැක් ටෙක්නොලජී | ටියුලිප් කම්පියුටර් | එස්.එල්.ජේ.කම් පියුටර්ස් |
|---|---|---|---|---|---|
| 01 | Prolink Key Board | | 900.00 | | |
| 02 | Delux Key Board | | 800.00 | 650.00 | |
| 03 | Pen drive 08 GB | | 700.00 | 600.00 | 900.00 |
| 04 | Pen drive 04GB | | 600.00 | | |
| 05 | Logitech Key Board | | | 1150.00 | |
| 06 | Sinhala Key board | | | | 750.00 |
| 07 | Pen drive 16 GB | | | | 1400.00 |

**7:2:5** වෛරස්ගාඩ් මිලදී ගැනීම සඳහා මිළ ගණන් කැඳවන ලද අතර ගණකාධිකාරීගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිළ ගණන් අතරින් අවම මිළ ගණන් පිළිගැනීමට ගරු සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | ඔමැක් ටෙක්නොලජී | ශීවා කම්පියුටර්ස් | ටියුලිප් කම්පියුටර් | එස්.එල්.ජේ. කම්පියුටර්ස් |
|---|---|---|---|---|---|---|
| 01 | වෛයිරස් ගාඩ් 1 යූසර් | 01 | 1600.00 | - | 1300.00 | - |
| 02 | වෛරස්ගාඩ් 3 යූසර් | 01 | 3000.00 | 3400.00 | | 3300.00 |

7:2:6 පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර මිලදී ගැනීම සඳහා මිළ ගණන් කැඳවන ලද අතර ගණකාධිකාරීගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිළ ගණන් අතරින් අවම මිළ ගණන් පිළිගැනීමට ගරු සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | ඔමැක් ටෙක්නොලජී | වියුලිප් කම්පියුටර් | එස්.එල්.ජේ.කම් පියුටර්ස් |
|---|---|---|---|---|---|
| 01 | Computer | 01 | 41000.00 | 69000.00 | 78500.00 |
| 02 | Hp P 1102 printer Samsung ML 2116 printer prolink 700 C UPS HP jet p2035 Leser printer | 01 | 12300.00 | 12400.00 7500.00 4400.00 | 15000.00 34250.00 |

**7:2:7** කාය වර්ධණ මධ්‍යස්ථානය සඳහා ව්‍යායාම උපකරණ මිළදී ගැනීම සඳහා මිළ ගණන් කැඳවන ලද අතර ඉදිරිපත් වී ඇත්තේ එක් මිළ ගණනක් පමණක් බැවින් තාක්ෂණ සේවා නිළධාරීගේ නිර්දේශය මත නැවත මිළ ගණන් කැඳවීමට ගරු සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | ජාබින් කන්සාල්ටන්සි ප්‍රයිවට් ලිමිටඩ් | ඩොන්සොන් ආයතනය | ඒසර් මාර්කටින් |
|---|---|---|---|---|---|
| 01 | Treadmill | | 413500.00 | ලැබී නැත | ලැබී නැත |

**7:2:8** ව්‍යායාම උපකරණ මිලදී ගැනීම සඳහා මිළ ගණන් කැඳවන ලද අතර තාක්ෂණ සේවා නිළධාරීගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිළ ගණන් අතරින් අවම මිළ ගණන් පිළිගැනීමට ගරු සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | රෝයල් සර්ජිකල් | නිව් ෆයින් ට්‍රේඩින් කම්පැණි |
|---|---|---|---|---|
| 01 | B.P.Meter (Sumbow)<br>B.P. Metert (Zion)<br>B.P. Meter (Mac)<br>B.P.Meter (Geman) | | 4000.00<br>4000.00<br>9000.00 | 6000.00 |

**7:2:9** ව්‍යායාම උපකරණ සඳහා මිළ ගණන් කැඳවන ලද අතර තාක්ෂණ සේවා නිළධාරීගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිළ ගණන් අතරින් අවම මිළ ගණන් පිළිගැනීමට ගරු සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | ඇම්කොම් ප්‍රයිවට් ලිමිටඩ් | එම්ටෙල් ට්‍රොනික්ස් | යුනි ලයින් ඇසෝසියේටස් |
|---|---|---|---|---|---|

| | | | | | |
|---|---|---|---|---|---|
| 01 | Weight Scale | | 3500.00 | 3950.00 | 3750.00 |
| 02 | Gym mat | | 750.00 | 950.00 | 900.00 |
| 03 | Swis ball | | 1600.00 | 1900.00 | 1700.00 |
| 04 | Stop Watch | | 1350.00 | 1750.00 | 600.00 |

## (08) ගෙවීම්

8.1 ඇ. අංක 1189 යටතේ ගබඩාවට භාණ්ඩ මිලදී ගැනීම වෙනුවෙන් එම්.සෙනවිරත්න ප්‍රයිවට් ලිමිටඩ් ආයතනයට සමාගම වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 106450.00 ක මුදලක් ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

අඟ 2 x 2 ට්‍රෙලර් ඇක්සල් 19500 x 03 = 58500.00

ටේලර් ජැක් (හයිඩ්‍රොලික්)15000 x 02 = 30000.00

ටේලර් හිච්(දිව කොටස) 1800 x4 = 7200.00

හයිඩ්‍රොලික් පෙන්ස් 2150 x 5 = 10750.00

=106450.00

8. 2 ඇ. අංක 1190,1191,1192 සහ 1193 යටතේ ගබඩාවට භාණ්ඩ මිලදී ගැනීම වෙනුවෙන් රත්න මෝටර්ස් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු.151110.00 ක මුදලක් ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | |
|---|---|---|
| Over roll packing | = 11700.00 x 01 | = 11700.00 |
| Piston | = 5950.00 x 3 | = 17850.00 |
| Piston sleeve | = 4950.00 x 3 | = 14850.00 |
| Ring set | = 7750.00 x 1 | = 7750.00 |
| Valve | = 975.00 x 6 | = 5850.00 |
| Main bearing set | = 4250.00 x 1 | = 4250.00 |
| Crank bearing set | = 3850 x 1 | = 3850.00 |
| Crank oil seal (R) | = 4950 x 1 | = 4950.00 |
| Crank oil seal (F) | =2750 x 1 | = 2750.00 |

| | | | |
|---|---|---|---|
| Clutch plate | =8750 x 1 | = | 8750.00 |
| Clutch recer | = 2950 x 1 | = | 2950.00 |
| Fronyt rim | =5850 x 2 | = | 11700.00 |
| Rear rim outer | = 18500 x 2 | = | 37000.00 |
| Silastic | =375 x 1 | = | 375.00 |
| Clutch finger set | =4350 x1 | = | 4350.00 |
| Oil filter | = 375 x 1 | = | 375.00 |
| Diesel filter | =375 x 2 | = | 750.00 |
| Radiator hose 4 PC | =3450 x 1 | = | 3450.00 |
| Hose clip | =50 x4 | = | 200.00 |
| Water fan repair kit | =2750 x 1 | = | 2750.00 |
| Valve gupde | = 775 x 4 | = | 4650.00 |
| | | = | 151110.00 |

8.3 ඇ. අංක 1194 යටතේ ගබඩාවට බල්බ් 200 මිලදී ගැනීම වෙනුවෙන් රජයේ වානිජ විවිධ නීතිගත සංස්ථාව වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 98999.00 ක් ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.4 ඇ. අංක 1195 යටතේ ගබඩාවට LP Gas 37.5 kg ප්‍රමාණයේ සිලින්ඩර් 08 ක් මිලදී ගැනීම වෙනුවෙන් අම්බලන්ගොඩ මිලිදු එන්ටර් ප්‍රයිසස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 49920.00 ක් ගෙවීම ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

6240.00 x 08 = 49920.00

8.5 ඇ. අංක 1196 යටතේ ගබඩාවට ක්‍රිකට් කලාලයක් මිලදී ගැනීම වෙනුවෙන් නියෝජ්‍ය ලේකම් (කර්මාන්ත) කුඩා අත්තිකාරම් ගිනුමට ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 33000.00 ක් ගෙවීම ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.6 ඇ. අංක 1197 යටතේ ගබඩාවට ගල් මිලදී ගැනීම වෙනුවෙන් කේ.කේ.සුමිත් ප්‍රියන්ත මෙන්ඩිස් මහතා වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 167000.00 ක් ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | |
|---|---|---|
| (1) චිප් ගල් 14 x 5500.00 | = | 77000.00 |
| (2) 1 ½ ගල් 16 x 3950.00 | = | 63200.00 |
| (3) ¾ ගල් 02 x 4200.00 | = | 8400.00 |
| (4) A.B.C කියුබ් 02 x 4500.00 | = | 9000.00 |
| (5) 6 x 9 ගල් 04 x 2350.00 | = | 9400.00 |

= 167000.00

8.7 ඇ. අංක 1198 යටතේ ගබඩාවට භාණ්ඩ මිලදී ගැනීම වෙනුවෙන් රත්න මෝටර්ස් පුද්ගලික සමාගම වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 58700.00 ක මුදලක් ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

1. Trailer Axcil 26500.00 x 01 = 26500.00
2. Hydrolic Jack 24500.00 x 01 = 24500.00
3. Hors Trailer 3950.00 x 01 = 3950.00
4. Trailer Hitds 3750.00 x 01 = 3750.00

= 58700.00

8.8 ඇ. අංක 1199 යටතේ ගබඩාවට භාණ්ඩ මිලදී ගැනීම වෙනුවෙන් රත්න මෝටර්ස් පුද්ගලික සමාගම වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 30250.00 ක මුදලක් ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

1. Front Tie Rod 1875 x02 = 3750.00
2. Hitch Half Set 26500 x 01 = 26500.00

= 30250.00

- **ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී.ලක්ෂ්මි හේමන්තා සිල්වා මෙනවිය පෙ.ව.10.25 ට පමණ ගරු සභාවට පැමිණෙන ලදී.**

8:9 ඇ. අංක 1202 යටතේ ගබඩාවට LP Gas 37.5 kg ප්‍රමාණයේ සිලින්ඩර් 08 ක් මිලදී ගැනීම වෙනුවෙන් අම්බලන්ගොඩ බිංදුහේවා සේල්ස් අවුට්ලට් ආයතනය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 42480.00 ක් ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.
5310.00 x 08 = 42480.00

**ගරු නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්.ජයන්ත මහතා කතා කරමින්**

සභාපතිතුමණී,ගෑස් මිළ අඩුවෙලානේ තියෙන්නේ.දැන් ගෑස් මිලදී ගන්නේ අඩු වුන මිළටද?

ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

ඔව් අඩු වුණ මිළට.

8:10 අදාළ වවුවරය ඉදිරිපත් කරන ලද මන්ත්‍රීවරුන්ගේ දෙසැම්බර් මසට අදාලව ගමන් වියදම් ලෙස රු.2400.00ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:11 පටබැදිමුල්ල සූසාන භූමියේ අතුරු මාර්ගයේ කුට්ටි ගල් ඇතිරීම හා මල් පාත්ති ඉදිකිරීමේ කර්මාන්තයේ මූලික ගෙවීම වන රු.524788.66 ක් ලේකම්ගේ නිර්දේශය පරිදි අංක 83, හෙප්පුමුල්ල සමඟි ප්‍රජා මණ්ඩලය වෙත ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:12 2015 වර්ෂයේ 1 වන කාර්තුව සඳහා රු.50000.00 ක මුදලක් ලේකම් නිර්දේශයෙන් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:14 නගර සභාව සතු 252 -0730 කැබ් රථය සඳහා 2015 ජනවාරි මස 01-15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 10545.00 ක මුදලක් තාක්ෂණ සේවා නිළධාරීගේ හා ලේකම්ගෙ නිර්දේශය මත , සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:13 අම්බලන්ගොඩ නගර සභාව මඟින් පාලනය වන පුස්තකාලට 2015 ජනවාරි මස සඳහා සපයන ලද පුවත් පත් [illegible]

8:15 [illegible] 2015 [illegible] 01-15 [illegible] , සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින්

ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:16 නගර සභාව සතු නව ඩුම් ට්‍රක් රථය සඳහා 2015 ජනවාරි මස 01-15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 11100.00 ක මුදලක් තාක්ෂණ සේවා නිළධාරීගේ හා ලේකම්ගෙ නිර්දේශය මත , සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:17 නගර සභාව සතු 49-9422 ට්‍රැක්ටරය සඳහා 2015 ජනවාරි මස 01-15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 12447.00 ක මුදලක් තාක්ෂණ සේවා නිළධාරීගේ හා ලේකම්ගෙ නිර්දේශය මත , සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:18 නගර සභාව සතු RA 8796 ට්‍රැක්ටරය සඳහා 2015 ජනවාරි මස 01-15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 10212.00 ක මුදලක් තාක්ෂණ සේවා නිළධාරීගේ හා ලේකම්ගෙ නිර්දේශය මත සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:19 නගර සභාව සතු GL-9369 ගලි බවුසරය සඳහා 2015 ජනවාරි මස 01-15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 16748.00 ක මුදලක් තාක්ෂණ සේවා නිළධාරීගේ හා ලේකම්ගෙ නිර්දේශය මත , සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:20 ඩෙංගු මර්දනය කිරීමට ධූමායනය කිරීම සඳහා 2015 ජනවාරි මස 01-15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 11025.00 ක මුදලක් තාක්ෂණ සේවා නිළධාරීගේ හා ලේකම්ගෙ නිර්දේශය මත , සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:21 නගර සභාව සතු 49-9421 ට්‍රැක්ටරය සඳහා 2015 ජනවාරි මස 16 -31 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 11998.00 ක මුදලක් තාක්ෂණ සේවා නිළධාරීගේ හා ලේකම්ගෙ නිර්දේශය මත , සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:22 නගර සභාව සතු PF 7424 කැබ් රථය සඳහා 2015 ජනවාරි මස 16 -31 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 35178.00 ක මුදලක් තාක්ෂණ සේවා නිළධාරීගේ හා ලේකම්ගෙ නිර්දේශය මත , සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා ගැනීම.

මෙම ගෙවීම සම්බන්ධයෙන් විරෝධතාවයන් මතු වූ බැවින් මේ සම්බන්ධයෙන් ඡන්දය විමසන ලදී.

ගරු නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්.ජයන්ත මහතා,ගරු නගර සභා මන්ත්‍රී ආර්.පී.දේව් රොහාන් මහතා, ගරු නගර සභා මන්ත්‍රී බී.ජනිත් වික්‍රමතිලක මහතා සහ ගරු නගර සභා මන්ත්‍රී කේ.පුෂ්පික ඉන්ද්‍රජිත් මහතා මෙම ගෙවීම අනුමත කිරීමට විරුද්ධව ජන්දය ලබා දුන් අතර ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා , ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා , ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී.ලක්ෂ්මි හේමන්තා සිල්වා මෙනවිය, ගරු නගර සභා මන්ත්‍රී එච්.එල්.අනුර කිත්සිරි මහතා , ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා සහ ජේ.ඩබ්.හාෂිණී මෙනුකා විජේසූරිය මහත්මිය මෙම ගෙවීමට පක්ෂව ජන්දය ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව වැඩි ජන්ද 02 න් මෙම ගෙවීම සම්මත වන ලදී.

8:23 නගර සභාව සතු 252 -0730 කැබ් රථය සඳහා 2015 ජනවාරි මස 16-31 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 13300.00 ක මුදලක් තාක්ෂණ සේවා නිළධාරීගේ හා ලේකම්ගෙ නිර්දේශය මත , සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:24 හෙප්පුමුල්ල සේවා පියස ඉදිරිපිට කාණුව ඉදිකිරීමේ කර්මාන්තයේ ගෙවීම් ලෙස රු. 202271.27 ක මුදලක් තාක්ෂණ සේවා නිළධාරීගේ හා ලේකම්ගෙ නිර්දේශය මත අංක 83, හෙප්පුමුල්ල සමඟි ප්‍රජා මණ්ඩලය වෙත ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.25 2014 දෙසැම්බර් මාසයට අදාල විදුලි බිල්පත් සඳහා සී/ස ලංකා විදුලි (පුද්ගලික) සමාගමට ගෙවීම.

| වැය අංකය | ගෙවූ මුදල |
|---|---|
| 11453 -I | 38611.65 |
| 23453- I | 1200.70 |
| 34453- I | 2243.28 |
| 52453- I | 28036.19 |
| 53454 | 17084.25 |
| 62453- I | 20343.01 |
| එකතුව | 107519.08 |

විදුලි බිල්පත සඳහා රු.107519.08 ක මුදලක් ලේකම්ගේ නිර්දේශයෙන් ගෙවීම ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.26 2014 දෙසැම්බර් මාසයට අදාල ජල බිල්පත් සඳහා ජාතික ජල සම්පාදන මණ්ඩලයට ගෙවීම.

| වැය අංකය | ගෙවූ මුදල |
|---|---|
| 11453 -I I | 9184.00 |

| | |
|---|---|
| 23453- I I | 13003.08 |
| 34453- I I | 1065.12 |
| 52453- I I | 6557.60 |
| 62453- I I | 31516.88 |
| එකතුව | 61326.68 |

ජල බිල්පත සඳහා රු.61326.68 ක මුදලක් ලේකම්ගේ නිර්දේශයෙන් ගෙවීම ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.27 2014 දෙසැම්බර් මාසයට අදාල දුරකථන බිල්පත් සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට ගෙවීම.

| වැය අංකය | ගෙවූ මුදල |
|---|---|
| 11452 | 30713.37 |
| 12452 | 1211.73 |
| 25451 - I I | 2214.29 |
| 62452 - I | 7650.66 |
| එකතුව | 41790.05 |

දුරකථන බිල්පත සඳහා රු.41790.05 ක මුදලක් ලේකම්ගේ නිර්දේශයෙන් ගෙවීම ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.28 නගර සභාව සතු 49-9422 ට්‍රැක්ටරයේ අලුත් වැඩියා කටයුතු වෙනුවෙන් සහා ආවරණ අනුමැතියට යටත්ව රු. 24600.00 ක මුදලක් තාක්ෂණ සේවා නිළධාරීගේ හා ලේකම්ගෙ නිර්දේශය මත , අම්බලන්ගොඩ මහින්ද මෝටර්ස් ආයතනය වෙත ගෙවීම ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:29 නගර සභාව සතු LQ 2090 මුද්‍රණ යන්ත්‍රය අලුත්වැඩියා වෙනුවෙන් සහා ආවරණ අනුමැතියට යටත්ව රු. 14800.00 ක මුදලක් තාක්ෂණ සේවා නිළධාරීගේ හා ලේකම්ගෙ නිර්දේශය මත , මෙට්‍රොපොලිටන් කම්පියුටර් ආයතනය වෙත ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:30 නගර සභාව සතු IR2318 L ඡායා පිටපත් යන්ත්‍රය අලුත්වැඩියා කටයුතු සඳහා වාර්ෂික ගිවිසුමට වෙනුවෙන් සහා ආවරණ අනුමතියට යටත්ව රු. 19600.00 ක මුදලක් තාක්ෂණ සේවා නිළධාරීගේ හා ලේකම්ගෙ නිර්දේශය මත , මෙට්‍රොපොලිටන් කම්පියුටර් ආයතනය වෙත ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

- **ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා පෙ.ව.10.32 ට පමණ ගරු සභාවට පැමිණෙන ලදී.**

**(09)** **ගිණුම්**

**9.1** 2015 ජනවාරි මාසය සඳහා වියදම් වාර්තාව , වියදම් වැය විශ්ලේශණය, පොදු ගිණුම , මුදල් සාරාංශය හා ලැබීම් විග්‍රහය සභාගත කිරීම.

ඒ අනුව 2015 ජනවාරි මස ගිණුම් වාර්තා පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභාවේ ස්ථිර විය.

**(10)** weia;fïka;=

10:1) සුදුවැල්ල මාර්ගයේ අක්කර 12 පාරේ කොටසක් කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තය වෙනුවෙන් තාක්ෂණ සේවා නිධළාරී විසින් සකස් කරන ලද රු.610907.55 ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
මේ ඇස්තමේන්තුවේ පාර කොතනද කියලා මන්ත්‍රීතුමා අහනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

මේ වඩුසිංහ මහත්තයලගේ ගෙදරට යන පාරේ කොටසක්
**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මාර්ගයේ කොටසක් කියන්නේ බැවුම් කොටසක් තියෙනවා.මේ පාර සම්පූර්ණයෙන් කරන්න ගියොත් විශාල මුදලක් වැය වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්.එල්.අනුර කිත්සිරි මහතා කතා කරමින්</u>**
ලේබර් කොස්ට් එකත් එක්කද 6 ලක්ෂ ගාණ.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔව් ඔක්කොම.

***<u>තීරණය</u>***

☞ **මෙම ඇස්තමේන්තුව පිළිගතයුතු බව ගරු සභාපති ඇම්.ඩබ් .අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10:2) තොටුපල පටුමගේ කාණුව කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තය වෙනුවෙන් තාක්ෂණ සේවා නිළධාරී විසින් සකස් කරන ලද රු.299378.11 ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**<u>තීරණය</u>**

☞ **මෙම ඇස්තමේන්තුව පිළිගතයුතු බව ගරු සභාපති ඇම්.ඩබ් .අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී එච්.එල්.අනුර කිත්සිරි මහතා විසින් ස්ථිර කරන ලදව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10:3) මාදම්පා ගඟ අසබඩ දුම්රියපළ බඳව ඇති ගොඩබිම් තීරයේ යෝජිත පිහිණුම් තටාක නැරඹුම හා කැන්ටිමක් ඉදිකිරීමේ කර්මාන්තය වෙනුවෙන් තාක්ෂණ සේවා නිළධාරිනිය විසින් සකස් කරන ලද රු.1947833.80 ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.පී.දේව් රොහන් ද සිල්වා මහතා කතා කරමින්</u>
මේක කොතනද හදනන හදන්නේ සභාපතිතුමා.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>
ටර්නින් පොයින්ට් එක ළඟ කැල්ල දික්කරලා චේන්ජින් රූම් එක හදපු තැන.කලින් අනුමත කරපු ඇස්තමේන්තුවක්.දැන් තියෙන මිළ ගණන් වලට රිවයිස් කරලා හදලා තියෙන්නේ.

**<u>තීරණය</u>**

☞ **මෙම ඇස්තමේන්තුව පිළිගතයුතු බව ගරු සභාපති ඇම්.ඩබ් .අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී.ල්ක්මි හේමන්තා සිල්වා මෙනවිය විසින් ස්ථිර කරන ලදව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10:4) පින්නදූව වටරවුම් පාරේ 4 වන හරස් පාර කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තය වෙනුවෙන් තාක්ෂණ සේවා නිළධාරී විසින් සකස් කරන ලද රු.212634.00 ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>ගරු නගර සභා මන්ත්‍රී බී.ජනිත් වික්‍රමතිලක මහතා කතා කරමින්</u>

මේ සම්බන්ධව ප්‍රදේශවාසීන් එක්ක සාකච්ඡා කළා.මේ වටරවුම් පාර ගිහිල්ලා බැලුවා ප්‍රදේශවසීන්ගේ ඉල්ලීම පරිදි.ඇත්ත වශයෙන්ම ප්‍රධාන පාර සම්පූර්ණයෙන්ම ගැලවිලා ගිහිල්ලා තියෙන්නේ.ඊයේ රාත්‍රියෙත් මම ගියා.බයිසිකලෙන් පෙරලිලා යන්නත් පුලුවන් පල්ලමට.ඒ තරම් අවදානමක් තියෙනවා.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>
බැම්ම බැදලනේ තියෙන්නේ.

<u>ගරු නගර සභා මන්ත්‍රී බී.ජනිත් වික්‍රමතිලක මහතා කතා කරමින්</u>

බැම්ම බැදලා නෑ.ඔබතුමාට ඕන නම් බලන්න පුලුවන්.ප්‍රධාන පාර හදන්න කියන ඉල්ලීම තමයි ප්‍රදේශවාසීන්ගේ තියෙන්නේ.මුදල් ප්‍රශ්න නිසා එක වර කරන්න බැරිනම් අදියර කීපයකින් හරි මේක කරන්න කියලා ඉල්ලනවා.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මේ දවස් වල අපට පොඩි ප්‍රශ්නයක් තියෙනවා,ගල් නෑ අපට මේ දවස් වල.අද ටෙන්ඩර් කඩනවා.අපි ප්‍රධාන පාරත් ප්‍රතිසංස්කරණය කරලා දෙන්නම්.

**<u>තීරණය</u>**

☞ **මෙම ඇස්තමේන්තුව පිළිගතයුතු බව ගරු සභාපති ඇම්.ඩබ් .අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10:5) පතිරාජ පටුමඟ හියුම් පයිප්ප යෙදීමේ කර්මාන්තය වෙනුවෙන් තාක්ෂණ සේවා නිළධාරී විසින් සකස් කරන ලද රු.9829.07 ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**<u>තීරණය</u>**

☞ **මෙම ඇස්තමේන්තුව පිළිගතයුතු බව ගරු සභාපති ඇම්.ඩබ් .අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී එච්.එල්.අනුර කිත්සිරි මහතා විසින් ස්ථිර කරන ලදව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**(11)** fjk;a lreKq

- **ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා පෙ.ව.10.51 ට පමණ ගරු සභාවට පැමිණෙන ලදී.**

**11:1** ‘ දකුණු පළාත් පරිවාස හා ළමා රක්ෂණ සේවා දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන ,අන්තර් ළමා නිවාස ක්‍රීඩා තරඟ වෙනුවෙන් ,පොල්වත්ත ක්‍රීඩාපිටිය වෙන් කරවා ගැනීම සඳහා ඉල්ලීම ’ මැයෙන් බලපිටිය ස්ථානභාර නිළධාරී විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

දකුණු පළාත් පරිවාස හා ළමා රක්ෂණ සේවා දෙපාර්තමේන්තුව මඟින් පාලනය වන බලපිටිය පරිවාස ඒකකයට අයත්,ළමා නිවාස වල වෙසෙන දරුවන්ගේ “2015 අන්තර් ළමා නිවාස ක්‍රීඩා තරඟ” 2015.03.16 වන දින පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇති බවත් එම කටයුතු සාර්ථක කර ගැනීම සඳහා 2015.03.16 වන දින පොල්වත්ත මහජන ක්‍රීඩාංගනය අය කිරීමකින් තොරව වෙන් කර දෙන මෙන් ඉල්ලා තිබුණි.

**<u>තීරණය</u>**

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් දකුණු පළාත් පරිවාස හා ළමා රක්ෂණ සේවා දෙපාර්තමේන්තුව මඟින් පවත්වන 2015 අන්තර් ළමා නිවාස ක්‍රීඩා තරඟ සඳහා 2015.03.16 වන දින පොල්වත්ත මහජන ක්‍රීඩා පිටිය ගාස්තු අය කිරීමකින් තොරව ලබා දීමට ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**11:2** ‘ 48 වන මහා ක්‍රිකට් තරඟය- 2015 ’ මැයෙන් අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයේ විදුහල්පති විසින් එවා තිබූ ලිපිය ලිපිය සභාගත කරන ලදී.

උක්ත ක්‍රීඩා තරඟය 2015 මාර්තු මස 21 හා 22 දිනයන් වල අම්බලන්ගොඩ නගර සභා පිටියේදී පැවැත්වීමට නියමිත බවත් මහා ක්‍රිකට් තරඟය පවත්වන දින 02 ක හා එයට සමගාමීව පවත්වන අනෙකුත් සුහද තරඟ සඳහා නගර සභා ක්‍රීඩා පිටිය 2015 මාර්තු මස 15 සිට 22 දක්වා නොමිලයේ ලබා දෙන මෙන් ඉල්ලා තිබුණි.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්.ජයන්ත මහතා කතා කරමින්</u>

මේ විදියට නොමිලයේ දෙන්න ගියොත් මේක පුණ්‍යායතනයක් වෙනවා.නගර සභාව පිට්ටනියට සෑහෙන්න මුදලක් වැය කරනවා.කම්කරුවොත් දානවා.ආර්ථික අපහසුතා මැද නගර සභාව තියෙන වේලාවක මේ විදියට දෙන්න ගියොත් පඩි ගෙවන්න වෙන්නේත් අපට සේවකයින්ට.එනිසා මම යෝජනාවක් කරනවා,ඒ දෙන පහසුකම් ඒ විදියටම ඒ මුදලට ලබා දීලා ඉස්කෝල සියල්ලටම සාමානව සලකන්න කියලා.අපි පාසල් වලට මුදල් අඩුවෙන් ගන්නෙත්.1962 ඉඳලා මේ මැච් ගහනවා.අපි මේවට සල්ලි ගන්නවා.අපේ නගර සභාවේ ආර්ථික තත්වය යහපත් වුණ දවසක අපි මේ ඉල්ලීම සලකා බලමු.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමණී,අපේ ජයන්ත මන්ත්‍රීතුමා කියපු කාරණය මම පිලිගන්නවා.ඒකට විරුද්ධ නෑ මම.නමුත් ඒ හා සමානව අපි පාසල් සමඟ බැඳීගෙන කටයුතු කරන නිසා අපි දන්නවා වර්තමානයේදී දැඩි මූල්‍ය දුෂ්කරතාවයකට මේ ජාතික පාසල් මුහුණ දීලා තියෙනවා.මේ නිසා වෙන්නට ඕන මේ ඉල්ලීම කරලා තියෙන්නේ.මේක අපට වටින උත්සවයක් සභාපතිතුමණී.පාසල් 02 ට එහා ගිය වෙළඳ ප්‍රජාවක් අනාදිමත් කාලයක සිට මේ උත්සවය පවත්වගෙන ආවේ.මේක එක පාසලක නෙවෙයි.පාසල් දෙකේම ඉල්ලීමක්නේ.

<u>**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ධර්මාශෝක විදුහලෙන් විතරයි මේ ඉල්ලීම කරලා තියෙන්නේ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා කතා කරමින්**</u>

ඒක හරි.නමුත් පාසල් දෙකෙන්නේ මේක කරන්නේ.වියදම් වුනත් කරන්නේ පාසල් දෙකෙන්නේ.මුදල් අපහසුතාවයක් නිසානේ මෙහෙම ඉල්ලන්න ඇත්තේ.එනිසා මම ඉල්ලීමක් කරනවා පුලුවන් නම් මේ වසරේ ,ජයන්ත මන්ත්‍රීතුමා කියපු දේට මම විරුද්ධ නෑ.නමුත් ගමේ ,නගරයේ පොදු උත්සවයක් නිසා මේ වසරේ මේක පුලුවන්නම් ලබා දෙන්න කියලා ඉල්ලනවා.මේකෙදී පොදු මහ ජනතාවගෙන් මුදල් අය කිරීමක් සිදු වෙන්නෑ.

<u>**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ටිකට් එකක් ගහනවා නේද.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා කතා කරමින්**</u>

ආදී ශිෂ්‍ය සංගමයෙන් ටිකට් එකක් ගහලා ටෙන්ට් එකක ගාණ හොයා ගන්න එක වෙනම දෙයක්.ඒකට පාසල් 2 සම්බන්ධ නෑ.පාසල් 02 ක තමන්ගේ වියදම් දරාගන්න ඕන මේ මූලික වියදම්.ඒකයි මම කීවේ.විශාල මුදලක් නොවන නිසා නිදහස් කරන්න පුලුවන් නම් නිදහස් කරන්න.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ආර්.පී.දේව් රොහන් ද සිල්වා මහතා කතා කරමින්**</u>

සරත් ශ්‍රී ලාල් මහත්මයා කියපු කතාව සම්බන්ධයෙන් මමත් එකඟවෙනවා.මම වර්ථමාන ධර්මාශෝක විද්‍යාලයේ ආදී ශිෂ්‍ය සංගමයේ සම ලේකම්වරයා.මෙහි ආදී ශිෂ්‍ය සංගමයේ මැදිහත් වීම තියෙන්නේ ටෙන් ටික ගහලා ඒ දේවල් කරන්න විතරයි.මෙවර අපට ගැටලුවක් තියෙනවා.මූල්‍ය අනුග්‍රහය දක්වන්න කෙනෙක් නෑ අපට මෙවර.පසු ගිය වර මෙම සුහද ක්‍රිකට් තරඟය පවත්වන්න බැරි වුණා.අවුරුදු 40 ගාණක් පවත්වගන යන මේ ක්‍රීඩා උළෙල නිසා සුහදතාවය අන්‍යෝන්‍ය අවබෝධය වර්ධනය වෙලා තියෙනවා.ඒනිසා අපි හිතුවා මෙවර කෙසේ හෝ මෙම ක්‍රීඩා උළෙල පැවැත්විය යුතුයි කියලා.ජයන්ත මන්ත්‍රීතුමත් සමඟ අපි එකඟයි.නමුත් මෙය පූර්වාදර්ශයක් නොවන පරිදි ලබා දෙන්න පුලුවන් නම් දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

<u>**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මේ තරඟය සඳහා මං හිතන්නේ පිච් එක සඳහා හුඹස් මැටි වලටම ගිහින් තියෙනවා 6000 ට වැඩියෙන්.මේ තරඟය නිසාම මේ පැත්තේ පිච් එක හදනවා.මම නම් දකින්නේ බිච් මැච් එකකදී යම් ආදායමක් පාසල ලබනවා.ඇයි සෝනියර් ගහලා එහෙමනේ කරන්නේ.මම මේ ඉල්ලීම සම්බන්ධයෙන් ක්‍රීඩා කමිටුවේදී කතා කළා.මේ පාසල් 2 කේ උත්සවයක් තියෙනවනම් ආරාධනා කරන්නේ සභාපතිවරයාට විතරයි.අපි ළමයෙක්ව ඇතුලත් කරගන්න කීවොත් ගන්නෑ.අම්බලන්ගොඩ නගර සභාවේ උත්සවයක් තියෙනවා කියලා බැන්ඩ් එක ඉල්ලුවොත් දෙන්නෑ.ඒක ගෙන්න ගන්න වෙන්නේ ප්‍රජාපතියෙන් ,නැතිනම් කුලරත්නෙන්.නැටුමක් ඉල්ලුවත් මේ ඉස්කෝල දෙක දෙන්නෑ.මේ ඉස්කෝල දෙක නගර සභාවට සලකන්නෑ.මම පුද්ගලිකව මේ ඉල්ලීමට විරුද්ධයි.අපි නගර සභාවෙන් පාසල් සඳහා පුස්තකාල පවත්වාගෙන යනවා,ක්‍රීඩා තරඟ පවත්වනවා.අපේ වියදමට වඩා අඩක් අඩුවෙන් ගන්නේ පාසල් වලින්.අපි මන්ත්‍රීවරු එකතුවෙලා මේක ගෙවලා දාමු.

සභාවේ ගෝෂාකාරී තත්වයක් ඇති විය.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

මොවුන් කීවට මන්ත්‍රීවරයෙක් කීවට ළමයෙක් ගන්නෑ කියලා, මේ සියලු දෙනාගේ ළමයි ධර්මාශෝකයට යනවා.උප සභාපතිතුමාගෙත් ළමයෙක් යනවනේ.10 ක් ඉන්නවනම් ඉතින් 10 ගන්න බෑනේ.එක්කෙනෙක් හරි යනවනේ.මං අහන්නේ ,නගර සභාවත් රජයේ ආයතනයක්.අපි වැඩ කරන්නේත් නීති රීති වලටනේ.එහෙම ඒකේ මේ චක්‍ර ලේඛ ගැන මන්ත්‍රීවරු දන්නවනේ.එනිසා නීති රීති වලට පිටින් වැඩ කරන්න බෑනේ.නමුත් මන්ත්‍රවරු කියන දෙයක් ගණන් ගන්නෑ කියන එකනම් ඇත්ත.ඔබතුමා කීවා වගේ උත්සවයකට මන්ත්‍රීවරයෙක්ට ආරාධනා කරන්නෑ.ඒ වගේ දේවල් තියෙනවා.මේ තීන්දුව මම ගන්න කියලා කීවේ දරුවන් සහ සමස්ථ ප්‍රජාව වෙනුවෙන්.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

සභාපතිතුමා දැන් සරත් මන්ත්‍රීතුමා කීවා,මගේ ලොකු දරුවා ධර්මාශෝකෙට යන්නේ ශිෂ්‍යත්වය පාස් වෙලා.නමුත් දෙවනි ළමයට ලොකු අසාධාරනයක් වුණා.මම ස්තුතිවන්ත වෙනවා සරත් මන්ත්‍රීතුමා තමයි ඒ ළමයව ඉසේකෝලෙට දාලා දුන්නේ.අපේ ළමයි කොහොමත් මුල් වටයට ඉස්කෝලෙට ගත්තේ නෑ.මම දේවානන්නේ.මම කැමතිත් නෑ මේකට.මොකද නගරයේ ඉන්න ජනතාව තමයි අපට ජන්දේ දීලා මෙතනට එවන්නේ.අපි ඉස්කෝල දෙකින් කරන ඉල්ලීම් වලට ඇහුම්කන් දුන්නම ඒක ජනතානට කරන අසාධාරණයක්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්.ජයන්ත මහතා කතා කරමින්</u>**

මම කතා කලේ ධර්මාශෝකය ගැන නෙවෙයි.දේවානන්දය ගැන.ඒ මොකද අවුරුදු දෙකකට කලින් දේගොඩ ළමයෙක් හිටියා.මම ඒ කාලේ ජේෂ්ට උප සභාපති.මම නොකීවත් ඔබතුමාලා ඉස්කෝලේට ගිහිල්ලා කතා කලා නගරයේ ළමයි ටික ගන්න කියලා දේවානන්නේ විදුහල්පතිතුමාට.පොඩි ලකුණු ප්‍රමාණයක් අඩු වෙලා තිබුණේ.වෙනදා අපි කීවම හිරේවත්තේ,පනියන්දූවේ වගේ නොතේරිච්ච ළමයි ගත්තා.නමුත් මේ ළමයි දෙන්නා ගත්තේ නෑ.මම විශේෂයෙන් කියන්න ඕන.අපේ ගමේ ළමයෙක් දැන් යන්නේ මීටියාගොඩට ඉස්කෝලෙකට.ඒක මතක තියාගන්න.කවුරුවත් නොවේ ධීවර ප්‍රජා ශාලාව ඉදිරිපිට තියෙන උපාලි මහත්තයගේ මුණුපුරා.ඒ දරුවගේ අම්මා මිය ගියා,පියා වෙන තැනකට ගියා.ලකුණු 91 ගත්තේ.දරුවට ලකුණුප 94 ක් තිබුණා.නමුත් දරුවට ඒ කාලේ මේ පාසලට එන්න බැරි වුනා මානසික පීඩනය මත.පස්සේ ගිහිල්ලා කීවම දරුවව ගත්තේ නෑ.ඊට පස්සේ අධ්‍යාපන කාර්යාලයෙන් දුන්නේ මීටියාගොඩ ඉස්කෝලයක්.මම ජේෂ්ට උප සභාපති තනතුරෙන් අයින් වුනෙත් මේ ළමයි ගැනීම සම්බන්ධ ප්‍රශ්නය නිසා.මොකද නගරයේ ළමයි කීප දෙනෙක් ගන්න කියලා මම කීවා.ඒක කළේ නෑ.ඉතින් මම හිතුවා මොකටද ඉන්නේ කියලා.අපි ඉන්න නිසානේ මිනිස්සු අපට කියන්නේ.ඉතින් මම තනතුරෙන් ඉල්ලා අස් වේලා,තාම ඉස්කෝලෙටවත් යන්නෑ.මොකද අපේ ගමේ ළමයින්ට ඉස්කෝලයක් තියෙන්න ඕන.මැච් එක සම්බන්ධ දෙයක් නෙවෙයි මම කියන්නේ.ඔබතුමා මේ මන්ත්‍රීවරු කට්ටියක් එක්ක ගිහිල්ලා කීවා මේ ළමයි ටික ගන්න කියලා.පස්සේ මම පුද්ගලිකව ගිහිල්ලා කීවා මේ ළමයි දෙන්නත් මේක ඇතුලේ ඉන්නවා.මේ ළමයි ටික ගන්න කියලා.අච්චේ ගෙන්වලා මමයි දෙමව්පියනුයි රස්තියාදු කරලා මේ ළමයි ටික ගත්තේ නෑ.කලින් ඉදපු විදුහල්පතිවරු මේ ළමයි ගත්තා.අපි කියන්නේ මේ ළමයි දුප්පත්.එනිසා සල්ලි ගන්න එපා මේ ළමයි ටික ගන්න කියලා.පිට ළමයි බස් වලින් මේ ඉස්කෝලවල් වලට එනකොට.අපේ ළමයි පාරේ බස් එකේ පිට ඉස්කෝල වලට යන කොට අපට කොච්චර දුකක් දැනෙනවද.ඒක මම කියන්නේ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

සභාපතිතුමණි, මේ සමගම ස්තුතිවන්ත වෙන්න ඕන කුලරත්නේ විදුහල්පතිවරයට.නගරයේ ළමයි ධර්මාශෝකයට,දේවානන්දයට නොගත්තට කුලරත්න විදුහලේ මොන අඩුපාඩු තිබුණත් නගරයේ ළමයි වෙනුවෙන් කරන්න ඕන යුතුකම එතුමා කරනවා.ඒ පිළිබඳ මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වෙන්න ඕන.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අද මම හමුවෙන්න ආවා ඔයාලගේ ලිස්ට් එකේ හිටිය ළමයෙක්.ඒ ළමයා පෝරඹ.ඒ ළමයා අරගෙන නෑ.මම අද දේවානන්ද විදුහලේ ප්‍රින්සිපල්ට කතා කළා.ඒ ගෙදර ඉන්න අනෙක් ළමයා අරගෙන.මම අද කලාප කාර්යාලයෙනුත් ඇහුවා.මම කීවේ බුද්ධදත්තයට හරි දාගන්න කියලා.නැතිනම් ඉස්කෝලයක්

නැතිවෙනවනේ.ධර්මාශෝකෙන් ලකුණු 94 ක් අරගෙන.ඇපිල් එකෙන් අයින් වෙලා තියෙන්නේ.ධර්මාශෝක ලකුණු 94 ක් තියෙන නිසා දේවානන්දයට ඇපිල් එකක් දාලත් නෑ.

<u>ගරු නගර සභා මන්ත්‍රී එච්.එල්.අනුර කිත්සිරි මහතා කතා කරමින්</u>

මෙතනට අදාල නොවුණත් පාසල් සම්බන්ධයෙන් කතා කළ නිසා සභාපතිතුමණි,විපක්ෂ නායක ජයන්ත මහතා කීව ආකාරයට දේවානන්ද විදුහලේ විදුහල්පතිවරයා හමුවීමට ගිය අවස්තාවේ සහ ඊට පසු සභාවාර වලදී අපට ලැබුණු ලිපි අනුව ,එතුමා යොමු කරපු ලිපිය සම්බන්දව මම මෙතනදී කතා කරන්න යන්නෑ.ඒක සභාවටත් අපහාසයක් වෙන නිසා.ඉතාම අශෝභන ලෙස මන්ත්‍රීවරුන්ට කතා කරපු අවස්ථාවක්.නමුත් දරුවන් වෙනුවෙනු කරන්න පුලුවන් දෙයක් තියෙනවනම් කරමු සභාපතිතුමණි.

<u>තීරණය</u>

☞ **ධර්මාශෝක විදුහල විසින් කරන ලද යෝජනාව ගරු සභාව විසින් ප්‍රතික්ෂේප කළ අතර මහා ක්‍රිකට් තරඟය පැවැත්වෙන 2015 මාර්තු මස 21 හා 22 යන දින දෙකෙහි ක්‍රීඩා පිටිය වෙන් කිරීම ගරු මන්ත්‍රීවරුන්ගේ අනුග්‍රහයෙන් සිදු කිරීමට ගරු සභාපති අරුණ ප්‍රදීප් මණිමෙල් වඩු මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී එච්.එල්.අනුර කිත්සිරි මහතා විසින් ස්ථිර කරන ලදී.**

**11:3** ‘ කොඩි කණු ලබා ගැනීම’ මැයෙන් අම්බලන්ගොඩ මූලස්ථාන පොලිස් පරීක්ෂක විසින් එවා තිබූ ලිපිය ලිපිය සභාගත කරන ලදී.

2015.02.28 වන දින ගාල්ල දිසාව භාර නියෝජ්‍ය පොලිස්පතිතුමාගේ අර්ධ අවසාන පරීක්ෂණය පැවැත්වීමට නියමිත බවත් අම්බලන්ගොඩ පොලිස් ක්‍රීඩා භූමිය අලංකාර කිරීම සඳහා කොඩි කණු 30 ක් 2015.02.27 දිනට මුදල් අය කිරීමකින් තොරව ලබා දීමට කටයුතු කරන මෙන් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් අම්බලන්ගොඩ පොලිස් ස්ථානයට 2015.02.27 වන දින කොඩි කණු 30 ක් ගාස්තු අය කිරීමකින් තොරව සහා ආවරණ අනුමැතියට යටත්ව ලබා දීම වෙනුවෙන් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**11:4** ‘ අන්තර් ක්‍රිඩා සමාජ ක්‍රිඩා උළෙල ’ මැයෙන් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එවා තිබූ ලිපිය ලිපිය සභාගත කරන ලදී.

2015 වසරේ පවත්වනු ලබන XLI වන ජාතික මහා ක්‍රීඩා උළෙලේ ප්‍රථම අදියරේ තරඟ යටතේ පවත්වනු ලබන අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ටාශයේ අන්තර් ක්‍රීඩා සමාජ ක්‍රීඩා තරඟ 2015 පෙබරවාරි මස සිට පැවැත්වීමට කටයුතු යොදා ඇති බවත් ඒ සඳහා අම්බලන්ගොඩ නගර සභා ක්‍රීඩාංගනය සහ පොල්වත්ත පියසේන ක්‍රීඩාංගනය පහත සඳහන් දිනයන් හී මුදල් අය කිරීමකින් තොරව ලබා දෙන මෙන් ඉල්ලා තිබුණි.

පොල්වත්ත පියසේන ක්‍රීඩාංගනය - 2015 පෙබවාරි මස 17 සහ 22 දිනයන් සහ 2015 මාර්තු 12 සහ 15 දිනයන්
අම්බලන්ගොඩ නගර සභා ක්‍රීඩාංගනය - 2015 මාර්තු 01

<u>තීරණය</u>

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් පවත්වන 2015 XLI වන ජාතික මහා ක්‍රීඩා උළෙලේ ප්‍රථම අදියරේ තරඟ සඳහා පොල්වත්ත පියසේන ක්‍රීඩාංගනය 2015 පෙබවාරි මස 17 සහ 22 දිනයන් සහ 2015 මාර්තු 12 සහ 15 දිනයන් වලදී සහ අම්බලන්ගොඩ නගර සභා ක්‍රීඩාංගනය 2015 මාර්තු 01 වන දින ගාස්තු අය කිරීමකින් තොරව සහා ආවරණ අනුමැතියට යටත්ව ලබා දීම වෙනුවෙන් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**11:5** ' විධායක පුටු මිලදී ගැනීමට අදාල ඇගයීම් කමිටුවේ තීරණ දැණුම් දීම ' මැයෙන් සැපයුම් නිළධාරිණිය විසින් එවා තිබූ ලිපිය ලිපිය සභාගත කරන ලදී.

2015.02.10 වන දින මාසික සභා තීරනය පරිදි 2015.02.18 වන දින නිළධාරීන් 03 න් සමන්විත ඇගයීම් කමිටුව පැවැත්වූ බවත් කමිටු සමාජිකයින් අදාල ආයතන වලට ගොස් පරීක්ෂා කර බලා සමඟි ලී බඩු වෙළඳ සැලෙන් රු.5800.00 ක් වටිනා විධායක පුටු ලබා ගැනීමට නිර්දේශ කරන ලද බව වාර්තා කර තිබූ අතර ඒ සඳහා අනුමැතිය ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය පරිදි අම්බලන්ගොඩ සමඟි ලී බඩු වෙළඳ සැලෙන් රු.5800.00 ක් වටිනා විධායක පුටු ලබා ගැනීමට ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

## (12) න්‍යාය පත්‍රයට ඇතුලත් නොවූ වෙනත් කරුණු

**12:01** " නොමිලයේ පවත්වන ලද වෛද්‍ය කඳවුර සඳහා'' මැයෙන් ගාල්ල කොටුව සිංහ සමාජය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

2015 මාර්තු මස 07 වන දින ගාල්ල කොටුව සිංහ සමාජය විසින් පොල්වත්ත අග්‍රාරාම විහාරස්ථානයේදී නොමිලයේ පවත්වන වෛද්‍ය සායනය සඳහා නගර සභාව සතු වර්ණවත් කොඩි සහ කොඩි කණු නොමිලයේ ලබා දෙන මෙන් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් 2015.03.07 වන දින ගාල්ල කොටුව සිංහ සමාජය විසින් පොල්වත්ත අග්‍රාරාම විහාරස්ථානයේදී නොමිලයේ පවත්වන වෛද්‍ය කඳවුර සඳහා සහා ආවරණ අනුමැතියට යටත්ව නොමිලයේ වර්ණවත් කොඩි සහ කොඩි කණු ලබා දීම වෙනුවෙන් ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:02** “කුඩාරම් ලබා ගැනීම සම්බන්ධවයි” මැයෙන් ගා/පී.ද.එස්.කුලරත්න විද්‍යාලයේ නියෝජ්‍ය විදුහල්පති විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

විද්‍යාලයේ පැවැත්වෙන වයස අවුරුදු 17 න් පහළ පැසිපන්දු තරගාවලිය සඳහා කුඩාරම් 04 ක් අවශ්‍ය වී ඇති බවත් ඒ සඳහා නගර සභාව සතු කුඩාරම් අය කිරීමකින් තොරව 2015.02 වන මස 27 ,28 දින සහ 2015.03 වන මස 01 දිනට ලබා දෙන මෙන් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගා/පී.ද.එස්.කුලරත්න විද්‍යාලයට 2015.02 වන මස 27,28 සහ 2015.03 වන මස 01 දිනට කුඩාරම් ,ගාස්තු අය කිරීමකින් තොරව සහා ආවරන අනුමැතියට යටත්ව ලබා දීම වෙනුවෙන් ගරු සභාවේ අනුමැතිය ලබා දෙ ලදී.**

**12:03** “ශ්‍රී ලංකා පුස්තකාල සංගමය මගින් සංවිාධානය කරනු ලබන පුස්තකාල හා විඥාපන විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව -2015 පළමු අදියර ” මැයෙන් අම්බලන්ගොඩ නගර සභාව මගින් පාලනය වන පුස්තකාල වල නිළදාරීන් විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

උක්ත පාඨමාලාව සඳහා සිසුන් බඳවා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණය 2015.02.28 වන දින පවත්වන ලද බවත් අයදුම්කරුවන් 103 කින් 20 ක් අයදුම්කරුවන් පිරිසක් තෝරාගන්නා ලද බවත් ඒ අතරට අම්බලන්ගොඩ නගර සභා පුස්තකාල වල සේවය කරන ගෞරි වරුසවිතාන,එම්.ඩබ්.ජිනේකා සුමංගලී,මනෝරි චන්ද්‍රවංශ,තිළිණි භාග්‍යා යන අය තේරී ඇති බවත් මේ සඳහා එක් අයකු රු.16000.00 පාඨමාලා ගාස්තුවක් ගෙවිය යුතු බවත් එම මුදල් ලබා ගැනීම සඳහා අනුමැතිය ලබා දෙන මෙන් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් පුස්තකාල හා විඥාපන විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව සඳහා තේරී ඇති අම්බලන්ගොඩ නගර සභාව මගින් පාලනය වන පුස්තකාල වල සේවය කරන ගෞරි වරුසවිතාන,එම්.ඩබ්.ජිනේකා සුමංගලී,මනෝරි චන්ද්‍රවංශ සහ තිළිණි භාග්‍යා යන අයට පාඨමාලා ගාස්තු එක් අයකුට රු.16000.00 ලෙස ගෙවීමට ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:04** “ක්‍රිකට් ක්‍රීඩා පුහුණුව සඳහා මහජන ක්‍රීඩාංගනය නොමිලයේ ලබා ගැනීම සඳහා ” මැයෙන් දකුණු පළාත් බිහිරි ජනතා සංගමයේ සභාපති විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

තම ආයතනය ඉතාමත් දුෂ්කරතා සහ අපහසුතා මත සියලුම කටයුතු නොයෙකුත් පුද්ගලයින්ගේ සහ ආයතන වල උදවු උපකාර ඇතිව සිදු කරන බවත් 2015 වසරේ පැවැත්වෙන ඩෙෆ් ඒෂියා කප් T - 20 තරඟාවලිය සඳහා පුහුණු වීම් සිදු කිරීමට සතියේ සෑම සෙනසුරාදා සහ ඉරිදා දිනයක්ම පෙ.ව.09.00 සිට ප.ව 04.00 දක්වා නගර සභා ක්‍රීඩාංගනය නොමිලයේ ලබා දෙන මෙන් ඉල්ලා තිබුණි.

තීරණය

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් නගර සභා ක්‍රීඩාංගනය අදාල දිනවල වෙනත් කටයුත්තක් සඳහා වෙන් කිරීම් කර නොමැති නම් දකුණු පළාත් බිහිරි ජනතා සංගමයේ ක්‍රිකට් පුහුණුව සඳහා නගර සභා ක්‍රීඩාංගනය ලබා දීමට ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:05** "වියදම් විස්තර සභාවට ඉදිරිපත් කිරීම " මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපි ගොනුව සභාගත කරන ලදී.

2015 ජනවාරි මස වැඩ සටහන් 01 _ සාමාන්‍ය පරිපාලන හා කාර්යය මණ්ඩල සේවා, වැඩ සටහන් 02 _ සුභ සාධක සේවා, වැඩ සටහන් 03 _ වෙළඳපොළ හා අනෙකුත් මහජන අර්ථකාරී සේවා, වැඩ සටහන් 05 _ භෞතික සැලසුම් මංමාවත් සහ ගොඩනැගිලි, වැඩ සටහන් 06 _ සෞඛ්‍ය සේවා යන වැඩ සටහන් වල වියදම් විස්තර ඉදිරිපත් කර තිබුණි.

තීරණය

☞ **වැඩ සටහන් අංක 01 වියදම් වාර්තාව පිළිගත යුතු බව ගරු සභාපති ඇම්. ඩබ් අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කළ අතර වැඩ සටහන් අංක 02 වියදම් වාර්තාව පිළිගත යුතු බව ගරු සභාපති ඇම්. ඩබ් අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී.ලක්ෂ්මි හේමන්තා සිල්වා මෙනවිය විසින් ස්ථිර කළ අතර වැඩ සටහන් අංක 03 වියදම් වාර්තාව පිළිගත යුතු බව ගරු සභාපති ඇම් .ඩබ් අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කළ අතර වැඩ සටහන් අංක 05 වියදම් වාර්තාව පිළිගත යුතු බව ගරු සභාපති ඇම්. ඩබ් අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කළ අතර වැඩ සටහන් අංක 06 වියදම් වාර්තාව පිළිගත යුතු බව ගරු සභාපති ඇම්.ඩබ් අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී අතර ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොවූ බැවින් සියලුම වියදම් වාර්තා ඒකමතිකව සභාවේ ස්ථිර විය.**

**12:06** "අම්බලන්ගොඩ වෙළඳ සංකීර්ණයේ කාමර අංක 31 දරණ කඩ කාමරය පවරා ගැනීම" මැයෙන් බටපොල,සාදමුල්ල,385 ,සමගි මාවත ලිපිනයේ පදිංචි දොන් මලින්ද නදීෂාන් විජේතිලක විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

වරිපනම් අංක 10,ගාමිණී විද්‍යාල මාවත,අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචි මංජුල ප්‍රසන්න හෙට්ටිහේවා මහතාගේ අම්බලන්ගොඩ බස් නැවතුම්පළේ වෙළඳ සංකීර්ණයේ උඩු මහළේ අංක 31 කඩ කාමරය පවරා ගැනීමට කැමති බව ප්‍රකාශ කර තිබුණි.
මංජුල ප්‍රසන්න හෙට්ටිහේවා මහතාද මෙම කඩ කාමරය දොන් මලින්ද නදීෂාන් විජේතිලක යන අයට පවරා දීමට කැමැත්ත ප්‍රකාශ කරමින් ලිපියක් සහ දිවුරුම් ප්‍රකාශයක්ද ලබා දී තිබුණි.

තීරණය

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් අම්බලන්ගොඩ බස් නැවතුම්පළේ වෙළඳ සංකීර්ණයේ උඩු මහලේ අංක 31 කඩ කාමරය බටපොල,සාදමුල්ල,385 ,සමඟි මාවත ලිපිනයේ පදිංචි දොන් මලින්ද නදීෂාන් විජේතිලක යන අයට පවරා දීමට ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:07** **‘** 2015 පෙබරවාරි මස වාර්තාව**’** මැයෙන් අම්බලන්ගොඩ නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ ඖෂධ සංයෝජක විසින් ඒවා තිබූ වාර්තාව සභාගත කරන ලදී.

ආයතනයෙහි සායන පැවැත්වූ දින ගණන 18 ක් බවත්,ආයතනයට පැමිණි රෝගීන් සංඛ්‍යාව 209ක් බවත් , රෝගීන් පැමිණීමේ දෛනික සාමාන්‍ය 12 ක් බවත්, මාසය සඳහා වැය වූ ඖෂධ වල මුළු වටිනාකම රු.18503.79 ක් බවත් , රෝගියෙක් සඳහා වැය වූ මුදල රු.88.53 ක් බවත් සඳහන් කර තිබුණි.

<u>තීරණය</u>

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් නිදහස් ආයුර්වේද බෙහෙත්ශාලාවේ 2015 පෙබරවාරි මස වාර්තාව සඳහා ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:08** “තාක්ෂණ සේවා නිළධාරීන්ට හා ආදායම් පරීක්ෂක නිළධාරීන්ට පරිවර්ථික ගමන් වියදම් දීමනා ගෙවීම සම්බන්ධවයි.”මැයෙන් ආදායම් පරීක්ෂකවරුන් සහ තාක්ෂණ සේවා නිළධාරීන් විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

2014.11.26 දින පළාත් පාලන කොමසාරිස්ගේ දපපා/පපාකො/2014/01 දරණ චක්‍ර ලේඛය අනුව ආදායම් පරීක්ෂකවරුන්ට සහ තාක්ෂණ සේවා නිළධාරීන්ට පරිවර්ථිත ගමන් වියදම් ගෙවීමට උපදෙස් ලබා දී ඇති බවත් ඒ අනුව ජී.සී.සජීවනී, බී.ඩී.ප්‍රියංකා පීරිස්,එම්.එච්.ජී.නිසංසලා පෙරේරා,මලිත් ප්‍රනාන්දු යන තාක්ෂණ සේවා නිළධාරීන් සහ වයි.ජී.සිතාර මංජුල නයනජිත්,ජී.ජී.ඉල්ෂා සහ ටී.චන්න යන ආදායම් පරීක්ෂබ නිළධාරීන් මෙම පරිවර්ථිත ගමන් වියදම ලබා දෙන මෙන් ඉල්ලා තිබුණි.
2014.11.26 දින පළාත් පාලන කොමසාරිස්ගේ දපපා/පපාකො/2014/01 දරණ චක්‍ර ලේඛය මඟින් තාක්ෂණ සේවා නිළධාරී විශේෂ පන්තිය සහ පළමු පන්තිය සඳහා උපරිම මාසික දීමනාව රු.5000.00 ලෙසද තාක්ෂණ සේවා නිළධාරී සේවයේ II පන්තිය සඳහා උපරිම මාසික දීමනාව රු.4500.00 ක් ලෙසද තාක්ෂණ සේවා නිළධාරී සේවයේ III පන්තිය සඳහා උපරිම මාසික දීමනාව රු.4000.00 ක් ලෙසද තාක්ෂණ සේවා නිළධාරී සේවයේ පුහුණු නිළධාරීන් සඳහා උපරිම මාසික දීමනාව ලෙස රු.3000.00 ක්ද ආදායම් පරීක්ෂක නිළධාරී සේවයේ I පන්තිය සඳහා උපරිම මාසික දීමනාව රු.4000.00 ක්ද ආදායම් පරීක්ෂක නිළධාරී සේවයේ II හා III පන්තිය සඳහා උපරිම මාසික දීමනාව රු.3000.00 ක්ද වශයෙන් පරිවර්ථිත ගමන් වියදම් ගෙවිය හැකි බව දන්වා තිබුණි.

<u>තීරණය</u>

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් 2014.11.26 දින පළාත් පාලන කොමසාරිස්ගේ දපපා/පපාකො/2014/01 අංක දරණ චක්‍ර ලේඛයට අනුව නගර සභාවේ සේවය කරන තාක්ෂණ සේවා**

**නිළධාරීන්ට සහ ආදායම් පරීක්ෂකවරුන්ට පරිවර්ජිත ගමන් වියදම් දීමනාව ලබා දීමට ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

✪ fjk;a lreKq

<u>**ගරු නගර සභා මන්ත්‍රී ආර්.පී.දේව් රොහන් ද සිල්වා මහතා කතා කරමින්**</u>

මේ සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේත් අවධානය යොමු කරන්න කියලා ඉල්ලීමක් කරනවා.ගරු සභාපතිතුමණී,පසු ගිය මාසයේ 13 වන දින මා හට ලැබුණු දුරකථන ඇමතුමක් ගැන මම සොයා බැලුවා.ඇමතුම ලබා දුන්නේ 2015.02.13 වන සිකුරාදා දින.මට ඒ දුරකතන ඇමතුම මඟින් කීවේ අම්බලන්ගොඩ නගර සභාවේ සේවකයින් දෙදෙනෙක් අම්බලන්ගොඩ නගර සභාවේ අත්සන් ලේඛනයේ අත්සන් කරලා පෞද්ගලික කටයුත්තක් කරන භූමියක සේවය කරමින් ඉන්නවා කියලා.ඒ අවස්ථාවේ මම ඇවිල්ලා කර්මාන්ත අංශයේ අත්සන් ලේඛණය යම් විදියකට බැලුවා.එතකොට ඒ සේවකයින් දෙදෙනා අත්සන් කරලා තිබුණා.එක්කෙනෙක් 7.22 සහ අනෙක් කෙනා 7.25.ඒ වෙලාවේ වේලාව දහවල් 11.45 ට විතර ඇති.ඊට පසු මම හවස ඔවුන් සේවය කරන පෞද්ගලික භූමියට ගියා.ඒවෙලාවෙත් ඔවුන් එතන සේවය කරමින් හිටියා. ඊට පසු මම ඒ සේවකයින් දෙදෙනා සමඟ කතා කරලා විමසුවා අත්සන් කරලද ආවේ කියලා.ඔව් කීවා.මම ඇහුවා අද නිවාඩුද කියලා.එක් කෙනෙක් කීවා මම නිවාඩු පෝම් එකක් දීලාය තියෙන්නේ කියලා.මම ඇහුවා මේ කරන්නේ පෞද්ගලික රාජකාරියක් කියලා ඔයාලා දන්නවද කියලා.ඔව් කීවා.එම සේවකයින් දෙදෙනා එස්.ටී.බන්දුල සහ ආනන්ද අබේරත්න කියන සේවකයින් දෙදෙනා.මම ඇහුවා මේ කාගේ සේවයක්ද කරන්නේ.එපාර කීවා මේක ඇල්ටන් මහත්තයගේ පෞද්ගලික කොන්ත්‍රාත්තුවක් කරන තැනක් කියලා.මම ඒපාර ඔවුන් දෙදෙනා නගර සභාවට ගෙන්නලා ඒ සම්බන්දයෙන් ඉන්න නිළධාරිනිය ඉදිරියේ සියල්ල කියන්න කියලා කීවා.ඔවුන් ලිඛිත සටහන් පත් දෙකකුත් දුන්නා සහභාගී වුණේ කොහොමද කියන දේ ගැන.මේ සභාවේ පැමිණීමේ ලේඛණයේ අත්සන් තබලා ඔවුන් පෞද්ගලික සේවයන් සඳහා යොදවනවා.ඊට පසු මම ඒ වැඩ පලේ සිටම පුෂ්පා මිස්ට දුරකථන ඇමතුමක් දීලා කීවා මෙහෙම දෙයක් සිදු වෙලා තියෙනවා.අත්සන් පොත පරීක්ෂා කරලා බලන්න කියලා.මම හිතන්නේ ඇල්ටන් මහත්තයට තමයි මිසුත් කියලා තියෙන්නේ.මම 11.45 බලනකොටත් මේ නම් කපලා තිබුනේ නෑ.නමුත් හවස 4 බලන කොට රතු පෑනකින් මේ අත්සන් 2 ක කපලා තිබුණා.පස්සේ මම ඉල්ලුවා මොවුන් ඉදිරිපත් කළ නිවාඩු අයදුම්පත් දෙන්න කියලා ඇල්ටන් මහත්මයාගෙන්.නමුත් නිවාඩු අයදුම්පත් නෑ කියලා තමයි ඔවුන් කීවේ.මම මේ පොතේ සියලුම පිටු පෙරලලා බැලුවා.මේ වගේ රතු පෑනෙන් කපලා තිබ්ච්ච ඒවා එකක්වත් නෑ.මේක වුනේ සවස 4 න් පසු.ගරු සභාපතිතුමණී,මම දැන ගන්න කැමති මෙහි සේවය කරන සේවකයින් ඇඟිලි සලකුණ තිබ්බට පස්සේ ඇඟිලි සටහනම තියලා තමයි ඔෆ් වෙන්න ඕන.මම ඇඟිලි සටහන බලන්න ඕන කියලා කීවම ,කියන්න කණගාටුයි ඇත්තටම ,මේ ඇඟිලි සටහන් යන්ත්‍රය ක්‍රියාත්මක නෑ .මේ සම්බන්ධයෙන් කටයුතු කරන නිළධාරිණිය කියනවා නගර සභාවෙන් මුදල් ගෙවීමක් කරලා නැති නිසා මේ යන්ත්‍රය දැන් මාස 04 ක් තිස්සේ ක්‍රියාත්මක නෑ කියලා. නොවැම්බර් මාසේ තමයි මේ වාර්තාව අන්තිමට ඇවිත් තියෙන්නේ.මේ වන තුරුත් කවුරුවත් මේ පිලිබඳ සොයා බලලා නෑ.මේ සභාව කරගෙන යාමේ තේරුම මොකක්ද සභාපතිතුමා.ලේකම්තුමා දන්නෑ,සභාපතිතුමා දන්නෑ,නිළධාරීන් දන්නෑ මන්ත්‍රීවරුන් දන්නෑ මේ ඇඟිලි සලකුණු යන්ත්‍රය ක්‍රියාත්මක වෙන්නෑ කියලා.මේ හැම දෙයටම යහ පාලනය පටලවා ගන්න එපා.යහ පාලනය ආව නිසා තමයි දැන් මාස 02 ක් තිස්සේ මේ තොරතුරු එන්නේ.ඔබතුමා කීව නිසා මම කියන්නේ.ඔවුන් මොනයම් ක්‍රමයකින් හෝ ආරක්ෂාවෙලා තියෙනවා.මම සියලුම කරුණු පෙන්වන්නම්.සභාපතිතුමණී මේ සේවකයින්ගේ අත්සන, අත්සන් ලේඛනයේ රතු පෑනකින් කපලා දාන්න තියෙන අයිතිය මොකක්ද?මේ සේවකයින්ගෙන් පුද්ගලික වැඩ ගන්න තියෙන අයිතිය මොකක්ද?මේ නගර සභාවට බදු ගෙවන ජනතාවගේ මුදලින් අපි ඔවුන්ට වැටුප් ගෙවන්නේ.මේක මම නොදැක්කනම් මේක වෙන්නේ අත්සන් කරලා පඩි ගන්නවා.මේ සඳහා අවධානය යොමු කරලා නිසි පරීක්ෂණයක් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

<u>**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මේ සම්බන්ධයෙන් දැනට පරීක්ෂණයක් කරලා තියෙනවා.2015 .02.13 වන දින නගර සභා සේවකයින් වන එස්.ටී.බන්දුල සහ ආනන්ද අබේරත්න යන සේවකයින් දෙදෙනා රාජකාරී දිනයේදී පුද්ගලික ස්ථානයක සේවය කරමින් සිටින බව නගර සභා මන්ත්‍රී දේව් රොහාන් මහතා දුරකථනයෙන් දැණුම් දෙන ලදී.තවද ඔවුන් දෙදෙනා එම දිනයේ නිවාඩු දමා ගොස් ඇත්දැයි පරීක්ෂා කරන මෙන් දන්වන ලදී. ඒ අනුව පරීක්ෂා කර බැලීමේදී නිවාඩු ඉල්ලුම් පත් ඉදිරිපත් කර නිවාඩු අනුමත කරගෙන ඇති බව නිරීක්ෂණය විය.ඉන් අනතුරුව නගර සභා මන්ත්‍රී දේව් රොහාන් මහතා විසින් ඔවුන්ගේ ලිඛිත සටහන් ලබා ගන්නා ලෙස ප්‍රකාශ කරන ලදී.ඒ අනුව ලිඛිත ප්‍රකාශ

ලබා ගන්නා ලදී.එම ප්‍රකාශද මේ සමඟ ඉදිරිපත් කරන ලදී.දැන ගැනීම සඳහා ඉදිරිපත් කරමි.නිවාඩු නිසි ලෙස දාලාය කියලා තමයි මට වාර්තා වෙන්නේ.මෙහෙම දෙයක් තියෙනවා.ඔබතුමා දැන් කියපු දේ ගැන ඔබතුමා ප්‍රකාශයක් දෙන්න.ඒ ප්‍රකාශය ගැන නැවත පරීක්ෂණයක් කරන්නම්.දැනට තියෙන තත්වය අනුව ඒ සේවකයින් නිවාඩු අනුමත කරගෙන ගිහින් තියෙන්නේ.ඔබතුමා ඔය දේවල් කියන්නේ දැන්නේ.ඒ අවස්ථාවේ කීවේ නැනේ.ඔබ මට දූරකථනයෙන් කතා කරලා කියපු අවස්ථාවේම මම ඉන්ටර්නල් ඔඩිත් මහත්මියට කතා කරලා කීවා මේ ගැන වහාම පරීක්ෂණයක් කරන්න කියලා.ඒ අවස්ථාවේ ඇත්තටම නිවාඩු ෆෝම් තිබුණා.11 වෙනකොට මේ අත්සන් කපලා තිබුණේ නෑ කියලා ඔබතුමා ප්‍රකාශයක් දෙන්න.ලේකම් මහත්තයා ඒ ගැන පරීක්ෂණයක් කරලා බලන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.පී.දේව් රොහන් ද සිල්වා මහතා කතා කරමින්</u>

ඒ අවස්ථාවේ මේ අත්සන් කපලා තිබුණේ නෑ.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ඒ බව ඔබතුමා දැන්නේ කියන්නේ.හරි නම් ඔබතුමා ඒ අවස්ථාවේම මේ සම්බන්ධයෙන් ප්‍රකාශයක් දෙන්න ඕන.මම මේකේ සටහන් කළා මන්ත්‍රීතුමාගේ පැමිණිල්ල සම්බන්ධයෙන් මන්ත්‍රීතුමා දැණුවත් කරන්න කියලා.මට නැවත සටහනක් දාලා එවලා තිබුණා මන්ත්‍රීතුමා ලිඛිතව පැමිණිල්ලක් කරලා නෑ කියලා වාර්තා කරලා තියෙනවා.මම දුටුම් කියලා සටහනක් දැම්මා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.පී.දේව් රොහන් ද සිල්වා මහතා කතා කරමින්</u>
ඇඟිලි සලකුණු යන්ත්‍රය ගැන මොකද ඔබතුමා කියන්නේ.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ඒ ගැන මම දැණුවත් වෙලා තිබුණේ නෑ.මම සොයලා බලන්නම්.

<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.පී.දේව් රොහන් ද සිල්වා මහතා කතා කරමින්</u>
අදත් මේකේ ඇඟිලි සලකුණ තියනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>

සභාපතිතුමා ,ඇඟිලි සලකුණු යන්ත්‍රය ගැන සරලව බැහැර කරන්න බැහැ.මේ තත්වය පිළිබඳ සභාව දැණුවත් කරන්න කියන්න.අඩුම ගානේ අපිවත් මේ පිළිබඳ දැණුවත් වෙන්න ඕනනේ.

<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.පී.දේව් රොහන් ද සිල්වා මහතා කතා කරමින්</u>

ඒ වගේම ගරු සභාපතිතුමණි, මම දැන ගන්නට කැමතී කර්මාන්ත අංශයේ සේවකයින් සඳහා නගර සභාවෙන් ලබා දෙන පහසුකමක් වශයෙන් මාසයකට එක් සබන් කැටයක් ලබා දෙනවා.සේවකයින් 25 ක් සඳහා සබන් කැට 25 ක් මාසිකව ලබා දෙනවා.මම කියනවා මේ එකම සබන් කැල්ලක්වත් සේවකයින්ට ලබා දීලා නෑ.නමුත් වාර කීපයකදීම ගබඩාවෙන් මේ සබන් කැට ටික අරන් තියෙනවා.මම ගබඩා පාලකගෙන් ඒ තොරතුරු ඉල්ලුවා මේ සභාවට යොමු කරන්න.කොහොමද සභාපතිතුමා මෙහෙම වෙන්නේ.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මම මේ සම්බන්ධයෙන් දැනුවත් නෑ.පරීක්ෂණයක් කරලා කියන්නම්.ලේකම් මහත්තයා මේ පිළිබඳ සොයා බලන්න.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

සභාපතිතුමණි, අපේ නිල කාලයේ අවසාන රැස්වීම වෙන්නත් පුලුවන් මේක.මාර්තු 31 න් මේ දූර කාලය අවසන් වෙන්නත් පුලුවන්.මේ අවුරුදු 04 ක් අපි මේ සභාවේ හිටියා.මේක දැන්ද මේ සභාවට ඔබතුමා කියන්නේ.

සභාවේ දැඩි ඝෝෂාකාරී තත්වයක් ඇති විය.

<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.පී.දේව් රොහන් ද සිල්වා මහතා කතා කරමින්</u>

සාධාරණයක් ඉටු වේවියි කියලා මිනිස්සු හිතුවේ නෑ.යහ පාලනය නිසා තමයි මේ කියන්නේ.කලින් අපට කීවේත් නෑ.

සභාවේ දැඩි සෝෂාකාරී තත්වයක් ඇති විය.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ඇත්තටම පළවෙනි අවස්ථාවේම මේ පිළිබඳ දැණුවත් වුණා නම් අපි සොයලා බලනවා.අපි යම් දෙයක් සේවකයින්ට දීලා තියෙනවනම් ඒක සේවකයින්ට ලැබෙන්න ඕන.එනිසා අපි මේ ගැන සොයලා බලන්නම්.මේ යන්ත්‍රය වැඩ කරන්නෑ කියලා අදාල නිළධාරියා විසින් දැණුවත් කරලා නෑ.ඉතින් කොහොමද මේක හදන්නේ.ගණකාධිකාරතුමා මේ පිළිබඳ සොයලා බලන්න.සතියක් ඇතුලත මේක නිවරදි කරන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.පී.දේව් රොහන් ද සිල්වා මහතා කතා කරමින්</u>

2014.ජූලි මාසේ 23 වෙනිදා අම්බලන්ගොඩ නගර සභාවේ අබලි ද්‍රව්‍ය වෙන්දේසියක් තිබිලා තියෙනවා.මේ සඳහා ඉදිරිපත් කරපු යකඩ කලෝ 427 ක් මිලදී ගෙන තියෙන්නේ එම්.අබ්දුල්,මාගාල්ල,ගාල්ල කියන ලිපිනයේ කෙනෙක්.ඒ පුද්ගලයාගේ නමින් අරන් තියෙන්නේ.නමුත් මේ සඳහා ලියකියවිලි පරීක්ෂා කරන්න සොයලා බැලීමේදී මේ අබලි ද්‍රව්‍ය වෙන්දේසි කිරීම සඳහා සභා තීරණයක් මට සොයාගන්න බැරි වුණා.සභා අනුමැතිය ලැබිලා තියෙනවා පුටු වගයක් සහ අබලි ද්‍රව්‍ය කීපයකට.නමුත් මේ අබලි යකඩ කීලෝ 400 ගාණට සභා අනුමැතිය සමහර විට ලැබිලා ඇති.නමුත් ඔවුන්ට ලැබිලා නෑ කියලා තමයි ඔවුන් කීවේ .

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

කාර්යය සාධන ඇගයීම් වලට එනවා.ඒ එන කොට අපි කීවා මෙතන තියෙන සියලුම අබලි ද්‍රව්‍ය වෙන්දේසි කරන්න කියලා.ඒක මේ සභාවේ සියලුම මන්ත්‍රීවරු අනුමත කළා.දැන් මොකද වෙලා තියෙන්නේ.

<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.පී.දේව් රොහන් ද සිල්වා මහතා කතා කරමින්</u>

මෙතන යකඩ කීලේ 427 ක් තිබිලා තියෙනවා.නමුත් මෙතන යකඩ කීලෝ 1500 ක් විතර තිබිලා තියෙනවා.මම කිරුවේ නෑ.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

නිළධාරීන් කීප දෙනෙක් මේක අධීක්ෂණය කරලා තියෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.පී.දේව් රොහන් ද සිල්වා මහතා කතා කරමින්</u>

ඒක හරි සභාපතිතුමා.නමුත් අපේ නගර සභාවේ නිළධාරීන් කීප දෙනෙක් රු.10000.00 -15000.00 ගණනේ බෙදා ගත්ත ආකාරය මම සියල්ල ඉදිරි සභාවකදී ඉදිරිපත් කරන්නම්.මෙම යකඩ මීට වඩා ප්‍රමාණයක් මෙතන තිබුණා.මේ යකඩ ප්‍රමාණය ල්කෂ 2 ආසන්න මුදලකට විකුණුවා.මෙහි තිබුණා පරණ බොයිලේරුවක්.මේක කීරීමකින් තොරව තමයි අරන් ගිහින් තියෙන්නේ.මේවා කැපුවෙත් අම්බලන්ගොඩ නගර සභාව සතු ගෑස් යන්ත්‍රයෙන්.මේ කියන්නේ සභාව නොමඟ යන ආකාරය.සභාවට එන්න තිබුණු ආදායම ලක්ෂ 02 ක් විතර ද්‍රව්‍ය අපි දෙනවා 10275.00 ක මුදලකට.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

සාමාන්‍යයෙන් ප්‍රසිද්ධ වෙන්දේසියක් කරන කොට නිළධාරීන් 05 දෙනකුට වැඩි ප්‍රමාණයක් එනවා.ඔබ කියන ආකාරයට ලොකු ප්‍රමාණයක එකක් පොඩි ප්‍රමාණයකට දෙන්න බෑ.අනෙක යකඩ මිළදී ගන්න විශාල පිරිසක් එනවා.කොයි කාලයේ එකක්ද ඔබතුමා මේ කියන්නේ.මේ දේවල් කියන්න ඕන ඒ කටයුතු සිදු වෙන අවස්ථාවේමනේ.එතකොට අපට මේ දේවල් සොයා බලන්න පුලුවන්.මේක දැන් කියන කොට කතන්දරයක් කියනවා වගේනේ.

<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.පී.දේව් රොහන් ද සිල්වා මහතා කතා කරමින්</u>

අපි කණගාටු වෙනවා මේ දේවල් දැන ගන්න බැරි වීම සම්බන්ධයෙන්.අපේ සභාවේ සේවය කරන සේවකයෙක් මේ දේවල් අරගෙන තියෙන්නේ.මම කියන්නේ සභාවට ලැබෙන්න තියෙන ආදායම මේ ලක්ෂ 2 ක් විතර අපට නොලැබී ගිහින් තියෙන්නේ.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
ඔබතුමා ඇයි ඒ අවස්ථාවේම අපට මේ දේවල් කීවේ නැත්තේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.පී.දේව් රොහන් ද සිල්වා මහතා කතා කරමින්</u>**
පෙරේදා මම මේක දැනගත්තේ.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
මේක කට කතාවක් වෙන්නත් පුලුවන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.පී.දේව් රොහන් ද සිල්වා මහතා කතා කරමින්</u>**

කට කතාවක් නෙවෙයි සභාපතිතුමා,මේ සල්ලි බෙදා ගැනීමේදී සිදු වූ ගැටලුවක් නිසා තමයි මේක ඇති වේලා තියෙන්නේ.මම ඒ සල්ලි බෙදා ගනිපු හැටි ඔක්කොම ඔබතුමාට කියන්නම් ලබන සභාවේදී.එක් අයකුට මුදල් අඩුවෙන් ලැබිච්ච නිසා තමයි මේ ගැටලුව මතු වුනේ.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
මේ දේවල් කීවට වැඩක් නෑ.සාධකත් ඉදිරිපත් කරන්න ඕන.

සභාවේ ඝෝෂාකාරී තත්වයක් ඇති විය.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.පී.දේව් රොහන් ද සිල්වා මහතා කතා කරමින්</u>**

අල්ලස් එකට යන්න තව කාරණා තියෙනවා.මං ඒවත් කියන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

මේකේ යම් සත්‍යතාවයක් තියෙන්න පුලුවන් සභාපතිතුමණි.මම දන්නෑ මේ කාරණය ගැන.මම දන්න කාරණා අනුව යම් නිවරදී කිරීමක් කරන්න ඕන.ඔබතුමා කීවා යකඩ කීලෝ 1000 ක් පමණ කියලා.එහෙම වුනත් වටිනකම 40000.00 ක් පමණ තමයි වෙන්නේ.රු.40.00 තමයි යකඩ කිලෝ එකක් උපරිම යන මර්කට් එක.ඊට වඩා යන්නෑ.මම දන්න නිසා කියන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.පී.දේව් රොහන් ද සිල්වා මහතා කතා කරමින්</u>**

සභාපතිතුමා මම දැන ගන්න කැමති ,සේවයට බැදීමේදී උප්පැන්න වෙනස් කරලා මේ සභාවෙන් පඩි ගනිපු සේවකයින් කී දෙනෙක් ගැන පරීක්ෂණ කෙරෙමින් පවතිනවද?

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

දැනට එක් සේවකයෙක් සම්බන්ධයෙන් එහෙම කරනවා.එයාගේ සේවය නවතලා තියෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.පී.දේව් රොහන් ද සිල්වා මහතා කතා කරමින්</u>**

තව සේවකයෙක් ගැන මේ වගේ පැමිණිල්ලක් ඇවිත් තියෙනවද?

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

තව සේවකයෙක්ට පැමිණිල්ලක් ඇවිත් තියෙනවා.අපි සනාථ කරගෙන තියෙනවා එයා නිවරදී කියලා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.පී.දේව් රොහන් ද සිල්වා මහතා කතා කරමින්</u>**

සභාව නොමඟ යවලා නැද්ද?මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් කළාද?

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපට පුලුවන් ඕනෑම කෙනෙක්ගේ උප්පැන්නත් දුන්නම අදාල ආයතනයට යවන්න මේක සසදලා හරිද කියලා බලලා එවන්න කියලා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.පී.දේව් රොහන් ද සිල්වා මහතා කතා කරමින්</u>**

එතකොට සේවයට බඳවා ගැනීමේදී අපට ලබා දීලා තියෙන ලේඛණ ව්‍යාජ ඒවා කියලා ඔප්පු වුණොත් මොකද කරන්නේ.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ආයතන සංග්‍රහය අනුව කටයුතු කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.පී.දේව් රොහන් ද සිල්වා මහතා කතා කරමින්</u>**

අපි මේ සම්බන්ධයෙන් කටයුතු කරන්න ඕන සභාව හරහාද?

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒ සම්බන්දයෙන් ගැටලුවක් කරගන්න එපා.නීතිය ක්‍රියාත්මක වෙනවා.

සභාවේ දැඩි සෝෂාකාරී තත්වයක් ඇති විය.

**<u>ගරු නගර සභා මන්ත්‍රී බී.ජනිත් වික්‍රමතිලක මහතා කතා කරමින්</u>**

මේ සම්බන්ධයෙන් කතා කරන කොට අපේ හිටපු උප සභාපතිතුමා ,එතුමා එක්සත් ජාතික පක්ෂයේ ඉදෙද්දී ඔය කියපු වරදම කරලා එතුමා පරීක්ෂණයක් කලා.දැන් එතුමා නැතෙයි කියාවිද දන්නෙත් නෑ.එතුමා තමයි මේ පරීක්ෂනය කළේ.මෙතන අත්සන් කරලා ඒ පුද්ගලයාගේ ගෙදර සේවය කරන්න ගිහිල්ලා.මෙතුමා යන කොට ඔක්කොම පැනලා ගිහිල්ලා.ඕක අද ඊයේ ඇති වෙච්ච දෙයක් නෙවෙයි.කාලාන්තරයක් තිස්සේ ආපු දෙයක්.එනිසා අපි ඒවට අනුබල නොදී මෙතුමා කීව කරුණු පිළිබඳ සොයා බලන්න ඕන.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මන්ත්‍රීතුමා ,මෙතුමා පැමිණිල්ලක් නොකර දුරකථනයෙන් දීපු දැණුම් දීමට අපි පරීක්ෂණයක් කළා.මේ කියන සමහර කාරණා සම්බන්ධයෙන් එතුමා කට උත්තරයක් දීලා තිබුණනම් පරීක්ෂණයක් කරන්න තිබුණා.දැන් ඒවා අලුත් කරුණු.අපි ඒවා දන්නෑ.අපේ යුතුකම අපි කරලා තියෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී බී.ජනිත් වික්‍රමතිලක මහතා කතා කරමින්</u>**

මම මේ ගැන වැඩිය කතා කරන්න යන්නෑ.අපේ හිටපු උප සභාපති සරත් ශ්‍රී ලාල් මහතා මේ පිළිබඳ පරීක්ෂණයක් කලා.අද එතුමා නිහඬව ඉන්නවා මං දන්නෑ ඇයි කියන්න.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපට ඇත්තටම අවුරුදු 4 ක් විපක්ෂයක් තිබ්බේ නෑ ඇත්තටම අද තමයි විපක්ෂයක් තියෙන්නේ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

අවුරුදු 4 ක් නියෝජනය කරලා දැන් තමයි කියන්න එන්නේ.මේ ස්ථානයේ මීට කලින් මම ගිහින් වැටලීමක් කළා කුණු අදින ප්‍රශ්නයේදි.රු.500.00 ක් බැදලා කරන එකේදී ,සල්ලි බැන්දේ වෙන ගෙදරක් ,වෙන ගෙදරකින් සල්ලි අරගෙන කුණු ටික ඇද්ද අය හිටියා මේ සභාවේ.මම කියන්නේ කවුරු කලත් වැරැද්ද වැරැද්දමයි.අපි නෑ කියන්නෑ.තමන් කියන කාරණය හරියාකාරව සාධාරණීකරනය කරලා කියන්න පුලුවන් නම් තමයි මම හිතන්නේ

වටින්නේ.අද යහ පාලනය මඟින් මෙතුමන්ලා මාධ්‍ය සංදර්ශනයකට යන දෙයක් අපි දැක්කේ.ඔබතුමා මට ඒ වේලාවේ කතා කලා.මම ලේකම් මහත්තයට කතා කරලා ඒ වේලාවේම කීවා මේ ගැන සොයා බලන්න කියලා.ඔබතුමා සභාපතිතුමාටත් කීවනේ.ඒ වේලාවේ මට කීවේ නෑ අත්සන් 02 ක පොතේ කපලය තියෙන්නේ කියලා.මම ඔබතුමාට ආයෙම ගත්තා ඒ වේලාවේ.මම කීවා ඔබතුමාට ලේකම් මහත්තයා සහ අදාළ නිළධාරීන් හමු වේලා අවශ්‍ය දේවල් කරන්න කියලා.පරීක්ෂණයක් කරන්න කියලා ඔබතුමා කීවනම් පරීක්ෂණයක් කරන්න තිබුණා.ගරු සභාපතිතුමණි, මෙතුමා ප්‍රකාශයක් නොකර සභාවේ මේ වගේ කියන්නේ මාධ්‍ය සංදර්ශනයක් කරන්න තමයි.ඔබතුමාට තිබුණා නීති්‍යානුකූලව කරන්න ඕන කටයුත්ත කරන්න.

සභාවේ දැඩි සෝෂාකාරී තත්වයක් ඇති විය.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ඔබතුමා ඒ වේලාවේ ගන්න ඕන ක්‍රියා මාර්ගය නොගෙන දැන් ඔය දේවල් කීවට වැඩක් නැනේ.

සභාවේ දැඩි සෝෂාකාරී තත්වයක් ඇති විය.

**<u>ගරු නගර සභා මන්ත්‍රී බී.ජනිත් වික්‍රමතිලක මහතා කතා කරමින්</u>**

මෙතුමා මේ කරන්නේ මාධ්‍ය සංදර්ශනයක් නෙවෙයි.සබන් කැට හැමදාම ගන්නවනම් එක සේවකයෙකුටවත් දීලා නෑ කියලා කියනවා නම්, මේවා ගැන සොයලා බලන්න.මේක සභාවට අපකීර්තියක්.ඒකයි අපි කියන්නේ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ඒක තමයි මම කියන්න හැදුවේ සභාපතිතුමා,මෙතුමා කියපු චෝදනා පිළිබඳ ඉතා ඉක්මණින් සොයා බලලා මේ මාසේ ඇතුලතම මොනම නිළධාරියෙක් වුණත් ක්‍රියා මාර්ගයක් ගනීවිය කියලා මම බලාපොරොත්තු වෙනවා සභාපතිතුමණි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්.එල්.අනුර කිත්සිරි මහතා කතා කරමින්</u>**

මෙතුමා සභාව දැණුවත් කරායින් පසුව සභාව පැත්තෙන් කරන්න ඕන දේවල් දැනට කරගෙන යනව ඇති කියලා මම විශ්වාස කරනවා.මාස කීපයක් පසු වෙලා හරි මෙතුමා දැනගත් පමණින් මෙතුමාගේ යුතුකම ඉටුකරලා තියෙනවා.පරිපාලන වශයෙන් ඒ නිළධාරීන් ගත යුතු ක්‍රියා මාර්ග ගන්නවා ඇති කියලා මම හිතනවා.ඒ වගේම ගරු සභාපතිතුමණී, ඒ වගේ අඩු පාඩු වරදි සිදු වෙලා තියෙනවනම් ඒ සම්බන්ධයෙනුත් කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.මෙහිදී සේවකයින් පැත්තෙනුත් දෙයක් කියන්න තියෙනවා සභාපතිතුමණී.තමන්ගේ අයිතීන් වෙනුවෙන් වෘත්තීය සමිති තියෙනවා මේ සභාව තුළ.මං විශ්වාස කරන විදියට වෘත්තීය සමිති 02 ක් පමණ මේ අම්බලන්ගොඩ නගර සභාව තුළ තියෙනවා.සේවකයින් තමන්ගේ අයිතීන් පිළිබඳ වැඩ පරිපාලකලා හරහා වෘත්තීය සමිති මඟින් ඉල්ලීම් කරන්න ඕන.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

කිසිම රැස්වීමක මෙහෙම දෙයක් වෙලා තියෙනවා කියලා චෝදනාවක් එල්ල වෙලා නෑ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්.එල්.අනුර කිත්සිරි මහතා කතා කරමින්</u>**

සබන් සම්බන්ධ සිද්ධිය නම් ඇත්තටම ලැජ්ජ සහගත දෙයක් සභාපතිතුමණි.සේවකයින්ට ලැබෙන්න ඕන දේවල් සහ ප්‍රසාද අදාල සේවකයින්ට ලැබෙන් නැත්නම් මම හිතනවා අම්බලන්ගොඩ පළාත් පාලන ආයතනය තුළ එකමුතු වෘත්තීය සමිතියක් ඇති ,ඔවුන් අපිව දැණුවත් නොකළේ අපි සම්බන්ධයෙන් විශ්වාසයක් නැති නිසාද කියලත් ගැටලුවක් මතු වෙනවා සභාපතිතුමණී.ඒ අනුව බලන කොට මේ සම්බන්ධයෙන් ඔවුන් කටයුතු නොකිරීම තුළ ඔවුන් මේ වංචා සහගත පුද්ගලයින්ට අනුබල දීමක් කරලා තියෙන්නේ.සේවකයින්ටත් මේ සම්බන්ධයෙන් වගකීමක් තියෙනවා.එතනින් එහාට ගියහම මේ කාලය තුළදී මේ අඩු පාඩුකම් කියන්න ඉදිරිපත් කිරීම පිළිබඳව මම විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට කණගාටුව ප්‍රකාශ කරනවා.මේ කාල සීමාව තුලදී විතරක් නෙවෙයි,අවුරුදු 15 විතර කලින් කාලානුරූපීව ඒ කාලයේ සිදුවෙච්ච අකටයුතුකම් වලට ඔබතුමාලා ක්‍රියාත්මක

වේලා තියෙනවා. අපි අපේ යුතුකමක් විදියට ආණ්ඩු පක්ෂයේ ඉන්න මන්ත්‍රීවරුවේවා විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරු වේවා අපේ පැත්තෙන් ජනතාව දැණුවත් වෙන්න ඕන දේවල් සිදුකරලා තියෙනවා කියලා කියන්න පුලුවන්.පාලක පකෂයේ මන්ත්‍රීවරු විදියට අපි විශ්වාස කරනවා සමහර විට ඔබතුමන්ලාටත් එහා ගිහින් ......තමුන්නාන්සේලා හිනාවේලා තියෙනවා විහිලුවට හරි පාලක පක්ෂයෙන් කරන්න ඕන දේවල් අපි කරනවා කියලා.නමුත් අපි විපක්ෂයක් විදියට ඔබතුමාලා අතින් සිදු විය යුතු යුතුකම් අපේ ගරු සභාපතිතුමා ඉදිරියේ ප්‍රශ්නකාරී විදියට විමසලා සාධාරණය ඉෂ්ඨ කරලා තියෙනවා.ප්‍රදේශවාසින් වෙනුවෙන් මේ සභාව තුළ විවෘත භාවය තිබිලා තියෙනවා.මීට හොදම උදාහරණය,තමුන්නාන්සේ ප්‍රමුඛ ආණ්ඩුපක්ෂයේ අපි අම්බලන්ගොඩ තානායම සම්බන්ධයෙන් සියලුම කරුණු කාරණා මේ සමාජයට කියලා යන්න පුලුවන් උපරිමයට ගිහිල්ලා ඒ කාර්යය භාරය විවෘතභාවය ඇතිව අපි කළා.පේපර් කටර් පොත බලද්දි තමයි දැක්කේ ඔබතුමාලා තනායම කැඩීම සම්බන්ධ අල්ලස් හා දූෂණ සභාවට පැමිණිල්ලක් යොමුකරලා තියෙනවා කියලා.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අධිකරණයට යන්න කියලා අපි ආණ්ඩුපක්ෂය විදියට විපක්ෂයට කීවා,සාධාරණය ඉටු කරන්න කියලා ජනතාව වෙනුවෙන්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්.එල්.අනුර කිත්සිරි මහතා කතා කරමින්</u>**

සහෝදර මාධ්‍යවේදීන් සහ නිළධාරීන් මේ ස්ථානයෙන් එළියට යොමු කරවලා අපි අපේ ස්වාධීනත්වය ,රහස්‍යභාවය සහ ආරක්ෂාව රැකගනිමින් ඔබතුමන්ලා අපි මේ සම්බන්ධයෙන් දීර්ඝව සාකච්ඡා කළා.දැන් ඒ කාරණය විවෘතව සමාජයට ගිහිල්ලා තියෙනවා.නමුත් ඔබතුමන්ලා වර්ෂ ගාණක් පසුබට වෙලා හෝ ඒ සම්බන්ධයෙන් උනන්දු වීම සම්බන්ධයෙන් අපි සතුටුවෙනවා සහ ස්තූතිවන්ත වෙනවා.එහිදී ගරු සභාපතිතුමණි, අපිට කණගාටුවට කරුණකුත් තියෙනවා.එහිදී චෝදනාවට ලක්වූ පුද්ගලයින් සහ අවශේෂ පුද්ගලයින් සමස්ථ අම්බලන්ගොඩ නගර සභාව තුළ සහ නාගරික ප්‍රදේශය තුළ සහ සමස්ථ රට තුළම චෝදනාවට ලක් වෙච්ච දැවැන්ත තෝරු මෝරු තමුන්නාන්සේලාගේ වේදිකා වල සංදර්ශන වල කැබිනට් ප්‍රකාශක තත්වයට දක්වා ඉහළ නංවලා තියෙනවා.ඒ සම්බන්ධයෙනුත් අපේ කණගාටුව ප්‍රකාශ කරනවා.කෙසේ නමුත් තමුන්නාන්සේලාගේ උත්සාහයට අපි ස්තූතිවන්ත වෙනවා සභාපතිතුමණි වර්තමාන රජයේ විපක්ෂය ලෙස.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්.ජයන්ත මහතා කතා කරමින්</u>**

ඒ සම්බන්ධයෙන් මම දෙයක් කියන්න ඕන.තනායම කැඩීම සම්බන්දයෙන් අපි නිකන් හිටියේ නෑ.අපි අතිගරු ජනාධිපතිතුමාට ඉදිරිපත් කළා.මංගාව තියෙනවා රෙජිස්ටර් කරපු කොළ හිටන්.ඊළඟට ආණ්ඩුකාරතුමියට ලීවා.මහ ඇමතිතුමාට ලීවා.පළාත් පාලන කොමසාරිස්තුමියට ලීවා.පොලීසියට ගියා ඇල්පිටියේ.පොලිස් අධිකාරීතුමාට ලීවා.ඊට අමතරව පාර්ලිමේන්තුවේ පෙත්සම්කාරක සභාවට ගියා.දකුණු පළාත් සභාවෙන් මං ප්‍රශ්න කෙරෙව්වා.ඒවට මට උත්තරත් ලැබිලා තියෙනවා.අල්ලස් හා දූෂණ එකට මම ලියලා තිබුණේ.නමුත් උත්තරයක් ආවේ නෑ.ජනාධිපතිතුමා හෝරාගේ අම්මගෙන් ජේන අහනවා වගේ මේක පළාත් පාලන කොමසාරිස්ට යවලා තියෙනවා.ඒ ලිපියේ පිටපතක් මට ආවා.ආණ්ඩුකාරතුමියගෙන් ලිපියක් ආවා කියලවත් ආවේ නෑ.ඒතරම්ම තත්වයට මේක වැටිලා තිබුණේ.තමුන්නාන්සේලාට මම කියන්න කැමතී මම නිකං හිටියේ නෑ.අපි මේකට මුකුත් කරලා නෑ කියලා කීවාම ,මම කීප දෙනෙක්ට ගෙදරට එන්න කියලා පෙන්නුවා.ඒපාර එයාලා කීවා ඔයාලා විපක්ෂයක් විදියට දෙයක් කරලා තියෙනවා කියලා.අපි නඩුවට යන්න ගියා.ඒකට ලක්ෂ ගාණක් ඕන.අපට සල්ලි දෙන්න කවුරුත් හිටියේ නෑ.ජී.එම්.එස්.සිලිවා මහත්තයා භාගයක් දෙන්න හිටියා.නමුත් අනෙක් අය එකතු කරන කොට දුන්නෑ.ඒකයි අපි උසාවියට නොගියේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්.එල්.අනුර කිත්සිරි මහතා කතා කරමින්</u>**

ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලයේ ජේන ඇහුවේ හෝරාගේ අම්මගෙන් නම් දැන් අහන්නේ හොරාගෙන්මයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්.ජයන්ත මහතා කතා කරමින්</u>**

ජනාධිපතිතුමා යොමු කළා පළාත් පාලන කොමසාරිස්ටතුමාට.ඒකයි මම කීවේ එතුමා හොරාගෙන්මයි මේක ඇහුවේ.එයාගේ රිපෝට් එක අපි ළඟ තියෙනවනේ.අපි පුද්ගලයෝ ආරක්ෂා කරන්නෑ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

ගරු දේවි මන්ත්‍රීතුමා විසින් මේ සභාවට යොමු කරන ලද තොරතුරු සම්බන්ධයෙන් අපි යම් ආකාරයට ස්තූතියක් පුද කළ යුතු වෙනවා.මොකද මේ සභාව යම් ආකාරයකට අපහසුතාවයකට ලක්වෙනවනම් අකටයුත්තකට ලක්

වෙනවනම් එය පෙන්වා දීම මන්ත්‍රීවරයෙක්ගේ යුතුකමක් වගකීමක්.ඒක විපක්ෂයේ වේවා ආණ්ඩුපක්ෂයේ හෝ වේවා මන්ත්‍රීවරු සියල්ලන්ගේම යුතුකමක් විදියට තමයි මම දකින්නේ.අපේ සුළු සේවකයින් කරන සුළු සුළු අකටයුතුකම් වලදී වගකිව යුතු නිළධාරීන්ට තමයි ඒකේ වගකීම එන්නේ.අපි වගේම ඒ ඉහළ නිළධාරීනුත් මේ දේවල් සම්බන්දයෙන් නොදැනුවත්ව ඉන්න පුලුවන්.නමුත් බරපතලම චෝදනාව එල්ල වෙන්නේ අවසානයේ වගකීම් දරණ ඉහළ නිළධාරීන්ට.ලේකම්තුමාගේ සිට තාක්ෂණ සේවා නිළධාරීන් දක්වා මේ චෝදනාව එල්ල වෙනවා.සමහර වේලාවට ඔවුනුත් අපි මන්ත්‍රීවරු වගේ යම් අවධානයකින් නොසිටියා වෙන්නත් පුලුවන්.නමුත් මේ ඉදිරිපත් කළ කාරණා අනුව යම් යම් කාරණා සුළුවෙන් හෝ සිදු වෙන්න ඇති කියලා මම හිතනවා.එනිසා මේ අකටයුතුකම් සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරලා සාධාරණ තීරණයක් ගන්න එක තමයි අපේ යුතුකම වෙන්නේ සභාපතිතුමණි.ඒ අනුව මේ කටයුත් සම්බන්ධයෙන් ඉදිරියේදී අදාල නිළධාරීන් මීට වඩා වගකීමෙන් කටයුතු කරයි කියන ඉල්ලීම කරනවා.මොකද ඔබ කෙරේ තමයි අපි විශ්වාසය තබලා තියෙන්නේ.මේ පැය 08 සේවකයින් නගර සභාව තුළ කටයුතු කරන්නේ කෙසේද කියන එක හොයලා බලන්න මන්ත්‍රීවරුන්ට හැකියාවක් නෑ.මන්ත්‍රීවරු කියන්නේ මහජන නියෝජිතයෝ.නගර සභාව තුළම රැදෙන අය නෙවෙයි.මන්ත්‍රීවරයෙක් විදියට මම විශ්වාස කරන්නේ අපි ලේකම්තුමාගෙන් තාක්ෂණ සේවා නිළධාරීන්ගෙන් යම් නිළධාරීයෙක්ගෙන් යම් දෙයක් අහන්නේ අපට ඔවුන් විශ්වාස නිසා.ඉතින් ඒක අපි පිළිගන්නවා.ඒකයි වටිනාකම.එනිසා මේ නිළධාරීන්ට මේ සම්බන්ධයෙන් මීට වඩා සැලකිලිමත්ව කටයුත් කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ලේකම් මහත්මයා මේ සියලුම චෝදනා සම්බන්ධයෙන් ප්‍රතමයෙන්ම අදාල චෝදනා ඉදිරිපත් කළ මන්ත්‍රීවරයගෙන් ප්‍රකාශයක් ලබා ගන්න.අරගෙන පරීක්ෂණය ආරම්භ කරන්න.මොකද විටින් විට ප්‍රකාශ වෙනස් කරන ස්භාවයක් මට පෙනී යන නිසා.එදා කීවා අත්සන් කරලා කපලා තිබුණා කියලා.අද කියනවා කපලා තිබුණේ නෑ කියලා.එනිසා මුලින්ම දේව් මන්ත්‍රීතුමාගෙන් මේ සම්බන්ධයෙන් ප්‍රකාශයක් ගන්න.මේ සම්බන්ධයෙන් හොයලා බලලා කටයුතු කිරීම සම්බන්දයෙන් මමත් සතුටට පත්වෙනවා.මේ තත්වය තමුන්නාන්සේලාගෙන් බලාපොරොත්තු වුණේ 2011 අප්‍රේල් මාසේ ඉදලා.නමුත් ඒ සේවය 2015 මාර්තු මාසේ අවසානයේ හරි පණගැන්වීම සම්බන්ධයෙන් මම සතුටුවෙනවා.විපක්ෂය ඇත්ත වශයෙන්ම අවුරුදු 03 මාස 11 නිදාගෙන හිටියේ ඇත්තටම.තානායම සම්බන්දයෙන් අපේ මතයක් තිබ්බා.අපට පාලක පක්ෂය වශයෙන් ඒක එළි දැක්වීමේ නොහැකියාවක් තිබ්බා.අපි ඉල්ලා සිටියා කරුණාකරලා තමුන්නාන්සේලා ගිහිල්ලා මේකට නඩු දාන්න කියලා අම්බලන්ගොඩ ජනතාව වෙනුවෙන්.ඒත් විපක්ෂය ඒක කළේ නෑ.අද අල්ලස් එකට ගිහින් තියෙනවා.අපි සතුටු වෙනවා අවුරුදු 04 ට පස්සේ හරි මේ දේ කිරීම සම්බන්ධයෙන්.මැතිවරණයකට යාමේදී කරණ කරුණු රැස්කිරීමක් විදියට තමයි මම මේක දකින්නේ.තමුන්නාන්සේලාගෙන් ජනතාව බලාපොරොත්තු වන්නේ මීට වඩා ප්‍රශස්ත සේවාවක්.ඒකයි අපි පාලක පක්ෂය විපක්ෂය නැතිව සියලු දෙනාම සහිකයින් විදියට සලකන්නේ.එනිසා පාර හදන්න,බෝක්කුව හදන්න,ඩෙංගු උවදුර වලකන්න සියලු දෙනාට වගකීම තියෙනවා.මේ කිසිම චෝදනාවක් මේ ඉන්න සභාපතිවරයා හෝ මන්ත්‍රීවරුන් කිසිවකු සම්බන්ධ චෝදනා නෙවෙයි.අපි මේ සම්බන්දයෙනුත් විමර්ශන කරලා සාධාරණ තීන්දුවක් ගන්නවා.සාමාන්‍ය පරිපාලනය සම්බන්දයෙන් තියෙන මේ චෝදනා සම්බන්ධයෙන් ලේකම් මහත්තයා ප්‍රථමයෙන්ම චෝදනා කරපු කෙනාගෙන් ප්‍රකාශයක් අරගෙන කටයුතු කරන්න.ඒ සම්බන්ධයෙන් ඉදිරියේදී සභාව දැණුවත් කරන්න.ඒ වගේම ගන්න ඕන පියවර තියෙනවනම් ඒ සම්බන්ධයෙනුත් කටයුතු කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ආර්.පී.දේව් රොහන් ද සිල්වා මහතා කතා කරමින්**

පොඩි නිවරදි කිරීමක් කරන්න අවශ්‍යයි.මම ඔබතුමාට මේ සම්බන්ධයෙන් දැණුම් දුන්නේ හවස 04 ට.ඒ අවස්ථාවේ මේ පොත කපලා කියලා තිබුණේ නෑ.

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මන්ත්‍රීතුමා මට ඉදිරිපත් වන කරුණු මත තමයි මම තීරණයක් ගන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී ආර්.පී.දේව් රොහන් ද සිල්වා මහතා කතා කරමින්**

මම පොත ගන්න කියලා මිස්ට කීවම.මිස් ඒක කියලා තියෙන්නේ ඇල්ටන් මහත්තයට.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්.ජයන්ත මහතා කතා කරමින්**

තමුන්නාන්සේට තව දෙයක් කියන්න ඕන.තානායම කැඩීම සම්බන්ධයෙන් අපි නෙවෙයි ,මේ කඩන වේලාවේම තමුන්නාන්සේට මේක නවතන්න තිබුණා පොලීසියට ගිහිල්ලා.

සභාවේ දැඩි සෝෂාකාරී තත්වයක් ඇති විය.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි පොලීසියට ගිහිල්ලා පැමිණිලි කළා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්.ජයන්ත මහතා කතා කරමින්</u>**

තමුන්නාන්සේ සභාපතිවරයා විදියට සභාවේ දේපල ආරක්ෂා කරන්න ඕන. අපි නෙවෙයි.තමුන්නාන්සේ දැණුවත්වයි මේක කැඩුවේ.මම හය නැතිව කියනවා ඒක.

සභාවේ දැඩි සෝෂාකාරී තත්වයක් ඇති විය.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

තානායමට අය විය යුතු බදු එක්කෝටි දස ලක්ෂයක් අය කරගන්නැතිව මේක කරන් ගියේ කවුද?

සභාවේ දැඩි සෝෂාකාරී තත්වයක් ඇති විය.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්.ජයන්ත මහතා කතා කරමින්</u>**

නිවාසයක් කැඩීම සම්බන්ධයෙන් පැමිණිල්ලක් තියෙනවා.මේක මම යොමු කරනවා.පෝරඹ මහත්මයෙක් යොමු කරලා තියෙන්නේ.මේක නිවාස කමිටුවට යොමු කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමණී,කෙරම්ණිය බෝවත්ත පාරේ වගුරු බිමක් ගොඩ කිරීම සම්බන්ධ ඉල්ලීමක් තියෙනවා.ඔබතුමා හොදාකාරවම දන්නවා කෙරම්ණිය දූව වත්ත පාරේ වෙල් කොටසක් ඉතාම අමාරුවෙන් ගොඩ කිරීමට අවසරය ලබා ගෙන තියෙනවා පොල්වත්තෙ පදිංචි පුද්ගලයෙක්.ඔහු නගර සභාව,නාගරික සංවර්ධන අධිකාරියේ නීති රීති රෙගුලාසි අනුව ගොඩ කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතිනවා මේ දවස් වල.ඒ අනුව පසුගිය දා නාගරික සංවර්ධන අධිකාරියේ නිළධාරිණිය,තාක්ෂණ සේවා නිළධාරිණිය සහ මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා පරීක්ෂණය කර පැමිණ දැනට ඔහු ජලය බසින දිශාවට විශාල කාණුවක් යොදලා පොල්කඳ කියන ඇළට ........

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මන්ත්‍රීතුමා එයා කාණුව කපලා තියෙන්නේ අල්ලපු වත්තකින්නේ.එයාගෙම ඉඩමෙන් ඕන ඒක කපා ගන්න.අපි අවසර දීලා තියෙන්නේ එහෙම.එයාගේ ඉඩමේ මැද්දේ තමයි අපේ බෝක්කුව තියෙන්නේ.ඒ බෝක්කුවෙන් බහිනවනම් ඉඩම මැද්දෙන් තමයි දාන්න ඕන.ඒක වෙනස් කරනවනම් එයාගේ ඉඩම අයිනෙන් ඕන දාන්න.මම ගිහින් බැලුවා.එයා දාලා තියෙන්නේ වෙන මනුස්සයකුගේ ඉඩමෙන්.ඒ මනුස්සයා ලිවුමක් දීලා තියෙනවා මගේ ඉඩමෙන් කාණුවක් කපලා කියලා.ඒක වැරදී.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>**

ඔහු කාණුව යොදලා තියෙන්නේ අඩි 15 ක් පළල පාරක් අයිනෙන්.පාර අයිනෙන් දැම්මට මම හිතන්නේ ජලය බසින්නේ එම දිහාවට.

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අපි ගත්ත තීන්දුව අනුව එයාගේ ඉඩම අයිනෙන් කාණුව හදන්න ඕන.

**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්**

පසුව නිළධාරීන් ඔහුට කියලා තියෙනවා වෙනත් තැනක්.ජලය නොබසින උඩු ගම් බලා ජලය වෙලට යන ආකාරයක් තමයි පෙන්නලා තියෙන්නේ.

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

කමිටුවෙන් ගත්ත තීරණයක් වෙනස් කරන්න බෑ තනිවම.කමිටුවෙන්ම ඕන වෙනස් කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්**

දෙවනුව දීපු තීරණය අනුව දැන් කාණුව වහලා දූව වත්ත ප්‍රදේශය එකම ජල තටාකයක් වෙලා.

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

එයාටත් කිසියම් පරිත්‍යාගයක් කරන්න වෙනවා.දැන් එයා හදන්නේ වෙන ඉඩමකින් හරි පාරකින් හරි කාණුව දාන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්**

මේක නිවරදි කරන්න කියලා අදම නිළධාරීන් යොමු කරනවනම් හොදයි.

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

නිළධාරීන් යොමු කරලා තියෙන්නේ.එයා නිසි පරිදී නොකළොත් අපට අනුමත කරන්න බැරි වෙනවා කිසිම දෙයක්.

**ගරු නගර සභා මන්ත්‍රී එච්.එල්.අනුර කිත්සිරි මහතා කතා කරමින්**

වරිපනම් අංක නිකුත් කිරීම සම්බන්ධව ක්‍රියාත්මක වෙනවද.වෙළඳ බලපත්‍ර ලබා දීම සහ සභාවට ආදායමක් ලබා ගැනීම සම්බන්ධයෙන් ජනතාව විමසනවා ........

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

වරිපනම් අංකයක් නිකුත් කිරීමට අපට අයිතිය තියෙන්නේ ඒ.ටී.පෝම් එකක් දාලා නම් වෙනස් කර ගැනීම පමණයි.අලුතෙන් වරිපනම් අංක ලැබෙනවා ජේනරල් තක්සේරු කිරීමකදී.අපි ඉල්ලීමක් කරලා තියෙන්නේ.ඒත් තවම නෑ එයාලා ආවේ.

**ගරු නගර සභා මන්ත්‍රී එච්.එල්.අනුර කිත්සිරි මහතා කතා කරමින්**

දැනට වෙළඳ ව්‍යාපාර අලුතෙන් ආරම්භ කරලා තියෙනවා.

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඒවට බලපත්‍ර දෙනවා එතකොට අපට ආදායමක් එනවනේ.අලුත් ව්‍යාපාර තියෙනවා.ඒවත් බලලා වෙනමම තක්සේරු නිකුත් කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රී එච්.එල්.අනුර කිත්සිරි මහතා කතා කරමින්**

ඊට අමතරව සභාපතිතුමණි,සභා වාර්තාව ඊමේල් මඟින් ලබා දෙනවද,විඩියෝ එකත් ලබා දෙනවද?හඩ පටිය දෙනවද?

**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

වාර්තාව විතරයි.හඩ පටිය ඊමේල් කරන්න ධාරිතාවය මදියි.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එච්.එල්.අනුර කිත්සිරි මහතා කතා කරමින්**</u>

ස්ටැන්ඩ් එක ඉදිරිපිට වන්දි ගෙවීම් සම්බන්දයෙන් තත්වය .....

<u>**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

අපි කොටසක් යැවුවා.තව කොටසක් යවන්න තියෙනවා.මුදල් ලැබීම් මත අපි යවනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එච්.එල්.අනුර කිත්සිරි මහතා කතා කරමින්**</u>

කන්ද මාවතේ තාප්පයක් ඉදිකිරීම සම්බන්දයෙන් පෙරසැරි ගාස්තු ගෙවීම් සම්බන්ධ රොෂාන් ප්‍රදීප් කියලා කෙනෙක්.....

<u>**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>
මොකක්ද වෙලා තියෙන්නේ.අපි බලලා කියන්නම්.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමණී,නොදැනීම වසර 04 ක් ගෙවීලා අපේ දූරකාලයට.අපි යෝජනා කරනවා අපට අමිල සිහිවටනයක් ලෙස අපගේ නිවෙස් වල තබන්නට හැකි වන පරිදී සියලූම මන්ත්‍රීවරුන්ගේ ,ඔබතුමාගේ ලේකම් තුමාගේ ජායා රූපයක් ගන්න අවස්ථාව සලසා දෙන්න කියලා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා කතා කරමින්**</u>

මන්ත්‍රීවරුන් විදියට අපි මළගෙවල් සහ උත්සව සඳහා කොඩි කණු හා පුටු ලබා දීමට නිදහස් ප්‍රමාණයක් තියෙනවද?ඒ වගේම අලුතින් ලැබිලා තියෙන වතුර බවුසරය බඳු දීමේ ක්‍රමවේදයක් තියෙනවද?තල්ගස්ගොඩ ප්‍රදේශයේ ෂාන් පුරයේ ඇතුලෙම ගෙයක් හදනවා.ඒහෙට වතුර ලයින් එකත් නෑ.වතුර බවුසරයකින් හරි කොන්ක්‍රීට් ටික අනාගන්නයි හදන්නේ.

<u>**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>
පුටු 100 ක් ගන්න පුලුවන් .වතුර බවුසරය අපි හදලා දෙන්නම්.

☞ ප.ව.12.28 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදී.

භාරත සමරසේකර,

ලේකම්,
අම්බලන්ගොඩ නගර සභාව

අරුණ ප්‍රදීප් මණිමෙල් වඩු

සභාපති,
අම්බලන්ගොඩ නගර සභාව

**2015 -03 - 16** වන දින

අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේදී